# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,486 – 1965 අගෝස්තු 20 වැනි සිකුරාද – 1965.8.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1071 | තොවුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 1121 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1086 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1097 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කල ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 1119 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1124 |
| බඩුබාහිරාදිය විකිණීම ... ... ... | 1120 | විවිධ දැන්වීම් ... ... ... | 1124 |



## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, යථා යෝග්‍ය පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුලව පත් කරනු ලබන නව ප්‍රවේශකයන්ගේ ආධුනික/පරීක්ෂා කාලය අවුරුදු තුනක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන් ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථා වලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද අනුකූලව නව ප්‍රවේශකයන් ක්‍රියා කළ යුතුය.

### විශෙෂ නිවේදනයයි

1965 සැප්තැම්බර් 10 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 සැප්තැම්බර් 9 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1965 සැප්තැම්බර් 4 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 අගෝස්තු 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

6. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ලම ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවසථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නොලැබේ.).

(බී) උප.ධි සහතික පත්‍ර හෝ උසස්ම අධ්‍යාපනික සහතික පත්‍ර.

(සී) මේ තනතුරට පත් කිරීමට යෝග්‍ය බවටත්, චරිතය සම්බන්ධවත්, අධ්‍ය පනික සුදුසුකම් පිළිබඳවත් ලඟදී ලබා ගන්නා ලද සහතික තුනක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම් කරුවන් මෙහි සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

සංලක්‍ෂ්‍යය :

(i) අයදුම්පතට ලියවිලි හෝ ලියවිලි පිටපත් නොඇමිණිය යුතුයි.

(ii) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්‍ෂකයන්ගේ අයදුම් පත්‍ර සලකා බලනු නොලැබේ.

7. තෝරාගනු ලැබූ අපේක්‍ෂකයා පළමුවෙන්ම මහරගම රජයේ ගුරු විද්‍යාලයට අයත්ව සේවය කරන නමුත් මාරුකර යැවීමට ඉඩ ඇත.

8. අයදුම් පත්‍ර හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට පෞද්ගලිකව නො එවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිද බලනු මැනවි.

10. අයදුම් පත්‍ර සියල්ලම ලැබුණ බව දන්වනු ඇත. අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 7 ක් ඇතුළත තම අයදුම් පත්‍රය ලැබුන බව දන්වන ලිපියක් නොලත් අයදුම් කරුවෙක් වේ නම් ඔහු විසින් ඒ බව රාජ්‍ය සේව කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත වහාම දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ. පෙ. 500.

8–628/1—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ. 339/එක්ස්. 1567/64.

## රජයේ විදුලි කම්ාන්ත දෙපාර්තමේන්තුවේ රසඥ තනතුර

රජයේ විදුලි කම්ාන්ත දෙපාර්තමේන්තුවේ රසඥ තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවමින් අංක 14,464 හා 1965 ජූලි මස 30 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ පළ කරන්ට යෙදුන අංක ඒ. 339/එක්ස්. 1567/64 හා 1965 ජූලි මස 26 වැනි දිනැති නිවේදනය හා සම්බන්ධයි.

2. ඉහතකී තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයන් හි මෙහි පහත සඳහන් පරිදි දීර්ඝ කල බව මෙයින් දන්වමි :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1965 සැප්තැම්බර් 3 වැනිදා

(බී) විදේශ ඉල්ලුම් පත්‍ර—1965 සැප්තැම්බර් මස 9 වැනිදා.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායසීලයේ දීය.
තැ. පෙ. 500.

8–628/2—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

අංක ඒ ඒ. 36/එක්ස්. 1568/65.

## රජයේ විදුලි කර්මාන්ත දෙපාර්තමේන්තුව

### සිවිල් ඉංජිනේරු තනතුරු

කොළඹ රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙම කායසීලය මගින් සපයනු ලබන මුද්‍රිත ඉල්ලුම් පත්වල පිළියෙල කළ ඉල්ලුම් පත් පහත සඳහන් දිනවලට හෝ ඊට පෙර මට ලැබෙන්නට එවිය යුතුය :—

(අ) මෙරට ඉල්ලුම් පත් : 1965. 9. 3 වැනිදා.

(ආ) විදේශිය ඉල්ලුම් පත් : 1965. 9. 9 වැනිදා.

සටහන :

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නො වේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම් කරුවන් විසින් විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත් පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කායසීලවලින් ලබාගත හැකිය තම ඉල්ලුම් පත් ර. සේ. කො/ලේ. වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නව හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පුළුවන.

(iii) වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරියෙක් ඔහු සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔහුගේ නැව් ගාස්තුවත් ඔහු විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ප්‍රථමයෙන් පත්වීම දෙනු ලබන්නේ තුන් අවුරුදු ආධුනිකත්වයකට යටත්වය.

3. වැටුප් හා දීමනා—මෙම තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 13,800 න් පටන්ගෙන රු. 600 බැගින් වූ වාර්ෂික වැටුප් වැඩිවීම් 3 කින් වර්ෂයකට රු. 15,600 දක්වා නගී.

4. අවශ්‍ය සුදුසකම්.—සෑම අයදුම් කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) තමා විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව, හා

(ii) 1965 සැප්තැම්බර් මස 3 වැනි දිනට වයස අවුරුදු 45 කට නොවැඩි බව (දැනට මත් රජයේ සේවයේ සිටින නිලධාරීන්ට මේ වයස් සීමාව බල පවත්නේ නැත.).

(iii) කණිෂ්ඨ සහකාර සිවිල් ඉංජිනේරුවෙකු වශයෙන් සේවය කළ කාලයත් ඇතුළුව ඉංජිනේරුවෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවු. 10 ක පළපුරුද්දක් හා ලංඩන් හි සිවිල් ඉංජිනේරු ආයතනයේ ඒකාබද්ධ සාමාජිකත්වයක් ලබා තිබීම.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි ලපාංාන පාසැලක පයෝජනය සඳහා ඉදිරිපත් කරණ ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.).

(ආ) උපාධිය හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(ඉ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධිකාරී තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඊ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(උ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතික.

සැ. යු.—

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිනිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සළකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ කුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රා. සේ. කො./ලේ. තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9 අයදුම්පත් ලැබුණු බව දන්වනු ඇත. අයදුම් පත භාර ගැනීමේ අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුළත තම අයදුම්පත ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වේත් නම් වහාම ඒ බව රා. සේ. කො./ලේ. වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම්පත සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රා. සේ. කො. සභා කාර්යාලය,
තැ. පෙ. 500,
ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලය,
කොළඹ,
1965. 8. 12 දින.

8–628/3—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒබී. 11/එක්ස්. 1569/65.

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### ආධුනික සහකාර විදුලි සංදේශ අධිකාරීන්ගේ තනතුරු

තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ආධුනික සහකාර විදුලි සංදේශ අධිකාරීන්ගේ තනතුරු දෙකක් සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්‍ර මෙම කාර්යාලය විසින් සපයනු ලබන මුද්‍රිත ෆෝරමවල අයදුම්කරුගේම අත් අකුරින් ලියා පහත සඳහන් දින හෝ ඊට මත්තෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර—1965.9.3 වැනිදා.

**(බී) පිටරට ඉල්ලුම් පත්‍ර—1965.9.9 වැනිදා**

**සැලකිය යුතුයි.**—පිටරට අයදුම්කරුවන්, මුද්‍රිත ඉල්ලුම් පත්‍ර ෆෝරම පිටරට සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත යුතුය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යැවීම පිණිස මෙම ඉල්ලුම් පත්‍ර කැමති නම්, තමා පදිංචි රටට කිට්ටු හෝ තමන්ට නියමිත පිටරට ලංකා නියෝජිත තැනගේ කාර්යාලයට නියමිත කාලසීමාව තුළදී ඉදිරිපත් කළ හැක.

2. වැටුප, දීමනා සහ සේවා කොන්දේසි :

(i) මෙම තනතුරුවලට අදාළ වැටුප් පරිමාණය පහත සඳහන් අයුරු වේ :—
වර්ෂයකට රු. 4,080—3 × 360—5,160.
පුහුණුව අවසන් කිරීමෙන් පසු—පහත (iv) සහ (v) බලන්න—
ආධුනික සහකාර විදුලි සංදේශ අධිකාරීවරයකු සහකාර විදුලි සංදේශ අධිකාරී ශ්‍රේණියේ පුරප්පාඩුවකට පත්කරනු ලැබේ පුරප්පාඩුවක් නොමැති නම් පුරප්පාඩුවක් ඇති වන තුරු අතිරික්ත තනතුරට පත්කරනු ලැබේ.

(ii) පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි හා පාලන රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන යන මේවාට සහ ආණ්ඩුව මගින් කලින් කල නිකුත් කරනු ලබන සෙසු විධිවිධාන වලට සහ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

(iii) මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුලින්ම පළ කර ඇති රාජ්‍ය සේවයේ පත්වීම්වලට අදාළ පොදු කොන්දේසි වලට ද අවධානය යොමු කෙරේ.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් පළමුවෙන්ම අවුරුදු 3 ක ආධුනික කාලයක් පිට පත්කරනු ලැබේ. මෙම කාලසීමාව අවසානයේදී ඔවුන් ස්ථිර කිරීම රඳාපවත්නේ වෙනත් කරුණු අතර, දෙපාර්තමේන්තු අභ්‍යාස පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර පහත සඳහන් ව්‍යවස්ථා පිළිබඳ පරීක්ෂණයකින් සමත්වීම උඩය :—

(ඒ) හුවමාරුස්ථාන සේවා ව්‍යවස්ථා සහ විදුලි පණිවුඩ ව්‍යවස්ථා සංග්‍රහය.

(බී) රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, කාර්යය සංවිධාන සංග්‍රහය, තැපැල් ගිණුම්, සහ තැපැල් ස්ථානාධිපතීන්ගේ අත්පොත.

අවුරුදු තුනේ ආධුනික කාලය තුළ ඔවුන් පහත සඳහන් විෂයයන්ගෙන් ද සමත්වී සිටිය යුතුය :—

(ඒ) මූලික විදුලි සංදේශ පුහුණුව සහ

(බී) ලන්ඩන් සිටි සහ ගිල්ඩ්ස් ආයතනයේ ටැලිෆෝන් හුවමාරු ස්ථාන ක්‍රම I.

(v) (iv) හි සඳහන් දෙපාර්තමේන්තුවේ අභ්‍යාස පාඨමාලාවට අතිරේකව, අවශ්‍ය වුවහොත්, පිටරට අභ්‍යාස පාඨමාලාවක් පසුව සකස් කිරීමට ඉඩ ඇත.

(vi) ආධුනික සහකාර විදුලි සංදේශ අධිකාරීවරයකු ආධුනික කාලය තුළදී තම මනා පැවැත්ම, රාජකාරියෙහි යෙදීම සහ ස්ථිර කිරීමෙන් පසු තමාට පැවරෙන රාජකාරි ඉටුකිරීමේ හැකියාව සම්බන්ධයෙන් පෝස්ට්මාස්ටර් ජනරාල් සෑහීමකට පත් කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය නැවැත්වීමට ඉඩ ඇත.

3. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම, තමා—

(ඒ) 1965. 9. 3 දිනට වයස අවුරුදු 21ට නොඅඩු හෝ අවුරුදු 30 නොවැඩි බවත්,

**(බී) යහපත් චරිතයක් සහ ශාරීරික නිරෝගී භාවයක් ඇති බවත්,**

(සී) භෞතික විද්‍යාව සහ/හෝ ගණිතය සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා ඇත්තෙකු බවත්, සතුටුදායක ලෙස ඔප්පු කළ යුතු ය.

4. (i) 3 (බී) සහ (සී) කොන්දේසි සපුරාලන තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 1965. 9. 3 වැනි දිනට වයස අවුරුදු 45 ට නොවැඩි නම් ඔවුන්ට මේ සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් ඇත.

(ii) රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ කුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතුය :

(ඒ) උප්පැන්න සහතික පත්‍රය (සැ. යු.—බව්තිස්ම සහතික පත්‍රය හෝ උපකෘත පාඨශාලා පිළිබඳ නීති සංග්‍රහය අනුව නිකුත් කළ උප්පැන්න සහතික පත්‍ර පිළිගනු නොලැබේ.)

**(බී) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය.**

(සී) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය සහ තනතුරට පත්කිරීම සඳහා වන යෝග්‍යතාවය පිළිබඳ ලඟදීම ලබාගත් සහතික තුනක් (රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන්, මෙම උප කොටස යටතේ ඇති සහතික ඉදිරිපත් කළ යුතු නොවේ.)

**සැලකිය යුතුයි.**—මෙම සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ.

6. තෝරාගනු ලැබූ අයදුම්කරුවන්, දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සහ පිටරට අභ්‍යාස පාඨමාලාවක් හැදෑරීමට තම ශාරීරික යෝග්‍යතාවය සම්බන්ධයෙන් ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

7. තෝරා ගනු ලැබූ අයදුම්කරු අභ්‍යාස පාඨමාලාවක් සඳහා පිටරට යැවීමට සිදුවුවහොත් ඔහුට—

(ඒ) වෙනත් කරුණුද අතර, නියමිත අභ්‍යාස පාඨමාලාවේ වැඩ කටයුතු, විශ්වාසදායක ලෙසත් උද්යෝගී ලෙසත් කරගෙන යාමට සහ එය සතුටුදායක අන්දමින් සම්පූර්ණ කිරීමටත් එසේ සතුටුදායක ලෙස සම්පූර්ණ කළ පසු, අවශ්‍ය වුවහොත්, තමා ආපසු පැමිණි විට (ආණ්ඩුව මගින්, තීරණය කරනු ලබන) නියමිත කාල පරිච්ඡේදයක් ලංකාණ්ඩුවට සේවය කිරීමටත් පොරොන්දු වෙමින් ලංකාණ්ඩුව සමඟ ගිවිසුමකට ද,

(බී) ගිවිසුමේ යම් නියමයකට හා යම් කොන්දේසියකට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වූ කල්හි අභ්‍යාස පාඨමාලාව සම්බන්ධයෙන් ලංකාණ්ඩුව මගින් සහ/හෝ අභ්‍යාස පාඨමාලාව පිරිනමන වෙනත් ඒජන්සියක් මගින් දරනු ලැබූ සියළුම වියදම් (එනම් වැටුප, දීමනා, යාන ගාස්තු සහ ගාස්තු ආදිය) ලංකාණ්ඩුවට ගෙවීමට පොරොන්දු වෙමින් අභ්‍යාස පාඨමාලාවේ සම්පූර්ණ ගාස්තුවටම බැඳුම්කරයකට ද ඇතුළත්වීමට සිදුවෙයි.

8. ඉල්ලුම් පත්‍ර හෝ ඊට අදාළ වෙනත් ලියකියවිලි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවිය යුතු ය. එසේ නැතිව ඒවා මෙම කාර්යාලයේ කිසියම් නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

9. මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට සෑම අතින්ම අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුන බැව් දන්වනු ඇත. එහෙත් ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින හතක් ඇතුළත යම් අයදුම්කරුවකුට තම ඉල්ලුම් පත්‍රය ලැබුණ බවට දැන්වීමක් නොලැබුණහොත් වහාම ඔහු ඒ බැව් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැනුම් දිය යුතුය. මෙම නියමයට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වුවහොත් සලකා බැලීම සඳහා අයදුම්කරු විසින් කරන කිසියම් ඉල්ලීමක් වෙතොත් එය නොසලකා හරිනු ලැබේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

1965 අගෝස්තු මස 12 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500,
කොළඹ 1.

8–628/4—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

අංක : ඒ. 358/එක්ස්. 1570/64.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව (රාජ්‍ය භාෂා අංශය)

### පරිවර්තක අධිකාරී තනතුර

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පරිවර්තක අධිකාරි තනතුරක් සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත අයදුම් පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට අයදුම් පත්‍ර : 1965 සැප්තැම්බර් මස 3 වැනිදා.

(බී) විදේශීය අයදුම් පත්‍ර : 1965 සැප්තැම්බර් මස 9 වැනිදා.

**සටහන් :**

(i) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම් කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු :**— ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—

(i) මේ තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය ; තෝරාගනු ලබන අපේක්ෂකයා අවුරුදු 3 ක ආධුනිකතා කාලයකට යටත් ය.

(ii) **කාර්ය :**—කාර්ය නම් රාජ්‍ය සේවාවේ වෙනත් දෙපාර්තමේන්තුවලින් සපයන ලද පරිවර්තන ප්‍රතිශෝධනය කොට අනුමැතිය සඳහා නිර්දේශ කිරීම, ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම සහ වෙනත් අයුරින් දෙපාර්තමේන්තුවට සහායවීම ද වේ.

3. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට හිමි වැටුප් ක්‍රමය, වර්ෂයකට රු. 6,240 පටන් ගෙන වර්ෂයකට රු. 360 බැගින් 6 ක් හා රු. 480 බැගින් 10 යන වැඩිවීම් ඇතිව රු. 13,200 තෙක් නගී. වාර්ෂික වැටුප රු. 8,400 සහ රු. 11,760 ට පෙර කාර්යක්ෂමතා කඩ ඉම් දෙකකි. වාර්ෂික වැටුප රු. 11,280 වූ විට එම වැටුපම අවුරුදු දෙකක් ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම් කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) සිංහල විෂයයක් වශයෙන් ඇතිව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලැබූ අයකු බවට සහ සිංහල පරිවර්තකයකු වශයෙන් හෝ ලේඛකයකු වශයෙන් පරිවර්තන කටයුතු පිළිබඳ සෑහෙන පළපුරුද්දක් ඇත්තෙකු බව හෝ

(බී) විශේෂයෙන් සිංහල පිළිබඳ ප්‍රවීනතාවක් ඇත්තාවූ ද, හය අවුරුද්දක් වෘත්තියෙහි යෙදී සිටියාවූ ද, ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිනීතිඥයෙකු හෝ නීතිඥයෙකු බව, හෝ

(සී) ඕනෑම ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හය අවුරුද්දක පළපුරුද්දක් ඇති ලිඛිත තරග විභාගයකින් පරීක්ෂා කළ හැකි පරිවර්තන වැඩ පිළිබඳ සුවිශේෂ හැකියාවක් සහ පළපුරුද්දක් ඇති නිලධාරියෙකු බව සහ

(ඩී) 1965 සැප්තැම්බර් මස 3 වැනි දිනට වයස අවුරුදු 30 ට නොඅඩු බව සහ

(ඊ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

**සටහන :** මෙම කාර්යයට අදාල පරිවර්තන වැඩ ප්‍රධාන වශයෙන් නීතිය සම්බන්ධයෙන් වන බැවින් නීතිය ගැන මනා දැනුමක් තිබීම විශේෂයක් වශයෙන් සලකනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාර ගනු නො ලැබේ.)

(බී) උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතිකය.

සැ. යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම් පත් සලකා බලනු නො ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම් පත් ලැබුණු බව දන්වනු ඇත. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට සත් දිනක් ඇතුළත තම අයදුම් පත ලැබුණු බව දන්වන ලිපියක් නො ලත් අයදුම් කරුවකු වෙත් නම් වහාම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැඟිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය,
තැපැල් පෙට්ටිය 500.

8–628/5—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

අංක: ඊ. 151/එක්ස්. 1571/65.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### මහරගම රජයේ ගුරු විද්‍යාලයයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුර

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මහරගම රජයේ ගුරු විද්‍යාලයයේ සාමාන්‍ය විෂයයන් පිළිබඳ කථිකාචාර්ය තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළ යුතු අයදුම්පත් පහත සඳහන් දිනයන්හි හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි:—

(අ) මෙරට අයදුම් පත්—1965.9.3 වැනිදා.

(ආ) පිටරට අයදුම් පත්—1965.9.9 වැනිදා.

**සංලක්ෂ්‍යය.**—(i) අයදුම් පතක් හෝ ඒ හා සම්බන්ධිත ලිපියක් තැපැලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා අයදුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුයි.

(ii) විදේශීය අයදුම්කරුවන්ට අවශ්‍ය වන මුද්‍රිත අයදුම් පත් පෝරම් විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම තමාගේ අයදුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවීම සඳහා තමා පදිංචි රටට හෝ තමාට ආසන්නම රටට හෝ පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට, නියමිත කාල සීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුවන්ට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණ හා ගමන් ගාස්තු.**—ලංකා ආණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයකු ඉදිරියෙහි වෛද්‍ය පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. එම පරීක්ෂණ සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ ගමන් ගාස්තුවත් ඔවුන් විසින්ම දැරිය යුතු වේ.

2. **වැටුප් දීමනා.**—මෙම තනතුර සඳහා රු. 5,160—360 වැටුප් වැඩිවීම් 9—රු. 8,400 ක වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය.

3. **සේවා කොන්දේසි.**—මෙම තනතුර පාසැල් ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. විශ්‍රාම වැටුප් වාර්තා යටතේ ගුරුවරයෙකු ලෙස විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරණ ශික්ෂකයෙක් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබ් නම් ඔහු විසින් දරණ තාක් මෙම තනතුර විශ්‍රාම වැටුප් හිමි තනතුරක් ලෙස ප්‍රකාශ කරනු ලැබේ.

4. **අධ්‍යාපනික හා අනිකුත් අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින් ම ඔහු පිළිබඳ පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(ඒ) 1965.9.3 වැනි දිනට වයස අවුරුදු 28 ට නො අඩු බවට හා අවුරුදු 50 ට නො වැඩි බවට (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ අයගේ අයදුම්පත් උපරිම වයස සීමාව ගැන නොසලකා බලනු ඇත.)

(බී) (i) ඉල්ලුම්කරුවන් පශ්චාත් උපාධි හෝ අන්‍ය අන්දමේ සම්පූර්ණ කාල පුහුණුවක් ලැබූ උපාධිධරයන් විය යුතුය. ඉංග්‍රීසි පිළිබඳ ගෞරව උපාධියක් ලබා තිබීම හෝ ඉංග්‍රීසි භාෂාව උපාධියට විෂයයක් වශයෙන් ලබා තිබීම. උපාධිය ලැබීමෙන් පසු අවුරුදු 5 ක ඉගැන්වීමේ පළපුරුද්ද තිබීම.

(ii) තෝරනු ලබන අයදුම්කරුට ඉංග්‍රීසි ඉගැන්වීමට හැකියාවක් තිබිය යුතුයි. ඉංග්‍රීසි භාෂාව ද්විතීය භාෂාවක් වශයෙන් ඉගැන්වීමේ අභ්‍යාස පාඨ මාර්ගයක් අනුගමනය කර තිබෙන්නන්ට වැඩි සැලකිලි දක්වනු ලැබේ.

(iii) ඔවුන්ට සිංහල භාෂාවෙන් දේශන පැවැත්වීමට හැකියාවක් තිබිය යුතුයි.

(සී) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශාරීරික සනීපයෙන් යුක්ත බවට.

5. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම් පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතු.

6. පහත සඳහන් ලියවිලි එකක් හෝ සියල්ල ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි විට අපේක්ෂකයින් විසින් ඒවා ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත:—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ උපකෘත පාසැල් සඳහා නියමිත අධ්‍යාපන ව්‍යවස්ථා පරිදි නිකුත් කරන ලද උප්පැන්න සහතික හෝ භාරගනු නො ලැබේ.)

(බී) උපාධි සහතික පත්‍ර හෝ උසස්ම අධ්‍යාපනික සහතික පත්‍ර.

(සී) මේ තනතුරට පත් කිරීමට යෝග්‍ය බවටත්, චරිතය සම්බන්ධවත්, අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳවත් ළඟදී ලබාගන්නා ලද සහතික තුනක් (දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ගෙන් මෙහි සඳහන් ලියකියවිලි ඉදිරිපත් කිරීම අනවශ්‍යය.)

**සංලක්ෂ්‍යය.**—

(i) අයදුම් පත්‍රයට ලියවිලි හෝ ලියවිලි පිටපත් නො අමුණිය යුතුයි.

(ii) නියම කරනු ලැබූ අවස්ථාවක ලියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම් පත්‍ර සලකා බලනු නො ලැබේ.

7. තෝරාගනු ලැබූ අපේක්ෂකයා පළමුවෙන්ම මහරගම රජයේ ගුරු විද්‍යාලයට අයත්ව සේවය කරන නමුත් මාරුකර යැවීමට ඉඩ ඇත.

8. අයදුම් පත්‍ර හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු නමට පෞද්ගලිකව නො එවිය යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි ද බලනු මැනවි.

10. අයදුම් පත්‍ර සියල්ලම ලැබුණු බව දන්වනු ඇත. අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින සිට දින 7ක් ඇතුළත තම අයදුම් පත්‍රය ලැබුණ බව දන්වන ලිපියක් නොලත් අයදුම් කරුවෙක් වේ නම් ඔහු විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත වහාම දැන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරීමෙන් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 1, ගාළු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
තැ. පෙ. 500.

8–628, 6—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

අංකය: එච් 6/එක්ස්. 1572/65.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### සහකාර ගබඩා අධිකාරී තනතුරු

ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ සහකාර ගබඩා අධිකාරී තනතුරු 2 ක් සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහතින් සඳහන් දිනයන්හිදී හෝ ඊට ප්‍රථම මා වෙත ලැබිය යුතුයි:—

(ඒ) මෙරට අයදුම්පත්‍ර: 1965 සැප්තැම්බර් මස 3 වැනිදා.

(බී) විදේශීය අයදුම්පත්‍ර: 1965 සැප්තැම්බර් මස 9 වැනිදා.

**සංලක්ෂ්‍යය:**—

(i) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(ii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝරම්, විදේශයේ සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර ලංකාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන්ගේ පදිංචිය හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුළතදී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iii) **වෛද්‍ය පරීක්ෂණය සහ නැව් ගාස්තු.—ලංකාණ්ඩුව** යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත්, ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. *සේවයෙහි නියුක්ත කරවීමේ වගන්ති සහ සේවා කොන්දේසි.*—

(i) තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවනු ඇත.

(ii) පත්වීම අවුරුදු 3 ක් ගත වන තුරු ආධුනික කාලයේ වනු ඇත. ස්ථිර නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත්, නියමිත කාල සීමාවකට වැඩ බැලීමට ඔහු පත් කරනු ඇත.

(iii) තෝරා ගත් අයදුම්කරු ආධුනික කාලය තුළදී ගබඩා අධිකාරි විසින් තීරණය කරනු ලබන ගබඩා කටයුතු ඇති රජයේ දෙපාර්තමේන්තුවල පුහුණුවක් ලැබිය යුතුවාක් මෙන්ම, සියලු වර්ගයේ බඩු හා ගබඩා කිරීමේ අළුත්ම ක්‍රම සහ ගිණුම් පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා ගත යුතුය. ස්ථිරත්වයට සුදුස්සකු වීමට පෙර, ඔවුන් විසින් ගබඩා පරිපාලනය, දෙපාර්තමේන්තු ගබඩා රෙගුලාසි හා ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි පිළිබඳව පවත්වනු ලබන දෙපාර්තමේන්තු විභාගයකින් සමත් විය යුතුය. ආධුනිකත්වයේ සිටින සහකාර ගබඩා අධිකාරි කෙනෙකුට අවුරුදු 3 ක් ඇතුලතදී විභාගයෙන් සමත් වීමට නොහැකි වුවහොත්, විභාගයට පෙනී සිටීම සඳහා එක් අවස්ථාවක් හෝ ඊට වැඩි ගණනක් සලසා දීම පිණිස ඔහුගේ ආධුනික කාලය දීර්ඝ කරනු ලැබේ. දෙවෙනි වරටත් නොහැකි වුව හොත්, සේවය අවසන් කිරීමට සිදුවිය හැක.

(iv) ස්ථිර ලේකම් විසින් නියම කරනු ලබන ප්‍රමාණයකින් හා නියම කරනු ලබන ආකාරයකින් තෝරා ගනු ලබන අයදුම්කරු ඇප තැබිය යුතුය.

(v) තෝරා ගනු ලැබූ අයදුම්කරු ආණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා නව ප්‍රවේශ නිලධාරියෙකු නම්, සවකීය ආධුනික කාල සීමාව තුළදී සිංහල භාෂාව පිළිබඳව ප්‍රවීණත්වය ලබාගත යුතු වෙයි. තවද, ආධුනික කාල සීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම, අනිකුත් දේ අතර, 1962 ජූලි 20 වෙනි දින අංක 581 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම මත රඳා පවතිනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මසකට රු. 4,080 න් පටන් ගෙන රු. 360 බැගින් ව වාර්ෂික වැඩිවීම් 12 කින් වසකට රු. 8,400 දක්වා වැඩි වන වැටුප් ක්‍රමයක් මෙම තනතුරට අදාලය.

(නව ප්‍රවේශකයින් නොවන නිලධාරීන් සඳහා වසකට පවුම් 300—24×5 සහ 30×5 පවුම් 570).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම පිණිස සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) විශිෂ්ඨ චරිතයකින් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(බී) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් විය යුතුය. උසස් ගෞරව පෙළ උපාධිධරයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ ;

(සී) 1965.9.3 වැනි දිනට තම වියස අවුරුදු 21 ට අඩු නොවීම හා අවුරුදු 30 ට වැඩි නොවිය යුතුය. (මෙම වයස් සීමාවන් දැනට රජයේ සේවයේ සිටින අයට බලපවත්වන්නේ නැත).

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැල්හි ප්‍රයෝජනය සඳහා නිකුත් කරන ලද සහතිකය හෝ බව්තීස්ම සහතිකය භාරගනු නොලැබේ).

(බී) උපාධිය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්යවරයාගෙන් හෝ මහ චාර්යවරයාගෙන් හෝ විය යුතුය ;

(ඩී) වෘත්තීය හා/හෝ කාර්මික සහතිකය ;

(ඊ) සිංහල විෂයයෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

**සංලක්ෂ්‍යය :**

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් තම ඉල්ලුම්පත්‍ර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේකුදු වුවත්, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු ඔහු වෙත ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍රයේ අනුපිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත කෙලින්ම ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරණු ලැබේ.

9. අයදුම් පත් ලැබුණු බව දන්වනු ඇත. සත් දිනක් ඇතුලත අයදුම් පත් ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙකු වෙත් නම් විගසම ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දැන්විය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1965 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යලයේදිය,
තැපැල් පෙට්ටිය 500.

8–628 7—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදව

### වෛද්‍ය නිලධාරියෙක් සඳහා පුරප්පාඩුවක්

රාජකීය ලංකා ගුවන් හමුදවේ වෛද්‍ය නිලධාරියෙකුගේ පුරප්පාඩුවක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2 තෝරාගන්නා ලද අපේක්ෂකයාට ජ් යි ් ල් තන් කෙනෙත් වශයෙන් රාජකීය ලංකා ගුවන් හමුදවේ නිත අධිකාරි ලැබෙනවා ඇත.

**වැටුප් සහ දීමනා**

3 තෝරාගන්නා ලද අපේක්ෂකයා පත්කර ගන්නා විට ඔහුගේ පල පුරුදුකම් අනුව මෙහි සඳහන් වැටුප් ක්‍රමයෙහි සුදුසු ස්ථානයක තබනු ඇත :—

(අ) වැටුප් ක්‍රමය

(i) මූලික ශ්‍රේණිය අවුරුද්දකට රු.5,880 (රු. 360 වෙ 1 යි) රු. 6,240 ;

(ii) II වෙනි ශ්‍රේණිය—අවුරුද්දකට රු. 6,960 (රු. 360 වෙ 4ක් සහ රු 480 වෙ 6ක්) රු. 11,280. (රු. 11,280 වේදී අවුරුදු දෙකක නැවතීමක් තිබේ) ;

(iii) I වන ශ්‍රේණිය අවුරුද්දකට රු. 11,760 (රු. 480 වෙ 3 යි) රු. 13,200 ;

(iv) විශේෂ ශ්‍රේණිය–අවුරුද්දකට රු. 13,800 (රු. 600 යේ 3 යි) රු 15,600.

(ආ) දීමනා.—ජීවන වියදම් දීමනා, විශේෂ ජීවනාධාර දීමනා සහ ගෙවල් කුලී දීමනා රජයේ ගණන් මිමි අනුව ගෙවනු ලැබේ.

(ඇ) සේවා දීමනා.—1961 ගුවන් හමුද වැටුප් සංග්‍රහයේ සඳහන් වන මසකට රු. 180 ක සේවා දීමනාවක් ගෙවනු ලැබේ ;

(ඈ) නිල ඇඳුම් දීමනාව.—පළමුවෙන් සර්ව කලාපීය නිල ඇඳුම් සඳහා රු. 650ක් සහ නිලධාරියෙකුගේ පුහුණුවක් සඳහා පිටරට යන විට ශීත දේශගුණයට සරිලන නිල ඇඳුම් සඳහා රු. 1,300ක්ද ගෙවනු ලැබේ. මීට අතිරේක වශයෙන් අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළ පසු නිල ඇඳුම් දීමනාව වශයෙන් මසකට රු. 25ක මුදලක් ගෙවනු ලැබේ ;

(ඉ) සෙසු දීමනා.—රාජකීය ලංකා ගුවන් හමුදවේ රෙගුලාසිවල සඳහන් පරිදි වෙන්ට වියමේ දීමනාව, යැපීම් සහ වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

4. කලින් කල ගැසට් පත්‍රයේ පළකර සංශෝධනය කර ඇති 1934 පෙබරවාරි මස 5 දින දරණ විශ්‍රාම වැටුප් සංග්‍රහය යටතේ සහ ඒ අනුව විශ්‍රාම වැටුප් තෝරාගන්නා ලද අපේක්ෂකයාට හිමිවේ.

5. තෝරාගන්නා ලද අපේක්ෂකයා විවාහකයෙක් නම් (තිබේ නම්) හමුද නිවාසයක් සහ බැට්මන් සේවය සඳහා රු. 75ක දීමනාවක ට ද හිමිකරුවෙක් වේ. අවිවාහක නම්, බැට්මන් සේවය ද සහිතව නිලධාරි නිවාසයේ ඉඳුම් හිටුම් ලැබෙන්නට සුදුස්සෙක් වේ.

6. උසස්වීම්, වැටුප් ක්‍රම සහ සේවා කොන්දේසි පිළිබඳ විස්තර කලින් කල සංශෝධනය කරනු ලැබූ 1961 ගුවන් හමුද වෛද්‍ය සහ දන්ත වෛද්‍ය රෙගුලාසි අනුව වේ. රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයට පැමිණ ඉල්ලුම් කල විට මෙය බලාගත හැක.

**මූලික අවශ්‍යතා**

7. අයැදුම්කරුවන්ට මෙහි පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය :

(අ) **ජාතිය.**—අයැදුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි. එනම්—

(i) උත්පත්තියෙන්, හෝ

(ii) ලියාපදිංචි කරනු ලැබීමෙන් ලංකාවේ පුරවැසියෙක් වීම, හෝ

(iii) රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ අදහස අනුව පුරවැසිකම ලැබීමට හිමිකම ඇති, ලියා පදිංචි කරනු ලැබීමෙන් ලංකාවේ පුරවැසියෙකුවීමට ඉල්ලුම්කර ඇති හෝ ඉල්ලුම් කිරීමට බලාපොරොත්තුවන පුද්ගලයෙක්.

(ආ) **වයස.**—අයැදුම්කරුවන් 1965 ජූලි මස 1 වන දිනට වයස අවුරුදු 32 ට වැඩි නොවිය යුතුයි ;

(ඇ) **වෘත්තීය.**—අයැදුම්කරු ලංකාවේ වෛද්‍යවරයෙක් ලෙස ලියා පදිංචි වී සිටිය යුතුයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විශෙෂ පලපුරුදුකම් ඇති අය ගැන විශෙෂයෙන් සලකා බලනු ලැබේ;

(ඈ) **සෞඛ්‍ය තත්ත්වය.**—අයැදුම්කරුවන් ගුවන් හමුදවේ සෞඛ්‍ය තත්ත්වයට ගැලපෙන අයුරින් සිටිය යුතුය.

**අයැදුම්කරුවන්ට උපදෙස්**

8. මෙහි 14 වන ඡේදයේ ඇති ආකෘතිය අනුව අයැදුම්පත් ලියා 1965 සැප්තැම්බර් මස 11 වන දින දවල් 12 ට පෙර කොළඹ, තැ. පෙ. 594, ගුවන් හමුද මූලස්ථානයට ලැබෙන සේ එවිය යුතුයි. අයැදුම්පත බහා එවන කවරයේ වම් පැත්තේ උඩ කොනේ " වෛද්‍ය නිලධාරි තනතුර සඳහා අයැදුම් පත " යනුවෙන් සඳහන් කළ යුතුයි.

9. අයැදුම් පත සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ද ඉදිරිපත් කළ යුතුය :—

(අ) උප්පැන්න සහතිකයේ ;

(ආ) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපන සහ/හෝ වෘත්තීය පිළිබඳ සහතිකයේ ; සහ

(ඇ) අයැදුම්කරු පුද්ගලිකව හඳුනන වගකිවයුතු පුද්ගලයින්ගෙන් ලබා ගත් චරිත සහතික අඩුම වශයෙන් දෙකක් වත්.

(අයැදුම්පතේ දක්වෙන සෑම කරුණක් සඳහා ම තෝරාගැනීමේ මණ්ඩලයට පිළිගත හැකි සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුයි).

10. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධාරීන් විසින් එවන අයැදුම්පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. තෝරා ගනු ලැබුව හොත් එම නිලධාරියා නිදහස් කළ හැකි බවට සහතිකයක්ද එහි තිබිය යුතුය.

**තෝරාගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය**

11. ලැබෙන අයැදුම්පත් ගණන අනුව අවශ්‍ය වුවහොත්, පළමුවෙන් ගුවන් හමුදවේ මණ්ඩලයක් මගින් ඉහත සඳහන් සුදුසුකම් ඇති අයගෙන් සුදුසු අය තෝරා ගන්නවා ඇත. අවසාන තෝරාගැනීම කරනු ලබන්නේ, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තෝරාගැනීමේ මණ්ඩලයක් විසින් මෙම අයැදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජන කිරීමෙන් පසුවය.

12. කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත් වීමට අයැදුම්කරුවන්ට සිදුවෙනවා ඇත. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය, වේලාව සහ ස්ථානය ලිපියකින් දන්වනවා ඇත. මේ සඳහා අයැදුම් කරුවන්ට දැරීමට සිදුවෙන ගමන් වියදම් හෝ වෙනත් අන්දමේ වියදම් සඳහා මුදල් ගෙවන්නේ නැත. සම්මුඛ පරීක්ෂණයෙන් තෝරාගනු නොලබන අයැදුම්කරුවන්ට ඒ බව දන්වනවා ඇත.

**රාජ්‍ය භාෂාව පිළිබඳ අවශ්‍යතා**

13. තෝරාගනු ලැබුවහොත් රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව, විශෙෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන අනුව සහ අවශ්‍ය පරිදි ගුවන් හමුද රෙගුලාසිවල කරන ලද සංශෝධනයන් අනුව කටයුතු කිරීමට සිදුවන බව අයැදුම්කරුවන් විසින් සිහිතබාගත යුතුයි.

14. අයැදුම්පත් එවිය යුත්තේ මෙහි පහත සඳහන් අයුරුය. අයැදුම්පත් නිකුත් කරන්නේ නැත.

ඊ. ආර්. අමරසේකර,
එයාර් කොමදෝරු,
ගුවන් හමුදපති.

ගුවන් හමුද මූලස්ථානය,
තැ. පෙ. 594, කොළඹ.

## රාජකීය ලංකා ගුවන් හමුදවේ වෛද්‍ය අංශයේ අධිකාරියක් සඳහා අයදුම්පත

**පුද්ගලික විස්තර**

1. අගට යෙදෙන නම :————. සෙසු නම් : ————.

2. දනට ලිපිනය :————.
   (i) දුරකථන අංකය :————.
   (ii) නුදුරු දුම්රිය පොල :————
   (iii) නුදුරු පොලිස් ස්ථානය :——.
   (iv) විදුලි පණිවුඩ කාර්යාලය :——

3. ස්ථිර වාසස්ථානය :————. එහි වාසය කළ කාලය :————.

4. විවාහක තත්ත්වය :————.

5. ආගම :———

6. මව්පිය විස්තර :————.

| | නම | උපන් ස්ථානය | උත්පත්තියෙන් රාවැසි භාවය |
|---|---|---|---|
| (අ) පියා :— | ——— | ——— | ——— |
| (ආ) මව් :— | ——— | ——— | ——— |

7. පාසැල් හා විශ්ව විද්‍යාල චරියාව :—

| (අ) | පාසැල් ආදියෙහි නම | ඇතුලත්වූ දිනය | අස්වූ දිනය |
|---|---|---|---|
| | ................ | ................ | ................ |
| | ................ | ................ | ................ |

8. පාසැලෙන් අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් :—
(මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුය)

| (අ) | ස්වාමියාගේ නම | රක්ෂාවෙහි ස්වභාවය | රක්ෂාවෙහි කාලසීමාව |
|---|---|---|---|
| | ................ | ................ | ................ |
| | ................ | ................ | ................ |

9. මීට ප්‍රථම යුද්මතා සන්නද්ධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට තිබේද ? එසේ නම් ඉල්ලුම් කළ තනතුර, විස්තර හා දිනයද දක්වන්න:————.

10. සිවිල් උසාවියක් හෝ සේනා විනිශ්චය මණ්ඩලයක් මගින් යුද්මතා වරදට පත්කර තිබේද? උත්තරය "ඔව්" නම් විස්තර දක්වන්න:—.

අවශ්‍ය සුදුසුකම්.— (මෙම නිවේදනයේ 7 වන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන් සඳහාය)

| 11. | උපන් දිනය | වයස | උපන් ස්ථානය | රාවැසි භාවය: උත්පත්තියේදී | රාවැසි භාවය: දනට |
|---|---|---|---|---|---|
| | ——— | —— | ——— | ——— | —— |

(අ) යෝග්‍යතා :——. (ආ) අධ්‍යාපන සුදුසුකම් :———.
එනම් සුදුසුකම් පිළිබඳ 7 වන ඡේදයේ වගන්තිය ප්‍රකාර

(ඇ) උස : අඩි......අඟල්...... (ඈ) පපුව : අඟල්...... (ඉ) බර : රාත්තල්......

12. අතිරේක සුදුසුකම් : (පහත කොටුවල සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයැදුම්කරුට පුළුවන් විය යුතුය):————

13. ක්‍රීඩා දක්ෂතා විස්තර (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් හා ලබාගත් දක්ෂතාවයන් ද සඳහන් කරන්න):————

14. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබාගත් අනිකුත් දක්ෂකම් :———.

15. සන්නද්ධ සේවයක (නිත්‍ය හෝ ස්වේච්ඡා) හෝ බාල දක්ෂ ආයතනයක කළ සේවා විස්තර :————.

16. යම්කිසි විශේෂ සුදුසුකම් :————.

17. මෙම අයැදුම්පත සමඟ එවන දේ (පිටපත් පමණක් එවිය යුතුය) :——.

18. චරිත සහතික ලබාගත් අයවළුන්ගේ නම් :————.

19. මෙම අයැදුම්පතට අමුනා ඇති වෙනත් දේ :————.

————————,
දිනය :———————— අයැදුම්කරුගේ අත්සන.

8-643—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ තක්සේරු බදු එකතු කරන්නන්ගේ තනතුරු

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ තක්සේරු බදු එකතු කරන්නන්ගේ තනතුරු සඳහා ලංකිකයන්ගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

**ගෙවීම්—**

(අ) කාර්තුවකට එකතු කිරීමට නියම කරනු ලබන සම්පූර්ණ මුදලින් 45% ක් එකතු කළ විට 4% ක කොමිස් මුදලක් ද,

(ආ) කාර්තුවකට එකතු කිරීමට, නියම කරනු ලබන සම්පූර්ණ මුදලින් 65% ක් එකතු කළ විට 6% ක කොමිස් මුදලක් ද,

(ඇ) කාර්තුවකට එකතු කිරීමට නියම කරනු ලබන සම්පූර්ණ මුදලින් 65% කට වැඩියෙන් එකතු කළ විට 8% ක කොමිස් මුදලක් ද,

යන ගෙවීම් වලින් එක් ගෙවීමක් කරනු ලැබේ.

**සුදුසුකම්—**

(අ) සවත් පිරිසෙයින් කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වී සිටිය යුතුය.

(ආ) වයස අවුරුදු 30 කට නොඅඩු විය යුතුයි.

(ඇ) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත වූවෙකු විය යුතුයි.
(අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිවූවන් ගැන විශේෂයෙන් සලකා බලනු ඇත).

**සේවය—**

(අ) සංරක්ෂණ මණ්ඩල සීමාවට අයත් ප්‍රදේශය තුළ නියම කරනු ලබන කොටස් වලින් ඒ ඒ කාර්තුවට අය කිරීමට නියම කරනු ලබන මුදල් ප්‍රමාණය එකතු කළ යුතු වේ.

(ආ) සංරක්ෂණ මණ්ඩලය සපයන රිසිට් පත් මගින් එකතු කරන ලද මුදල් සතියකට වරක් කාර්යාලයෙහි තැන්පත් කළ යුතු වේ.

ඇපය.—තෝරා පත් කරනු ලබන ඉල්ලුම්කරුවන් මුදලින් රුපියල් 500 ක් ද, රක්ෂණ සහතිකයක් මගින් රුපියල් 1,500 ක් ද, තනතුර භාරගැනීමට මත්තෙන් කාර්යාලයෙහි තැන්පත් කළ යුතු වේ.

මෙම ආයතනයේ සේවය සඳහා මේ තනතුරුවලට තෝරා පත් කර ගන්නේ තාවකාලිකවය. එම තාවකාලික සේවය කිසිසේත් සංරක්ෂණ මණ්ඩලයේ මොනයම්ම පුරප්පාඩුවක් සඳහාවත් අතිරේක සුදුසුකමක් ලෙස සලකනු නොලැබේ.

ලිපිනය ලියූ මුද්දරයක් සහිත දිග ලියුම් කවරයක් එවීමෙන් නියමිත අයදුම්පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය.

සියළුම අයදුම් පත්‍ර "අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි" වෙත 1965 සැප්තැම්බර් මස 10 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේඛිත තැපෑලෙන් එවිය යුතුය.

ජී. සී. දිසානායක,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි.

1965 අගෝස්තු මස 5 වෙනි දින,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේදීය.

8–428—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ලංකා යුද හමුදාවේ දන්ත නිළධාරි තනතුර

1. ලංකා යුද හමුදාවේ දන්ත නිළධාරි තනතුරු එකක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරාපත්කරගනු ලබන ඉල්ලුම්කරුට ලංකා යුද හමුද වෛද්‍ය බලකායේ කපිතන් නිළයෙහි ස්ථිර අධිකාරි පත්වීම පිරිනමනු ලැබේ.

3. (ඒ.) පත්වීම ලැබීමේදී තෝරාපත්කරගනු ලබන ඉල්ලුම්කරුට ඔහුගේ පලපුරුදුකම් අනුව පහත සඳහන් වැටුප් ක්‍රමයෙහි සුදුසු ස්ථානයක තබනු ඇත :—

(i) II වෙනි ශ්‍රෙණිය—වාර්ෂික වැටුප රු. 5,160—රු. 360 වාර්ෂික වැඩිවීම 9 සහ රු. 480 වාර්ෂික වැඩිවීම 6—රු. 11,280 දී වැඩිවීම් දැවුරුදු කාලසීමාවකට නවතිනු ඇත.

(ii) I වෙනි ශ්‍රෙණිය—වාර්ෂික වැටුප රු. 11,760—රු. 480 වාර්ෂික වැඩිවීම 3—රු. 13,200.

(බී) I වන හා II වන ශ්‍රෙණියන් නොකැඩෙන කාලසීමාවන් වන අතර II වන ශ්‍රෙණියේ වැඩිම වැටුප දැවුරුදු කාලසීමාවකට නවතිනු ඇත.

(සී) පහත සඳහන් දීමනාද ගෙවනු ලැබේ :—

(i) ආණ්ඩුවේ නිවාසවල පදිංචිවී නොසිටින කල ආණ්ඩුවේ ගෙවල් කුලී ගෙවීම් ප්‍රමාණය අනුව ගෙවල් කුලී දීමනා. නිළධාරීන් සඳහා වෙන්වූ නේවාසිකාගාරයක පදිංචිව සිටීම අවශ්‍ය වන්නාවූද එසේ ඉඩකඩ පහසුකම් සලසා දී ඇත්තාවූද නිළධාරීන්ට මෙම දීමනාව ගෙවනු නොලැබේ.

(ii) ආණ්ඩුවේ ගෙවීම් ප්‍රමාණය අනුව ජීවනාධාර සහ විශෙෂ ජීවනාධාර, අවිවාහක නිළධාරීන්ට, නිළධාරීන් සඳහා වෙන්වූ නේවාසිකාගාරයක නවාතැන් සලසා දෙනු ඇත. නේවාසිකාගාරය තුල වාසය කරන කාලය තුල ඔවුනට මෙම දීමනාව ගෙවනු නොලැබේ. එහෙත් යුද හමුද වියදමෙන් ඔවුනට නොමිලයේ කෑම බීම සපයනු ඇත.

(iii) රුපියල් 180ක මාසික සේවා දීමනාවක්.

4. තෝරා පත්කරගනු ලබන ඉල්ලුම්කරුට විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීමට සුදුස්සෙක් වනු ඇත. එවැනි විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ගණන් බැලීමේ පදනම, ආණ්ඩුවේ ගැසට් පත්‍ර නිවේදන මගින් විටින් විට සංශෝධනය ලබන, 1934 පෙබරවාරි මස 5 වැනි දින දරණ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ දක්වා ඇති විධි විධානය අනුව වනු ඇත. උසස් වීම්, මතු බලාපොරොත්තු, වැටුප් සහ සේවා කොන්දේසි පිළිබඳ වැඩි විස්තර, කොළඹ යුද හමුද මූලස්ථානය වෙතින් ලබාගත හැක.

5. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය :—

(ඒ) ජාතිය—ඉල්ලුම්කරුවන් ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(බී) ඉල්ලුම්කරුවන්ගේ වයස 1965 සැප්තැම්බර් 3 වැනි දිනට අවුරුදු 32ට වැඩි නොවිය යුතුය.

(සී) අධ්‍යාපනික සහ වෘත්තිය සුදුසුකම්—අපේක්ෂකයින් ඇල්.ඩී.ඇස්., බී.ඩී.ඇස්. හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ පරීක්ෂණ මණ්ඩලයකින් ලබාගත් දන්ත සුදුසු කමක් සහ අතිරේකව ලංකා වෛද්‍ය ආයතනයේ දන්ත ශල්‍ය නිළධාරියෙකු වශයෙන් ලියාපදිංචිවී සිටිය යුතුයි.

(ඩී) ඉල්ලුම්කරුවන් විසින් නියමිත වෛද්‍ය අවශ්‍යතාවයන් සපුරාලිය යුතු අතර, ඔවුන් තෝරා පත්කර ගැනීමට ප්‍රථම, යුද හමුද බලධාරීන් පිළියෙල කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

6. ඉල්ලුම් පත්, පහත දක්වා ඇති ආකෘති පත්‍රයෙහි නියම කර ඇති පරිදි පිළියෙල කොට 1965 සැප්තැම්බර් 3 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ, යුද හමුද මූලස්ථානය, තැපැල් පෙට්ටිය 553, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම් පත බහාලන කවරයෙහි '' දන්ත නිළධාරී තනතුර සඳහා ඉල්ලුම් පත (ල. යු. වෛ. බ.) '' යනුවෙන් සඳහන් කළ යුතුය.

7. රජයේ සේවයෙහි යෙදී සිටින නිළධාරීන්ගේ ඉල්ලුම් පත්, සෞඛ්‍ය සේවා අධිකාරි මගින් ඉදිරිපත් කළ යුතු අතර යම්කිසි නිළධාරියෙක් තෝරා පත්කරගනු ලැබුවහොත් ඔහු සේවයෙන් නිදහස් කලහැකි බවට සහතික කල යුතුය. දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහතිකය අඩංගු නොකළහොත් රජයේ විශ්‍රාම වැටුප් හිමි සේවා කාලය හමුද විශ්‍රාම වැටුපට ගණන් ගනු නොලැබේ.

8. පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ඉල්ලුම් පතට අමුනා එවිය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය ;

(බී) තමා ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහතිකය සහ/හෝ වෘත්තිය සුදුසුකම් පිළිබඳ උසස්ම සහතිකය ; සහ

(සී) අඩු ගණනේ චරිත සහතික පත් දෙකක්, මෙම සහතික පත් ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා හඳුනන වගකියයුතු පුද්ගලයන්ගෙන් ලබාගත් ඒවා විය යුතුය.

9. ලැබෙන ඉල්ලුම් පත් සංඛ්‍යාව ගැන සලකා බලා අවශ්‍ය වුවහොත් ඉහත සඳහන් සුදුසුකම් ඇති අය අතුරෙන් මූලික තේරීමක් කරනු ලැබේ. අවසාන තෝරා පත්කර ගැනීම කරනු ලබන්නේ, එසේ තෝරාගත් ඉල්ලුම්කරුවන්, ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත් කරනු ලබන තේරීම් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුවය. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගන්නා ඉල්ලුම්කරුවනට එය පවත්වන ස්ථානය, දිනය සහ වේලාවත් ලියා දන්වනු ඇත. සම්මුඛ පරීක්ෂණය කොළඹදී පැවැත්වෙන අතර ඒ සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ අනිකුත් වියදම් රජයෙන් ගෙවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු නොලබන ඉල්ලුම් කරුවනට ඒ බැව් දන්වනු ඇත.

10. තෝරාපත්කර ගනු ලබන ඉල්ලුම් කරුවන් විසින්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවෙහි යෙදීමට සහ විශේෂයෙන්ම 1956 අංක. 33 දරණ රාජ්‍ය භාෂා පණත ක්‍රියාත්මක කිරීම අරබයා දැනටමත් පනවා ඇති හෝ මීට පසුව පනවනු ලැබිය හැකි නීති රීති වලට අනුකූලව කටයුතු කිරීම අවශ්‍ය වේ.

11. තෝරා පත්කර ගනු ලබන ඉල්ලුම්කරු අවශ්‍ය වුවහොත් ලංකාවේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය.

12. ඉල්ලුම් පත් පහත නියම කර ඇති පරිදි පිළියෙල කොට ඉදිරිපත් කල යුතුය. ඉල්ලුම් පත් පෝරම නිකුත් කරනු නොලැබේ.

ජේ. ඩී. සොයිසා, එම්.බී.ඊ.,
මේජර්,
යුද හමුදා ආඥපති වෙනුවට.

1965, අගෝස්තු මස 13 දින.

### ලංකා යුද හමුදාවේ වෛද්‍ය බලකායේ දන්ත නිළධාරි තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) : ————.

2. ජාතිය : ————.

   (ලාංකිකයෙකු වූයේ පෙලපතින්ද ? නැතහොත් ලියා පදිංචි කිරීමෙන්ද ? ලියාපදිංචි කිරීමෙන් නම් සහතිකයේ අංකය සහ දිනය සඳහන් කරන්න) : ————.

3. ලිපිනය : කාර්යාලයේ : ————.
   වාසස්ථානයේ : ————.

4. උපන් දිනය : ————.
   1965 සැප්තැම්බර් 3 වැනි දිනට වයස :—අවුරුදු :———— මාස :———— දින :————

5. සම්පූර්ණ නම, උපන් ස්ථානය, සහ දැන් ලිපිනය :
   මවගේ : ————.
   පියාගේ : ————.

6. ඔබ විවාහකද ?, අවිවාහකද ? : ————.

7. ඔබ පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ලබා ඇති ක්‍රීඩා ශූරත්වයන් : ————.

8. පාසැලේදී හෝ විශ්ව විද්‍යාලයේදී ඔබ විසින් කීර්තිය ලබා ඇති වෙනත් ක්‍රියාවන් : ————.

9. සන්නද්ධ සේවයේ හෝ සෙවච්ඡා බල සේනාවේ හෝ නිත්‍ය භට බලකායේ හෝ බාල දක්ෂ ව්‍යාපාරයන්හි හෝ ඔබ ඉහතින් කිනම් සේවයක් කර තිබේද ? : ————.

10. මෙම පදවිය ලැබීමට ඔබ සතු වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද ? :————.

11. ඔබ මීට ඉහතින් යම්කිසි සන්නද්ධ සේවයකට බැඳීමට ඉල්ලුම් කෙලෙහිද ? එසේ නම් එහි ප්‍රතිඵලය වූයේ කුමක්ද ? : ————.

12. ඔබගේ පාසැල් සමය හෝ විශ්ව විද්‍යාල සමය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න : ————.

| පාසැලේ හෝ විශ්ව විද්‍යාලයේ නාමය | ඇතුලුවූ දිනය | අස්වූ දිනය | සමර්ථ වූ ප්‍රසිද්ධ පරීක්ෂණය |
|---|---|---|---|
| | | | |

13. පාසැලෙන් හෝ විශ්ව විද්‍යාලයෙන් අස්වූ දින සිට ඔබ නියුක්ත වී සිටි රැකියාවන් පිළිබඳව පහත සඳහන් විස්තර දක්වන්න :—

| ස්වාමි පක්ෂය | රැකියාවේ ස්වභාවය | සේවය කළ කාලය—දින සිට දින දක්වා |
|---|---|---|
| | | |

14. ඔබට චරිත සහතික දුන් අයගේ නම් සහ ලිපිනයන් :

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය : ————.

8-609—65.8.20 දින අංක 14, .86 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### තාවකාලික සිංහල භාෂා පරිවර්තක තනතුරු දෙකක්

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ තාවකාලික සිංහල භාෂා පරිවර්තක තනතුරු දෙකක් සඳහා අයදුම් පත් එවන ලෙස සුදුසු සත්ට මෙයින් ආරාධනය කරමි. මෙහි පහත දැක්වෙන ඉල්ලුම් පත්‍රයේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් වෂී 1965 සැප්තැම්බර් මස 9 වැනි දිනට පෙර මට ලැබෙන්නට එවිය යුතුය.

2. (අ) මැටුප.—මේ තනතුරට නියමිත වැටුප් ක්‍රමය, රුපියල් 3,900—රුපියල් 180 හා රුපියල් 240—රුපියල් 6,540.

(ආ) රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන්නෙකු මෙම තනතුරට පත් කරන්නට යෙදුන හොත් ඔහුගේ පත්වීම වැඩ බැලීමේ පදනමක් මත වියයුතුය.

3. **සේවයේ කොන්දේසි.—**

(i) මේ තනතුර තාවකාලිකය, විශ්‍රාම වැටුප් රහිතය, මේ තනතුරට තෝරාගනු ලබන අපේක්ෂකයා, මසක් කල් දීමෙන් පසු සේවයෙන් අස් කිරීමට යටත් වේ.

(ii) සුළු කාලයක් ඇතුළත දී තනතුරේ වැඩ බාරගන්නා ලෙස තෝරාගත් අපේක්ෂකයාට නියම කරනු ලැබේ.

(iii) තනතුරට අයත් කාර්ය නම් ලිපි ලේඛනාදිය ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීම, සිංහලෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම, අනෙක් දෙපාර්තමේන්තුවලින් එවන සිංහල පරිවර්තනයන් ප්‍රතිශෝධනය කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් නියම කෙරෙන වෙනත් කටයුතු කිරීම ද වේ. භාෂා පිළිබඳ විශේෂ ප්‍රවීණත්වයක් ඔවුන්ගෙන් බලාපොරොත්තු වනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් : හැම අයදුම්කරුවෙකුම—**

(අ) සිංහලය විෂයයක් වශයෙන් ඇති උපාධියක් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලැබූ අයකු බවට ; නැතහොත්

(ආ) සිංහල භාෂා පරිවර්තකයකු වශයෙන් දහ අවුරුද්දක පළපුරුදු කම් ඇත්තාවූ හෝ තමා යටත් පිරිසෙයින් උපාධිධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තෝරීම් සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි ලේඛකයකු නොහොත් ග්‍රන්ථ කර්තෘවරයකු වූ හෝ බවටත්, ඉංග්‍රීසිය පිළිබඳ ඉතා හොඳ දැනුමක් ඇත්තාවූ අයකු බවටත් ;

(ඇ) දැන් ආණ්ඩුවේ සේවයෙහි යෙදී නොසිටියෙත් 1965 සැප්තැම්බර් මස 9 වැනිදට තමාගේ වයස අවුරුදු 25 ට නො අඩු බවටත් 50 ට නො වැඩි බවටත් ;

(ඈ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් ;

සැහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය.

5. හැම අයදුම්කරුවකු ම විසින් පහත පෙනෙන සහතිකවල පිට පත් (මුල් ලිපි නොවේ) තම අයදුම්පතට අමුණා එවිය යුතු ය :—

(අ) **උප්පැන්න සහතිකය (සැලකිය යුතු යි.—බවුතීස්ම සහතික** පත්‍ර හෝ උපකාන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කටයුතු සඳහා දෙන සහතික පත්‍ර බාර ගනු නො ලැබේ.) ;

(ආ) උසස් ම අධ්‍යාපනික සුදුසුකම් සහ/හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ ලැබූ සහතික පත්‍රය ;

(ඇ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය, මේ තනතුරට ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මෑත දී ලබාගන්නා ලද සහතික තුනක්. (රාජ්‍ය සේවාවෙහි සිටින අයදුම්කරුවන්ගෙන් මේ බලාපොරොත්තු නොවේ.)

**සැලකිය යුතුයි.—සහතික පත්‍රවල හා චරිත සහතික පත්‍රවල පිට** පත් ආපසු එවනු නොලැබේ.

6. ආණ්ඩුවේ සේවයෙහි නියුක්ත නිලධාරීන් එවන අයදුම්පත් නියමිත දිනයෙන් පසු ව මෙහි ලැබුණොත්, ඒ අයදුම්පත් භාරගනු ලබන්නේ ඒවා නියමිත දිනයට කලින් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබී තිබුණ හෙයින් ද, ඒවා ප්‍රමාද වීමට සැහෙන හේතු දක්වමින් එම අයදුම්පත් භාර ගන්නා ලෙස දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා නිර්දේශ කළ හොත් පමණකි.

7. අයදුම්පත් හා ඒ පිළිබඳ සෙසු ලියුම් කියුම් එවිය යුත්තේ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියකුගේ පෞද්ගලික නමට නොව, රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් හට ය.

8. ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයෙහි පළ වූ ද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කෙරෙන පත් කිරීම් පිළිබඳ වූ ද පොදු කොන්දේසි බලනු මැනවි.

9. එවන හැම අයදුම්පතක් ම මෙහි ලැබුණ බව දන්වා එවනු ලැබේ. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනයේ සිට, තුන් දවසක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුණොත් ඔහු විසින් ඒ බව රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස් හට වහා ම දන්වා එවිය යුතුය. එසේ නොකරන අයගේ හිමිකම් ගැන සලකනු නොලැබේ.

නන්දදේව විජේසේකර,
රාජ්‍යභාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

1965 අගෝස්තු මස 13 වැනි ද,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 598, 22, රීඩ් මාවත, කොළඹ 7.

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### තාවකාලික සිංහල භාෂා පරිවර්තක තනතුරු සම්බන්ධ ඉල්ලුම් පත්‍රය

(1) අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(අ) අගට යෙදෙන නම :————.

(ආ) අනිත් නම් :————.

(2) ලිපිනය :————.

(3) (අ) වෂී 1965 සැප්තැම්බර් මස 9 වැනි දිනට සම්පූර්ණ වයස—
අවුරුදු :—. මාස :—. දවස : —.

(ආ) උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි) :————.

(4) රටවැසි භාවය සහ එය කෙසේ ලැබුණේ ද යන බව :————.

(5) (අ) පියාගේ සම්පූර්ණ නම :————.

(ආ) පියා උපන් දිනය හා ස්ථානය :————.

(ඉ) ඔහුගේ රටවැසි භාවය :————.

(6) **අයදුම්කරු විවාහකද, අවිවාහකද කනවැන්දුම්ද යන බව** විවාහක නම් විවාහ වූ දිනයත් දරුවන ගණනත් සඳහන් කළ යුතු යි) :————.

(7) මූලික අධ්‍යාපනය ලත් පාඨශාලා සහ විද්‍යාල (ඒවාට ඇතුළත් වූ සහ අස් වූ දින සඳහන් කළ යුතු යි :————.

(8) (අ) ශාස්ත්‍රාලයීය සහ වෘත්තීය සුදුසුකම් (ඒවා ලත් දිනත්, සාමාර්ථය ලැබූ පෙළත් සඳහන් කළ යුතුයි. සහතික පිටපත් ද අමුණා එවිය යුතු යි) :————.

(9) (අ) සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන්ගෙන් සාමාර්ථය ලත් උසස් ම විභාගය :————.
සිංහල :————.
ඉංග්‍රීසි :————.

(ආ) පරිවර්තක වැඩ සම්බන්ධයෙන් පළපුරුදුකම් තිබේ නම් දින සමග විස්තර සඳහන් කරන්න :————.

(ඇ) සාහිත්‍ය කෘතීන් කර පළපුරුදුකම් තිබේ නම් දින සමග ඒවා ද සඳහන් කරන්න :————.

(10) (අ) පාඨශාලාවෙන් හෝ විද්‍යාලයෙන් හෝ අස් වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් ද, ඒ පිළිබඳ වකවානු ද, ලැබූ වැටුප් ද සඳහන් කරන්න :————.

(ආ) රජයේ සේවයේ යෙදී සිටී නම්, තත්ත්වයත්, වාර්ෂික වැටුපත් සඳහන් කරන්න :————.

(11) **විශේෂ පළපුරුදු, පුහුණුවීම්, සුදුසුකම් සහ හිමිකම් :————.**

(12) පෞද්ගලික ලෙස ආශ්‍රය කරන තිදෙනෙකුගේ නම් (තත්ත්වය සහ ලිපිනය සඳහන් කරන්න. මේ අය ඔබේ **ඥාතීන් නො විය යුතුයි) :—**

(1) ........................
(2) ........................
(3) ........................

(13) චරිත සහතික දී ඇති අයගේ නම් සහ තත්ත්ව (ඥාතීන් නො විය යුතුයි) මෑතකදී ලත් චරිත සහතිකවල පිටපත් පමණක් අමුණා එවිය යුතු යි) :————.

(14) මුදල් කරදර නැති වූවෙක් ද යන වග, නැති නම් ණය ප්‍රමාණය (ගණන් විස්තර කරන්න :————.

(15) වෙනත් කරුණු :————.

මෙහි සඳහන් කර ඇති යම්කිසි කරුණක් වැරදි හෝ අසත්‍ය බව හෝ පත්වීම දෙන්නට පෙර හෙළි වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත්වීම ලැබුවාට පසු හෙළි වුවහොත් කිසි මවන්දි ගෙවීමක් නැති ව, මා නිලයෙන් අස් කිරීමට ද යටත් වන බව මම දැන සිටින බව ද, මේ අයදුම් පතෙහි දක්වෙන සියලු විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

## හෙට්ටිපොළ නානායම් භාරකාර තනතුර

හෙට්ටිපොළ නානායම් භාරකාර තනතුර සඳහා ඉල්ලුම්පත් එවන මෙන් මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කළ ඉල්ලුම්පත් 1965 සැප්තැම්බර් මස 10 වැනි දින මධ්‍යහ්න 12 ට හෝ ඊට පෙර මට ලැබෙන සේ එවිය යුතුය.

2. මෙම තනතුරට අදාල වැටුප් ක්‍රමය නම්—රු. 540—30—8 සහ 24×1—804 යි (රු. 636 සිට රු. 732 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් සහිත)

3. ඉල්ලුම්කරුවන් ලාංකිකයන් විය යුතු අතර වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි. අවුරුදු 3 කට නොඅඩු කාලයකාවක් ආහාර පිසීමේ සහ ආහාර පාන සැපයීමේ පළපුරුදුකම් ඇති ආණ්ඩුවේ සේවකයින්ට උපරිම වයස් සීමාව නො යෙදේ.

4. ඉල්ලුම්කරුවන්ට කෑම පිසීම සම්බන්ධව මනා දැනීමක් තිබිය යුතු අතර ගණන් තැබීමටද දුළුවන් විය යුතුය. ආහාරපාන සැපයීමේ ව්‍යාපාරවල පළපුරුදුකම් ලබා ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලැබූ අයදුම්කරුවන් දඹු හා අනත්දරු අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

6. සේවා කොන්දේසි :

(i) තෝරාගත් අයදුම්කරු අවුරුදු 3ක ප්‍රවාසනයට යටත්වේ. විශේෂ අවස්ථාවලදී හැර යම් පාලන දිස්ත්‍රික්කයක් සඳහා බැඳවගත් අයදුම්කරු එම දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුකිරීම් කරනු නොලැබේ.

(ii) දුළුවන් අවස්ථාවලදී ගෙවල් කුලීවලින් තොර නැවතීම් පහසුකම් සලස්වා දෙනු ලැබේ.

(iii) බඳවාගනු ලැබූ අයදුම්කරු අණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමටත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලටද අනුව ක්‍රියා කළයුතුය.

(iv) පත්කිරීම සඳහා රජයේ සේවයෙහි සිටින ස්ථිර නිලධාරීහු තෝරා ගනු ලැබුවහොත් වැඩ බැලීමේ පදනම උඩ ඔහු පත් කරනු ලැබේ.

7. තෝරාගත් අයදුම්කරු තමා භරයට පත් කරනු ලබන ලද නානායම් ලී බඩු සහ වෙනත් බඩු බාහිරාදිය ආරක්ෂා සහිතව තබා ගැනීමේ හා තම රාජකාරිය විශ්වාසවන්තව ඉටු කිරීමේ පොරොන්දුවක් වශයෙන් දැනට මුදලින් රු. 750 ක් ඇප තැබිය යුතු අතර ගිවිසුමකටද අත්සන් කළයුතුය.

8. තෝරාගත් අයදුම්කරු දැනටමත් රජයේ සේවයේ නියුතු අයකු නොවේ නම්, දිවයිනේ ඕනෑම පලාතක සේවය කිරීම සඳහා තමා කායික වශයෙන් සුදුසුදැයි තීරණය කිරීමට රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

9. අයදුම්කරු අවශ්‍ය වුවහොත් කුරුණෑගල දිසාපති කාර්යාලයේදී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් සඳහා තමාගේ වියදමින් පැමිණ පෙනී සිටිය යුතුය.

10. ඉල්ලුම්පත් කුරුණෑගල රජයේ දිසාපති නමට එවිය යුතු අතර පුද්ගලිකව පහත අත්සන් කළ අය නමට නොඑවිය යුතුය.

11. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) අංශයේ පටන් ගැන්මෙහි පළකර තිබෙන සේවා තනතුරු සඳහා පත්වීම්වලට අදාල පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

පාලිත වීරමන්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති.

1965.8.13 වැනි දින,
කුරුණෑගල කච්චේරියේ දී ය.

ආකෘති පත්‍රය

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ හෙට්ටිපොළ නානායමේ භාරකාර තනතුර සඳහා ඉල්ලුම්පත

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලිපිනය :————.

3. ජාතිය (ලාංකිකයෙක්ද, නැද්ද යන වග සඳහන් කළ යුතුයි) : ————.

4. අයදුම්කරුගේ උපන් දිනය සහ ස්ථානය :————.

5. අයදුම්කරුගේ පියාගේ උපන් දිනය සහ ස්ථානය :————.

6. විවාහකද, අවිවාහකද යන වග :————.

7. අධ්‍යාපනික සුදුසුකම් සහ අවසාන වරට සමත් වූ විභාගය දිනයන් සමග :—
   (අ) සිංහල/දෙමළ :————.
   (ආ) ඉංග්‍රීසි :————.

8. අධ්‍යාපනය ලැබූ පාසැල, ඉන් අස්වූ දිනය :————.

9. (අ) පාසැලින් අස්වූ දින පටන් කළ රැකියාවල් (කාල පරිච්ඡේද යන් සමග සම්පූර්ණ විස්තර දිය යුතුයි) :————.
   (ආ) මීට ඉහත රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඉන් අස්වීමට හේතු සමග සම්පූර්ණ විස්තර :————.

10. කියවීම, ලිවීම හා කථාකිරීම් ප්‍රවීණතාවය පිළිබඳ විස්තර :—
   සිංහල :————.
   දෙමළ :————.
   ඉංග්‍රීසි :————.

11. විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර (එනම් කෑම පිසීම, ගණන් තැබීම ආදිය පළපුරුද්ද) :————.

12. චරිත සහතික ලබාගත් අයවළුන්ගේ නම් සහ පදවි (එම සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුයි) :————.

13. නානායම් වැඩ පිළිබඳව ලබා ඇති පළපුරුද්ද හෝ වෙනත් විශේෂ සුදුසුකම් :————.

14. ක්‍රිමිනල් වරදක් සඳහා උසාවියකින් දඩුවම් පමුණුවා තිබේද? එසේ නම් එම නඩුවේ අංකය, දිනය සහ නඩුවේ ස්වභාවය : ————.

15. ණයතුරුස්වලින් හා මුදල් පිළිබඳ කරදරවලින් නිදහස් ද යන වග :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. තවද, මෙහි අන්තර්ගත කරුණු අසත්‍ය හෝ වැරදි බවට, මා තෝරාගැනීමට කලින් දැනගතහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු කිරීමට හැකි බවත්, පත් කරනු ලැබුවාසින් පසු සොයා ගතහොත් කිසිම වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ලිපිනය :
කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිසාපති,
කච්චේරිය,
කුරුණෑගල.

8-705—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

අංකය : ශිෂ්‍ය/499.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1966 මලයාසියානු පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ පහත සඳහන් ක්ෂෙත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා මලයාසියාව විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ :—

(අ) කලා විෂයයන්.

(ආ) විද්‍යා විෂයයන්.

(ඉ) කෘෂිකර්මය.

(ඊ) වෛද්‍ය විද්‍යාව.

(උ) නීතිය.

ශිෂ්‍යත්ව ප්‍රදානයේ අරමුණ වනුයේ, ලාංකික සිසුන්ට මලයාසියාවේ පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණ කටයුතු සඳහා හෝ අවස්ථාවක් ලබා දීමය.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

සංලක්ෂ්‍යය 1.—රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ ' නම් පමණ ය. එසේ කිරීමේදී, එම චක්‍රලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතු ය.

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ඇබෑර්තු—සහකාර ගණකාධිකාරීන්

**අවශ්‍ය සුදුසුකම්.**—අයදුම්කරුවන් චාටර්ඩ් ගණකාධිකාරී ආයතනයක හෝ පිළිගත් ආයතනයක හෝ මධ්‍යම ගණකාධිකාරී විභාගයෙන් සමත්ව තිබීම, හෝ

ලංකා කාර්මික විද්‍යාලයෙහි ගණකාධිකාරී උපාධි අවසාන විභාගයෙන් සමත්ව පිළිගත් කාර්මික හෝ වෙළඳ සමාගමක අවුරුදු 6ක් ගණකාධිකාරී පළපුරුද්ද තිබීම.

**වයස.**—අවුරුදු 25-35 දක්වා.

**වැටුප් පරිමාණය.**—රු. 4,800—රු. 12,000—මූලික (වාර්ෂිකව)

---

15×480

රජයේ දෙපාර්තමේන්තුවල/අර්ධ රජයේ දෙපාර්තමේන්තුවල/රජයේ සංයුක්ත මණ්ඩලවල නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයපත් සිය දෙපාර්තමේන්තු/අර්ධ රජයේ දෙපාර්තමේන්තු/රජයේ සංයුක්ත මණ්ඩල ප්‍රධානීන් මගින් එවිය යුතුයි.

තෝරා ගනු ලබන ඉල්ලුම්කරුවන් 3 අවුරුදු පරීක්ෂණ/අත්හදා බැලීම් කාලයකට යටත් වේ. රජයේ භාෂා ප්‍රතිපත්තියට සහ විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීම සඳහා දැනට සකස් කර ඇති නීතියේ හෝ මින් පසුව පිළියෙල කරන නීතිවලට හෝ අනුකූලව ඔවුන් ක්‍රියා කළ යුතුවේ.

තෝරා ගනු ලබන අපේක්ෂකයින් වැලව්වෙනෙහි හෝ කොළඹ නැවතී වැඩ කිරීමට අවශ්‍යවේ.

ඉහත සඳහන් වේතන ක්‍රමයට අමතර දීමනාවක් සංයුක්ත මණ්ඩලයේ ගණන් අනුව ගෙවන අතර එකී දීමනාවන් දැනට රජය විසින් ගෙවනු ලබන ප්‍රමාණයන්ම වේ.

ඉහත සඳහන් තනතුරු සඳහා තෝරා ගන්නා අයදුම්කරුවන්ගේ පළපුරුද්ද හා අධ්‍යාපන සුදුසුකම් අනුව ඇඩි ක්‍රමයන්හි සුදුසු පියවරක තැබීම ගැන සලකා බලනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම මගින් ඉල්ලුම්කරුවන්ගේ අත්අකුරින්ම 1965 අගෝස්තු 31 වැනිදා හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ඉල්ලුම්පත් එවිය යුතුයි. ඉල්ලුම්පත් පෝර්ම තැපෑලෙන් ඉල්ලා එවන විට මුද්දර ගැසූ සිය ලිපිනය සහිත කවරයක්ද එවිය යුතුයි.

සභාපති,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

70, යෝක් වීදිය,
කොළඹ 1,
1965 අගෝස්තු 9 දින.

8–716—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## අධිකරණ අමාත්‍යාංශය—ආණ්ඩුවේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව

### II වන ශ්‍රේණියේ රසායනාගාර උප සහකාර තනතුර

ආණ්ඩුවේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුවේ II වන ශ්‍රේණියේ රසායනාගාර උප සහකාර තනතුරක් සඳහා අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවල කණිෂ්ඨ සේවකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ පෝර්මය අනුව ඉල්ලුම් පත් සකස් කොට ගැසට් නිවේදනයේ සිට සති දෙකක් තුළ 1965 සැප්තැම්බර් 3 වැනි දින හෝ ඊට පෙර කොළඹ 7, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ආණ්ඩුවේ රසපරීක්ෂක වෙත, ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම ඉල්ලුම් පත ලියා ඉදිරිපත් කළ යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට වර්ෂයකට රු. 540න් පටන් ගෙන රු. 30 වැඩිවීම් 8කින් හා රු. 24 වැඩිවීම් එකකින් වැඩිවී රු. 804 දක්වා නගින වැටුප් ක්‍රමයක් හිමි වේ.

3. **බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි.**—තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු එක් වසරක වැඩ බැලීමේ කාල පරිච්ඡේදයකට යටත්ව පත්කරනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—8 වන ප්‍රමාණයෙන් (කණිෂ්ඨයෙන්) සමත්ව තිබීම, රසායනික විද්‍යාව, වඩුවැඩ, යාන්ත්‍රික වැඩ සහ/හෝ ඡායාරූප ශිල්පය ගැන දැනුමක් ඇතිවීම විශේෂ සුදුසුකම් සේ සලකනු ලැබේ.

5. මෙම තනතුර සඳහා එවන ඉල්ලුම් පත් හෝ වෙනයම් ලිපියක් හෝ මෙම දෙපාර්තමේන්තුවේ කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නොඑවිය යුතුය. සෑම අයදුම් පතක්ම අයදුම්කරු සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තැන මගින් එවිය යුතු වේ.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන් ගැන්මේ ප්‍රසිද්ධ කර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් දෙන සාමාන්‍ය කොන්දේසි ද බලන්න.

7. මුද්‍රිත අයදුම් පත් නොමැත. මෙහි පහත දී තිබෙන ආදර්ශ අයදුම් පත්‍රය පිටපත් කරගත යුතුය.

8. අයදුම් පත් ලද බැව් දන්වනු ලැබේ. අයදුම් පත් භාරගන්නා අවසාන දිනයට පසු සතියක් ඇතුළත අයදුම්පත් ලැබුණු බැව් හැඟවීමේ ලිපියක් නොලද හොත් ඒ බව වහා දැන්විය යුතුය.

9. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් අධ්‍යාපනය පිළිබඳ උසස්ම සහතිකය සහ වෙනත් තමා සතු විශේෂ සුදුසුකම් පිළිබඳ සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු වේ.

ආණ්ඩුවේ රසපරීක්ෂක.

1965 ජූලි 15 දින,
කොළඹ 7, ආණ්ඩුවේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව,

### ආදර්ශ අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.
2. ලිපිනය :———.
3. 1965.9.1 දිනට නිවැරදි වයස :———.
   අවුරුදු :——, මාස :——.
4. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :———.
5. දැනට කරන රක්ෂාව (සේවය කරණ ස්ථානය, තනතුරු, එම තනතුරට බැඳුනු දිනය ආදිය විස්තර සහිතව)
6. වෙනත් විස්තර :———.

මා විසින් මෙම අයදුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුනු විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ අයදුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තේරීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින් නුසුදුසු වීමට පැමිණෙනවත් හැර තේරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහකිරීමට යටත්වන බව දනිමි.

අත්සන :———.

දිනය :———.

8–625—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ගල්ඔය සංවර්ධන මණ්ඩලය

අම්පාරේ හාර්ඩි කාර්මික අභ්‍යාස ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

**සහකාර කථිකාචාර්ය**

**සුදුසුකම් :**—(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබන ලද ගණිතය පිළිබඳව පළමුවන පංතියේ ගෞරව උපාධිය ;

(ආ) ඉගැන්වීම පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වෙනවා ඇත.

**පඩි ප්‍රමාණය.**—අවුරුද්දකට රු. 5,760—240—රු. 7,200 ;

හෝ

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබන ලද ගණිතය පිළිබඳ උපාධියක් ;

(ආ) ඉගැන්වීම පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වෙනවා ඇත.

**පඩි ප්‍රමාණය.**—අවුරුද්දකට රු. 3,600—180—රු. 5,400.

ඉහත පඩි ප්‍රමාණයන් සමග ආණ්ඩුවේ පිළිගත් ප්‍රමාණයන් අනුව තාවකාලික ජීවනාධාර දීමනා සහ පදිංචිය සඳහා නිවාස සම්පාදනය නොවන්නේ නම් විවාහක අයෙකුට ස්වකීය පඩියෙන් 15% ක්ද, අවිවාහක අයෙකුට නම් තම පඩියෙන් 7½% ක්ද, ගෙවල් කුලී දීමනා ගෙවනවා ඇත.

තෝරා ගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය භාෂාවෙන් ප්‍රවීනතාවය ලබා නැතිනම් රජයේ භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් අනුව ප්‍රවීනතාවය ලබා ගත යුතුයි.

වැඩිදුර විස්තර සහ අයදුම් පත්‍ර ආකෘති අම්පාරේ, ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ ලේකම් කාර්යාලයේ සාමාන්‍යාධිකාරිවරයාගෙන් හෝ කොළඹ බුලර්ස් පාරේ අංක 415 දරණ ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ පාලක ලේකම්වරයාගෙන් හෝ ලබා ගැනීමට පුලුවන.

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1965 සැප්තැම්බර් 9 වෙනි දින වේ.

සාමාන්‍යාධිකාරී,
ගල්ඔය සංවර්ධන මණ්ඩලය.

මණ්ඩලීය කාර්යාලය,
කොළඹ.
1965

8–739—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

### ඇබෑර්තු

1965 සැප්තැම්බර් මස 4 වෙනි දින දක්වා, පහත සඳහන් තනතුරු වලට අයදුම් පත් කැඳවනු ලැබේ:—

**1. උප පරීක්ෂක (යාන්ත්‍රික)**

**අවශ්‍ය සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ සමාන විභාගයකින් සමත් වී තිබීම හා,

(අ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ විභාගයෙන් සමත් වී තිබීම හෝ,

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ පාඨමාලාව අවසානය දක්වා හැදෑරීම හෝ,

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය පිළිබඳ පිළිගත් සමාගමක හෝ රජයේ දෙපාර්තමේන්තුවක සිවු අවුරුදු ආධුනිකත්වය සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබීම.

**වයස.**—අවුරුදු 20—35 දක්වා.

**වැටුප් ක්‍රමය.**— රු. 300—15×10—25×10—700, සියල්ල අඩංගු මාසික වේතනයක්.

ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1965.2.26 වෙනි දින යාන්ත්‍රික උප පරීක්ෂක තනතුර සම්බන්ධව පළ කරන ලද දැන්වීම අනුව, අයදුම් කළ ඉල්ලුම් කරුවන් නැවත අයදුම් කළ යුතු නොවේ.

**2. උප පරීක්ෂක (විදුලි)**

**අවශ්‍ය සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ සමාන විභාගයකින් සමත් වී තිබීම හා,

(අ) කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ විභාගයෙන් සමත් වී තිබීම හෝ,

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ පාඨමාලාව අවසානය දක්වා හැදෑරීම හෝ

(ඇ) විදුලි ඉංජිනේරු ශිල්පය ගැන පිළිගත් සමාගමක හෝ රජයේ දෙපාර්තමේන්තුවක සිවු අවුරුදු ආධුනිකත්වයක් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබීම.

**වයස.**—අවුරුදු 20—35 දක්වා.

**වැටුප් ක්‍රමය.**— රු. 300—15×10—25×10—700, සියල්ල අඩංගු මාසික වේතනයක්.

**3. සැලසුම්කරු—II වෙනි ශ්‍රේණිය**

**අවශ්‍ය සුදුසුකම්.**—ලංකා කාර්මික විද්‍යාලයේ සැලසුම් ශිල්පය පිළිබඳ පාඨමාලාව සතුටුදායක ලෙස අවසන් කර තිබීම හා, ආධුනික සැලසුම්කරුවෙකු වශයෙන් දෑ අවුරුදු පළපුරුද්දක් තිබීම හෝ,

පිළිගත් සමාගමක හෝ රජයේ දෙපාර්තමේන්තුවක පූර්ණ කාලීන ආධුනික සැලසුම්කරුවෙකු වශයෙන් සිවු අවුරුදු පළපුරුද්දක් තිබීම.

**වයස**—අවුරුදු 18—35 දක්වා.

**වැටුප් ක්‍රමය.**— රු. 300—15×10—25×10—700, සියල්ල අඩංගු මාසික වේතනයක්.

පළපුරුද්ද හා අධ්‍යාපන සුදුසුකම් අනුව තෝරා ගනු ලබන අයදුම් කරුවන් ඉහත සඳහන් පඩි ක්‍රමයන්හි සුදුසු පියවරක තැබීම ගැන සලකා බලනු ඇත.

අයදුම් පත් සමග ලඟදී ලබාගත් චරිත සහතික දෙකක පිටපත් ද, එවිය යුතුය.

මෙම කාර්යාලයට පැමිණ හෝ තම ලිපිනය ලියූ ශත 10 ක මුද්දරයක් ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් හෝ අයදුම් පත් ලබා ගත හැක.

සභාපති,
ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව.

තැ. පෙ. 194,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2,
1965 අගෝස්තු මස 16 වන දා.

8-664/1—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව

### කායික කාර්ය සහායක තනතුරු (අනියම්)

ඉහත සඳහන් තනතුරු සඳහා 1965 සැප්තැම්බර් 4 වෙනි දින දක්වා ලාංකිකයින්ගෙන් අයදුම් පත් භාරගනු ලැබේ.

මෙම තනතුරු අනියම් වන අතර, සුදුසු කාලයක් සේවය කිරීමෙන් පසු ස්ථිර සේවයේ පුරප්පාඩු ඇතිවූ විට ඒ සඳහා ඉල්ලුම් කිරීමට අවකාශ ඇත.

**සුදුසුකම්.**—සියලුම අයදුම්කරුවන්ට යටත් පිරිසෙයින් ඉංග්‍රීසි විෂයක් වශයෙන් ඇතිව සිංහල කණිෂ්ඨයෙන් හෝ සිංහල විෂයක් වශයෙන් ඇතිව ඉංග්‍රීසි කණිෂ්ඨයෙන් සමත් විය යුතු අතර, පිළිගත් ආයතනයක කායික කාර්ය සහායකයෙකු ලෙස අවුරුදු දෙකක පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස.**—අවුරුදු 25—35 දක්වා.

**වැටුප් ක්‍රමය.**—120—2.50×30—195 දක්වා මසකට සියල්ල අඩංගුව.

අයදුම් පත් සමග සේවා පිළිබඳ සහතික හා ලඟදී ලබාගත් චරිත සහතික දෙකක පිටපත් ද එවිය යුතුය. ඉන් එකක් තම වසමේ ග්‍රාම සේවක තැනගෙන් විය යුතුය.

මෙම තනතුරු සඳහා අයදුම් පත් එවන මෙම සංස්ථාවේ සේවකයින් ඒවා තම තමන්ගේ අංශය භාර නිලධාරි/හෝ ඉංජිනේරු/ස්ථාන භාර නිලධාරි මගින් එවිය යුතුය.

මෙම තනතුරු සඳහා මූලික අයදුම් පත් පහත සඳහන් ආකෘතිය අත්දමට එවිය යුතුය.

සභාපති,
ලංකා රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාව.

තැ. පෙ. 194,
48, ශ්‍රී ජිනරතන පාර,
කොළඹ 2.

ආකෘතිය

.......................................තනතුර

නම :————.
ලිපිනය :————.
අධ්‍යාපන සුදුසුකම් :————.
පළපුරුද්ද :————.
දැනට සේවය :————.
ඊට පෙර සේවය :————.
වෙනත් සුදුසුකම් :————.
සහතික ලබාගත් අය :—
1. :————.
2. :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-664/2—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## විභාග දෙපාර්තමේන්තුව

### අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය

1965 අගෝස්තු විභාගයේ පටන් විත්ඩ්‍රෝවල් වවුචර නිකුත් කිරීම නවත්වනවා ඇත. දැනට වලංගු ව්‍යවස්ථා අනුව 1964 අගෝස්තු සහ 1964 දෙසැම්බර් විභාග වලින් ඉල්ලා අස්වූ අයදුම් කරුවන්ට විත්ඩ්‍රෝවල් වවුචර වෙනුවට මුදල් ආපසු දෙනු ලැබේ.

2. 1965 අගෝස්තු විභාගයේ සිට ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය පිළිබඳ 13 වැනි හා 14 වැනි ව්‍යවස්ථා පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත:—

**13 වන ව්‍යවස්ථාව—ඉල්ලා අස්වීමේදී ගාස්තුවෙන් කොටසක් හෝ මුදල් ආපසු දීම**

ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂෙප කරනු නොලැබුවාවූද පහත සඳහන් නියම යන්ට අනුකූලව විභාගයෙන් ඉල්ලා අස්වූවාද අයදුම්කරුවකුට ඔහු ගෙවූ විභාග ගාස්තුවෙන් සියයට 90ක් ආපසු ලබා ගැනීමට හිමිකම් ඇත:—

(i) තමන් ඇතුළුවූ සියළුම විෂයයන්ගෙන් ඉල්ලා අස්විය යුතුය.

(ii) ඉල්ලා අස්වීම පිළිබඳව දන්වා එවන ලිපිය දෙසැම්බර් මස පවත්වනු ලබන විභාගයක් සඳහා නම්, ඔක්තෝබර් 31 දාත් අගෝස්තු මස පවත්වනු ලබන විභාගය සඳහා නම්

ජූනි 30 වැනිදාත් නොඉක්මවා විභාග කොමසාරිස්ට ලැබෙන්නට සැලැස්විය යුතුයි. අසනීපයක් නිසා විභාගයෙන් ඉල්ලා අස්වන්නේ නම් විභාග කොමසාරිස්ට පිළිගත හැකි වෛද්‍ය සහතිකයක් සමග විභාගයට පළමුවෙන් පෙනී සිටිය යුතු විෂයයට නියමිත දින සිට දින 7ක් ඇතුළත දන්වා එවිය යුතුයි.

(iii) අයදුම්කරු විභාගයේ එක විෂයයකට වත් පෙනී නොසිටි අයෙකු විය යුතුයි.

**14 ව්‍යවස්ථාව—සම්පූර්ණ විභාග ගාස්තු ආපසු ගෙවීම**

පහත සඳහන් කොන්දේසි අනුව අයදුම්කරුවකු ගෙවන ලද සම්පූර්ණ විභාග ගාස්තුව ආපසු ලබාගැනීමට හිමිකම් ඇත :—

(i) අගෝස්තු මස පවත්වනු ලැබූ විභාගයකට පෙනී සිට ප්‍රතිඵල නිකුත් වන්නට කලින් දෙසැම්බර් මස පවත්වනු ලබන විභාගයට ඇතුළු වන අයදුම්කරුවකුට මුළු විභාගයෙන් හෝ ඉන් කොටසකින් හෝ ඉල්ලා අස්වීමටත් අදාළ විභාග ගාස්තු ආපසු ලබාගැනීමටත් අවසර දෙනු ලැබේ. එසේ ඉල්ලා අස්වීම හා ගාස්තු ආපසු ලබාගැනීම පිළිබඳ දන්වා එවන අවස්ථාවේදී අගෝස්තු මාසයේ විභාගයේ දී ලත් විභාග අංකය හා ඉල්ලා අස්වීමට අදහස් කරන විෂයය හෝ විෂයයන් ද සඳහන් කළ යුතුයි. එහෙත් එබඳු අයදුම් කරුවකුට විභාගයට ඇතුළුවීමේ දී සඳහන් කළ විෂයයන් කිසිවක් වෙනස් කිරීමට හෝ අමුතුවෙන් විෂයයන් එකතු කිරීමට හෝ මොනම කරුණක් නිසාවත් අවසර දෙනු නොලැබේ.

(ii) කලින් පෙනී සිටි විභාගයකදී කරනලද වරදක් නිසා යම්කිසි අයදුම්කරුවකුට ඉන්පසු පවත්වන ලද විභාගයකට පෙනී සිටීම කොමසාරිස් තැන විසින් තහනම් කිරීම හේතුකොට ගෙන ඒ අයදුම්කරු පසුව පෙනී සිටි විභාගයක අපේක්ෂකත්වය හා ප්‍රතිඵල අවලංගු වුවහොත් ඔහු විසින් ඒ විභාගය සඳහා ගෙවන ලද ගාස්තු සම්පූර්ණයෙන් ආපසු ගෙවනු ලැබේ. එහෙත් එය ගෙවනු ලබන්නේ ඔහු විභාගයට පෙනී සිටීම තහනම් කිරීම පිළිබඳ තීරණය ඔහුගේ ඉල්ලුම් පත්‍රය කොමසාරිස්තැනට තැපැල් කිරීමට පසුව දන්වා තිබුණොත් පමණකි.

(iii) කලින් පෙනී සිටි අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයක ප්‍රතිඵල කොමසාරිස්තැන විසින් වෙනස් කරන්නට සිදුවීම හේතු කොට ගෙන විභාගයෙන් ඉල්ලා අස්වීමට හෝ ස්වකීය ඉල්ලුම් පත්‍රය සංශෝධනය කිරීමට හෝ යම්කිසි අයදුම්කරුවකුට අභිමත වුවහොත් සම්පූර්ණ විභාග ගාස්තු හෝ ඔහුට ලැබිය යුතු කොටස හෝ ආපසු ගෙවනු ලැබේ. එහෙත් එය ආපසු ගෙවනු ලබන්නේ ඔහුගේ ඉල්ලුම් පත්‍රය කොමසාරිස්තැනට තැපැල් කිරීමට පසුව, කලින් පෙනී සිටි විභාගයේ ප්‍රතිඵලය වෙනස් කළ බව අයදුම්කරුට දන්වා තිබෙතොත් පමණකි.

1965 ජූලි මස 30 වන දින,
කොළඹ 2—මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

හ. ල. විමලසූරිය,
වැ. බ. විභාග කොමසාරිස්.

8-619—65.8.20 දින අංක 14,436 දරන ගැසට් පත්‍රය

---

අංකය : 1/23/4/9(ජී)

**සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පන්තියේ දෙවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත ජාතික භාෂාවන් හා ගිණුම් පිළිබඳ පරීක්ෂණය—1965 පෙබරවාරි**

1965 ජූලි මස 9 වන දින හා අංක 14,444 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයට අතිරේක වශයෙන් පහත නම් සඳහන් නිලධාරීන් ද, සාමාන්‍ය ලිපිකරු සේවය පිළිබඳ වාර්තාවේ ‘ සී ’ උප ග්‍රන්ථයේ නියම කර ඇති සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සාමාර්ථ්‍යය ලබා ඇති බව පොදු දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ආනන්දසිංහ, පී. | ... | මහා භාණ්ඩාගාරය. |
| කරුණාරත්න, බ. රෙ. | ... | ගණන් පරීක්ෂක. |
| fපර්ඩිනන්ඩ්ස්, හෙ. ජේ. | ... | සමාජ සේවා |
| පුස්සෙගොඩ, ටී. බ. | ... | සෞඛ්‍ය. |
| මලවරආරච්චි, ච. | ... | රා. ආ. වි. අමාත්‍යාංශය. |
| සන්මුගනාදන් සිවගුරුනාදන් | ... | ගණන් පරීක්ෂක. |
| සරවනමුත්තු, ක. | ... | ආනයන හා අපනයන පාලක. |
| සෙනෙවිරත්න, ත. ජෝ. | ... | මහා භාණ්ඩාගාරය. |

2. ඉහත දැක්වෙන ගැසට් නිවේදනයේ පළ වූ කරුණාරත්නම් ක. කච්චේරිය, අනුරාධපුරය යන නම කුනරත්නම්. ක. කච්චේරිය, අනුරාධපුරය කියා නිවරද විය යුතුය.

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8-704—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංක : 1/83/12/1(ජී)

**ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියේ ලඝු ලේඛකයන් සඳහා 1965 අප්‍රියෙල් මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (සිංහල) විභාගය**

1965 අප්‍රියෙල් 17 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත් ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයන් හා ලඝු ලේඛිකාවන් ද ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයය/විෂයයන් |
|---|---|---|---|---|
| අභයරත්න, සො. (මහත්මිය) | ... | තැපැල් | ... | ලඝු ලේඛනය |
| අලුත්වත්ත, සු. මු. ඩැ. | ... | නිවාස | ... | ලඝු ලේඛනය |
| ඇන්සිනෝනා, හු. ආ. (මෙනෙවිය) | | ඒකාබද්ධ මහේස්ත්‍රාත් උසාවිය, කොළඹ | | ලඝු ලේඛනය |
| කරුණාවතී, වැ. හේ. (මෙනෙවිය) | | ඉඩම් කොම සාරිස්ගේ | | ලඝු ලේඛනය |
| කරුණාවතී, සු. ආ. (මෙනෙවිය) | | අධ්‍යාපන | ... | ලඝු ලේඛනය |
| ගුණපාල, කා. ... | ... | විභාග | ... | සිංහල |
| ගුණවර්ධන, හේ. පු. | ... | සෞඛ්‍ය | ... | ලඝු ලේඛනය හා සිංහල |
| ඩැනිස්ටර්, ලි. ... | ... | දේශීය ආදයම් | | ලඝු ලේඛනය |
| පෙරේරා, න. මා. ද (මෙනෙවිය) | ... | මහා භාණ්ඩාගාරය | | ලඝු ලේඛනය |
| පෙරේරා, සු. ධ. (මෙනෙවිය) | ... | දේශීය ආදයම් | | ලඝු ලේඛනය |
| ප්‍රනාන්දු, සී. ප. (මෙනෙවිය) | ... | ගණන් පරීක්ෂක | | ලඝු ලේඛනය |
| සෙනෙවිරත්න, රා. දෙ.ච. | ... | මහා භාණ්ඩාගාරය | | ලඝු ලේඛනය හා සිංහල |

2. පහත සඳහන් නිලධාරිහු පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සම්පූර්ණ වශයෙන් දුන් සමර්ථ වී ඇත්තාහ.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ගුණවර්ධන, හේ. පු. ... | ... | සෞඛ්‍ය |
| සෙනවිරත්න, රා. දෙ. ච. | ... | මහා භාණ්ඩාගාරය |

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 7 වැනිද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8-457/1—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12/1(ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ ලඝු ලේඛකයන් සඳහා 1965 අප්‍රේල් මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (ඉංග්‍රීසි) විභාගය

1965 අප්‍රියෙල් 10 වැනි දින පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී, ප්‍රවාසන/පරීක්ෂණ කාලවලට යටත් ව පත්වීම් ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයන් ලඝු ලේඛිකාවන් ඔවුන් ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන් ගෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|---|
| කරුණාරත්න, දේ. දෙ. ජ. | ... | මහේස්ත්‍රාත් උසාවිය ගාල්ල | ඉංග්‍රීසි |
| ප්‍රනාන්දු, ඩො. රි. බැ. | ... | රාජකීය ලංකා ගුවන් හමුදා | ඉංග්‍රීසි, සිංහල |

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 7 වැනිද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8–457/2—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/12(ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියේ ලඝු ලේඛකයන් සඳහා 1965 අප්‍රියෙල් මස පවත්වන ලද සේවයෙහි ස්ථිර කිරීමේ (විශේෂ) (ඉංග්‍රීසි) විභාගය

1965.4.10 වැනි දින පත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන්ගේ පත්වීම් ස්ථිර කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී ප්‍රවාසන කාලයකට යටත් ව පත්වීම ලබා සිටින පහත සඳහන් ලඝු ලේඛකයා ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් විෂයයෙන් සමර්ථ වී ඇති බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයයන් |
|---|---|---|---|---|
| සිරිතුංග, අ. දෙ. ධ. | ... | කම්කරු | ... | ලඝු ලේඛණය |

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්

1965 අගෝස්තු මස 7 වැනිද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8–457/3—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/83/13/1(ජී)

## ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් (සිංහල) විභාගය—1965 අප්‍රේල්

1965 අප්‍රේල් 17 වැනි දින පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝු ලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝු ලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛක/ලේඛිකාවන් ඔවුන් ගේ නම ඉදිරියේ සඳහන් විෂයයෙන්/විෂයයන් ගෙන් සමත් වී ඇති බව මෙයින් දනුම් දෙමි :—

| නම | | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|---|
| ඇල් ප්‍රිඩා, සෙ.මු.දෝ. (මෙනෙවිය) | | දේශීය ආදයම් | සිංහල හා ලඝු ලේඛනය |
| කුලරත්න, යා. අ. දෙ. | ... | රජයේ දේශ සංචාරක | සිංහල හා ලඝු ලේඛනය |
| ගුණවර්ධන, දෙ. මු. අ. | ... | දේශීය ආදයම් | සිංහල හ ලඝු ලේඛනය |
| චන්ද්‍රසේන, ජා. ... | ... | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත | සිංහල හා ලඝු ලේඛනය |
| නන්දසේන, ලො. ච. | ... | දේශීය ආදයම් | සිංහල |
| නානායක්කාර, පී. | ... | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත | සිංහල |
| පියසේන, ත. අ. ... | ... | දේශීය ආදයම් | සිංහල |
| පීරිස්, හ. මී. (මෙනෙවිය) | ... | පරිවාස හා ළමා රක්ෂක සේවා | සිංහල |

| නම | දෙපාර්තමේන්තුව | විෂයය/විෂයයන් |
|---|---|---|
| පෙරේරා, මා. ග. ච. (මෙනෙවිය)... | දේශීය ආදයම් | සිංහල හා ලඝු ලේඛනය |
| ලොකුගෙ, ප. ප්‍ර. (මෙනෙවිය) ... | දේශීය ආදයම් | සිංහල හා ලඝු ලේඛනය |

2. පහත සඳහන් අපේක්ෂක/අපේක්ෂිකාවන් ද සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළත් කර ගැනීම සඳහා දන් සුදුසුකම් ලබා ඇත:—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ඇල් ප්‍රිඩා, සෙ. මු. දෝ. (මෙනෙවිය) | ... | දේශීය ආදයම් |
| කුලරත්න, යා. අ. දෙ. | ... | රජයේ දේශ සංචාරක |
| ගුණවර්ධන, දෙ. මු. අ. | ... | දේශීය ආදයම් |
| චන්ද්‍රසේන, ජා. ... | ... | ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත |
| පෙරේරා, මා. ග. ච. (මෙනෙවිය) | ... | දේශීය ආදයම් |
| ලොකුගේ ප. ප්‍ර. (මෙනෙවිය) | ... | දේශීය ආදයම් |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද එම පරීක්ෂණයට ඇතුළුවීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අයද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපැලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 7 වැනිද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8–457/4—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1(ජී)

## ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝුලේඛකයන් සඳහා වූ කර්යක්ෂමතා කඩයිම් (ඉංග්‍රීසි) පරීක්ෂණය—1965 අප්‍රේල්

1965.4.10 වැනි දින පවත්වන ලද, ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රෙණියට අයත් ලඝුලේඛකයන් ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් පහත සඳහන් ලඝුලේඛක ලේඛිකාවන් ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් විෂයයෙන්/විෂයයන්ගෙන් සමත්ව ඇති බව මෙයින් දනුම් දෙමි:—

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයයන් |
|---|---|---|---|---|
| ආනන්දප්පා, ඩො. ජෙ. ඉ. | ... | රේගු | ... | සිංහළ |
| ජයසිංහ, වා. ය. ර. | ... | පළාත් පාලන අමාත්‍යාංශය | | ඉංග්‍රීසි, සිංහල |
| පෙරේරා, මා. දෙ. පැ. | ... | තැපැල් | ... | ඉංග්‍රීසි, සිංහල |
| සෙනෙවිරත්න, වා. ජ. මූ. රො. ක්ලෝ. ර. | | ප්‍රවෘත්ති හා ගුවන් විදුලි | | ලඝුලේඛනය ඉංග්‍රීසි |
| සිල්වා, ලි. හෙ. ආ. | ... | සෞඛ්‍ය | ... | ඉංග්‍රීසි |

| නම | | දෙපාර්තමේන්තුව | | විෂයයන් |
|---|---|---|---|---|
| සිරිවර්ධන, ගෞ. | ... | දිස්ත්‍රික් උසාවිය, අවිස්සාවේල්ල | ... | සිංහල |

2. පහත සඳහන් අපේක්ෂකයාද සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුලත් කර ගැනීම සඳහා දන් සුදුසුකම් ලබා ඇත:—

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ආනන්දප්පා, ඩො. ජෙ. ඉ. ... | ... | රේගු |

3. සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරියා ද, ඵම පරීක්ෂණයට ඇතුළුවීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අයද මීළඟ සම්මේලන වාර්කා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් විභාග/කො., වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

ච. ඊ. කුරේ,
අතිරේක භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 7 වැනිද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8–457/5—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාර අංක : 1,83/13/1(ජී)

## ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් (විශෙෂ) ඉංග්‍රීසි විභාගය—1965 අප්‍රේල්

1965.4.10 වැනි දින පවත්වන ලද ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝුලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ (විශේෂ) පරීක්ෂණයේ දී පහත සඳහන් ලඝු ලේඛකයා ඔහුගේ නම ඉදිරියෙන් සඳහන් විෂයයන්ගෙන් සමත් වී ඇති බව මෙයින් දනුම් දෙමි:—

| නම | දෙපාර්තමේන්තුව | විෂයයන් |
|---|---|---|
| කැනන්, කා. ඉ. බැ. ... | පොලිස් ... | ලඝුලේඛනය හා ඉංග්‍රීසි |

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාර අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 7 වැනිද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8–457/6—1965.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාර අංකය : 1/83/13/1(ජී)

## ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් (ඉංග්‍රීසි) විභාගය—1964 ඔක්තෝබර්

අංක 14,381 හා 1965.4.23 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයට අමතරවයි. ස්ථාන මාරුව සහිත ලඝුලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලඝුලේඛකයන්ගේ වාර්ෂික වේතනය රුපියල් 2,9÷0ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේදී පහත සඳහන් අපේක්ෂකයා ද, සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුලත් කර ගැනීම සඳහා දන් සුදුසුකම් ලබා ඇත:—

| නම | දෙපාර්තමේන්තුව |
|---|---|
| බොක්ස්, ජේ. ලෝ. ෂ. ... | විදුලි කර්මාන්ත |

(3) සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කාර්යක්ෂමතාකඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරියා ද, එම පරීක්ෂණයට ඇතුළු වීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අයද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියාපදිංචි කළ තැපැලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

ච. ඊ. කුරේ,
භාණ්ඩාගාර අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 අගෝස්තු මස 7 වැනිද,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

8–457/7—1965.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/23/21/2 (ජී).

## භාෂා පරිවර්තක සේවයේ II වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1965 ඔක්තෝබර්

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ පාලනය යටතෙහි පවත්නා, භාෂා පරිවර්තක සේවයේ II වන ශ්‍රේණියට ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම අපේක්ෂකයන් බඳවා ගැනීම පිණිස තරඟ විභාගයක් විභාග කොමසාරිස් විසින්, 1965 ඔක්තෝබර් 16 වන දින සිට කොළඹ දී පවත්වනු ලැබේ.

2. **වැටුප්.**—සමර්ථ වන අයදුම්කරුවෝ වර්ෂයකට රුපියල් 1,620 න් පටන් ගෙන අවුරුද්දකට රුපියල් 120 බැගින් වූ වැඩිවීම් වලින් රු. 3,780 තෙක් නගින වැටුප් ක්‍රමය පිට භාෂා පරිවර්තක සේවයේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබෙති.

3. **සේවා කොන්දේසි.**—1. මේ විභාගයෙන් සමර්ථ වන පුරුෂ පක්ෂයේ අපේක්ෂකයෝ පත්වීමේ දින සිට තුන් අවුරුදු කාල පරිච්ඡේදයක ආධුනිකත්වය පිට පත් කරනු ලැබෙති. ඔවුන්ගේ තනතුරුවලට විශ්‍රාම වැටුප් හිමිවේ.

(ii) මේ විභාගයෙන් සමර්ථවන අපේක්ෂිකාවන් මූල් අවස්ථාවේදී පත්කරනු ලබන්නේ පත්වීමේ දින සිට තුන් අවුරුදු කාල පරිච්ඡේදයක පරීක්ෂාවකට යටත් කොට ය. මේ කාලපරිච්ඡේදය තුළ මොවුන් විසින් අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය. දශ වර්ෂයක සේවය සම්පූර්ණ කිරීමට පෙර, ඕනෑ ම විටක දී මොවුන්ට විශ්‍රාම වැටුප් හිමි කාර්ය මණ්ඩලයට ඇතුළු වීමට කැමැත්ත ප්‍රකාශ කිරීමට හිමිකම ඇත්තේ ය. මෙසේ සිය කැමැත්ත ප්‍රකාශ කොළොත්, එය පසුව අස් කරගත නො හැකි ය. පරීක්ෂණ කාලය තුළ දී මෙසේ කැමැත්ත ප්‍රකාශ කරන අපේක්ෂිකාවෝ ඉන්පසු ආධුනිකත්වයෙහි තබනු ලැබෙති. මේ ආධුනිකත්ව කාලපරිච්ඡේදය ඔවුන්ගේ පරීක්ෂණ කාලපරිච්ඡේදය වන තුන් අවුරුද්දෙන් ඉතිරිවී තිබෙන කොටස ය.

(iii) ඔවුහු තැන් තැන් වලට මාරු කරනු ලැබීමට ද, ලංකාවේ ඕනෑ ම ස්ථානයකට පත් කොට යවනු ලැබීමට ද යටත් වෙති.

(iv) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" සංඛ්‍යාවෙහි ලා සලකනු ලබන සමර්ථ වූ අපේක්ෂකයෝ 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ ප්‍රතිපාදනයන්ට ද, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහා දැනට පවතින හෝ මතුවට පැණවෙන, නීතිරීති සහ ව්‍යවස්ථා වලට ද, අනුකූල විය යුතු ය.

දෙමළ භාෂා පරිවර්තකයන් වශයෙන් පත් කරනු ලැබීම පිණිස තෝරා ගනු ලබන අපේක්ෂකයෝ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සඳහා නව ප්‍රවේශකයෝ වෙත් නම්, ඔවුන් විසින් ස්වකීය ආධුනික/පරීක්ෂණාත්මක කාල පරිච්ඡේදය තුළ දී රාජ්‍ය භාෂාව වූ සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබා ගත යුතු ය. එම ආධුනික/පරීක්ෂණාත්මක කාලපරිච්ඡේදය අවසාන වීමේ දී මේ අපේක්ෂකයන්ගේ පත් වීම ස්ථිර කරනු ලබන්නේ, ඔවුන්ගේ වැඩ මෙන් ම, හැසිරීමත් සතුටුදායක වී පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සිංහල ප්‍රවීණතා පරීක්ෂණයෙන් සමත් වූ විට ය.

(v) දීමනා සහ වෙනත් සේවා කොන්දේසි සම්බන්ධයෙන් මේ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ පළ වී ඇති, රාජ්‍ය සේවා තනතුරුවලට කෙරෙන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලනු මැනවි.

4. **සුදුසුකම්.**—මේ විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයන්—

(i) යහපත් චරිතයෙන් යුක්ත විය යුතු ය;

(ii) ලාංකිකයන්* විය යුතු ය.

(iii) යටත් පිරිසෙයින්,

(1) සිංහල හෝ දෙමළ භාෂා විෂයයෙහි ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පොදු සහතිකය (උසස් තත්ත්වය) හෝ,

(2) සිංහල හෝ දෙමළ ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය හෝ,

(3) සිංහල හෝ දෙමළ හෝ විෂයයක් වශයෙන් ඇති (විශේෂ සිංහල හෝ දෙමළ නොවේ.) උසස් පාඨශාලා සහතිකය හෝ,

(4) සිංහල හෝ දෙමළ හෝ විෂයයක් වශයෙන් ඇති ව, ලන්ඩන් විශ්ව විද්‍යාලයේ කලා අංශයේ මධ්‍යම සහතිකය හෝ ලංකා විශ්වවිද්‍යාලයේ පොදු කලා විභාගයට සුදුසුකම් ලැබීමේ (ප්‍රථම) විභාග සහතිකය හෝ,

(5) භාණ්ඩාගාරයෙන් පැවැත්වෙන සිංහල හෝ දෙමළ පිළිබඳ ප්‍රවීණතා විභාගයේ (උසස් තත්ත්වය) සිංහල හෝ දෙමළ භාෂා විෂයෙන් සාමාර්ථයක්

යන ප්‍රධාන සුදුසුකම් වලින් එකක් හා යටත්පිරිසෙයින් පහත සඳහන් අතිරේක සුදුසුකම් වලින් එකක් ද ලබා තිබිය යුතු ය.

(අ) ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමර්ථයක් සහිත ජූලි, 1957 දී හෝ, ඉන් පෙර හෝ ප්‍රදානය කරන ලද ඉංග්‍රීසි භාෂාමය පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය, හෝ, ඕනෑම අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයක දී ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් සම්මාන සාමාර්ථයක් ඇති ව පාඨශාලා ජ්‍යෙෂ්ඨ සහතිකය, හෝ, ඉංග්‍රීසි භාෂාවෙන් මේවාට සමාන හෝ උසස් හෝ තත්ත්වයක් ඇති ව අන්‍ය විභාගයකින් සාමාර්ථ ය.

(ආ) ඉංග්‍රීසි භාෂාව "ඒ" නිර්දේශයෙන් හෝ ඉංග්‍රීසි සාහිත්‍යයෙන් හෝ සම්මාන සාමාර්ථය සහිත, විෂයයන් හයකින් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී ලබන ලද අධ්‍යයන පොදු සහතික ය (සාමාන්‍ය).

---

*රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහා ම "ලාංකික" යන පදයෙන් අදහස් කෙරෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන් ය.

**සංලක්ෂ්‍යය.**—යම් යම් අපේක්ෂකයන් ඉහත සඳහන් විභාගවලින් යම්කිසිවකට පෙනී සිටි නමුත්, මෙම විභාගය සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයට පෙර තමා පෙනී සිටි එම විභාගයේ ප්‍රතිඵල නිකුත් වී නැත් නම් එවැනි අපේක්ෂකයන් එවන ඉල්ලුම් පත්‍ර භාර ගනු නොලැබේ.

(iv) 1965 ඔක්තෝබර් මස 1 වැනි දිනට වයස අවුරුදු 19 ට නො අඩු හෝ 25 ට නොවැඩි හෝ අය විය යුතු ය.

5. **සුදුසුකම්.—වියදම් අඩු කිරීමේ පියවරක් වශයෙන් ඒකාබද්ධ රාජ්‍යයට අයත් ලංකාවේ සේවා කණ්ඩායම් වලින් අස් කරන ලද සිවිල් අංශයේ සේවකයන්ට ද, යුද්ධ හමුදාවේ සේවා මුක්ත භටයන්ට ද, දෙන විශේෂ සහන :—**

(i) වර්ෂ 1956 ජූලි 6 වන දින හෝ, ඉන්පසු ව හෝ අස් කරනු ලැබූ, නැතහොත් කඳවුරු ආපසු ගැනීමට ආණ්ඩුව කළ තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් අස් කිරීමට නියමව සිටින ඒකාබද්ධ රාජ්‍ය සතු ලංකාවේ සේවා කණ්ඩායම්වලට අයත් සිවිල් අංශයේ ලාංකික සේවකයෝ ද, නාරාහේන්පිට රාජකීය නාවික ගුවන් විදුලි ස්ථානය (ඇන්ඩර්සන් ස්ථානය) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පෙරිය කරච්චියට ගෙන යාමට ආණ්ඩුව විසින් කරන ලද තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් 1954 සැප්තැම්බර් 27 වැනි දිනට පසු ව එම ගුවන් විදුලි ස්ථානයෙන් අස් කරනු ලැබූ සේවකයෝ ද, අනික් සියළුම සුදුසුකම් ඇති ව සිටිත් නම්, පහත සඳහන් සහනය ලැබීමට සුදුස්සෝ වන්නා හ.

ඔවුන් ඒකාබද්ධ රාජ්‍යයේ සේවා කණ්ඩායම් යටතේ අඛණ්ඩව ද, සතුටුදායක ලෙසට සේවය කොට ඇත් නම්, 4 (iv) වන ඡේදයේ නියම කර ඇති වයස් සීමා සඳහා වයස ගණන් බැලීමේ දී ස්වකීය සේවා කාලය වයසින් අඩු කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ.

(ii) යුද්ධ හමුදාවේ සේවා මුක්ත භටයෝ පහත සඳහන් සහනය ලැබීමට සුදුස්සෝ වන්නා හ :

යුද්ධ හමුදාවේ සේවා මුක්ත භටයන්ට එනම් ස්ථිර හමුදාවේ සේවය කිරීමෙන් පසුව උප සේවයට මාරු කරනු ලැබූ යුද්ධ හමුදාවේ අයට හෝ අවඥා සහගත ලෙස සේවයෙන් නෙරපන ලද්දා වූ ද, සේවයෙන් නිදහස් කරන ලද්දාවූ ද, එසේ ම යම් අන්දමක විෂමාචාරයක් නිසා සේවයෙන් අස් වන්ට සිදු වූ ද අය හැර යුද්ධ හමුදාවෙන් අස්ව සිටින අනෙක් නිලධාරීන්ට හා භටයන්ට 4 (iv) වැනි ඡේදයේ නියම කරන ලද වයස් සීමාව සඳහා වයස ගණන් බැලීමේ දී, තමන් ස්ථිර හමුදාවේ සිටි සේවා කාලය, තම වයසින් අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.

6. **වියදම් අඩු කිරීමේ පියවරක් වශයෙන් සේවයෙන් අස්කරන ලද, ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ සහනය.**—ස්ථිර හෝ තාවකාලික හෝ තත්ත්වයෙන් ආණ්ඩුව යටතේ සේවය කර ඇත්තාවූ ද වැඩ හෝ හැසිරීම අසතුටුදායක වීම හැර, අන්කිසි හේතුවක් නිසා සේවය නවත්වනු ලැබූවාවූ ද අය පහත දැක්වෙන සහනය ලැබීමට සුදුස්සෝ වෙති :

සේවයෙන් පහ කරනු ලැබීම නිසා හෝ වැඩ අසතුටුදායක වීම නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ අවසන් කරන ලද සේවා කාල හැර, ආණ්ඩුව යටතේ සේවය කළ සෙසු කාල සීමාවන්, 4(iv) වන ඡේදයේ නියම කරන ලද වයස් සීමාව සඳහා වයස ගණන් බැලීමේ දී තම වයසින් අඩු කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ.

7. **සුදුසුකම්—ආණ්ඩුවේ සේවකයන්ට දෙන විශේෂ සහන : ස්ථිර සේවකයෝ.**—1965 අගෝස්තු 16 වැනි දිනයට ආණ්ඩුවෙහි සේවයෙහි ස්ථිර තනතුරු දරණ අයට පහත සඳහන් සුදුසුකම් තිබේ නම්, මේ විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) මෙහි 4(iii) වන ඡේදයෙහි දක්වන ලද අධ්‍යාපනික සුදුසුකම් තිබීම ;

(ආ) 1965 ඔක්තෝබර් 1 දිනට වයස අවුරුදු 45 ට අඩුවීම ; හා

(ඇ) ඔවුන්ගේ සේවය සතුටුදායක බව දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් සහතික කර තිබීම සහ භාෂා පරිවර්තක සේවයට පත් කිරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඔවුන් නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානයන් සූදානම්ව සිටීම.

**සංලක්ෂ්‍යය.**—1956 සැප්තැම්බර් මස 24 වන දිනට කලින් පත් වූද, මෙම විභාගයෙන් සමර්ථ වන්නාවූ ද පූර්වෝක්ත ගණයට අයත් නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාල කාර්යයන් සම්බන්ධයෙන් "ආදී ප්‍රවේශකයන්" සංඛ්‍යාවෙහි ලා සලකනු ලැබේ.

(ii) **තාවකාලික සේවකයෝ.**—ආණ්ඩුවේ සේවයෙහි තාවකාලික තනතුරු දරණ අයට පහත සඳහන් සුදුසුකම් තිබේ නම්, මේ විභාගයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(අ) මෙහි 4(iii) වන ඡේදයේ අධ්‍යාපනික සුදුසුකම් තිබීම ;

(ආ) 1965 ඔක්තෝබර් මස 1 වන දිනට වයස අවුරුදු 45 ට අඩු වීම ; හා

(ඇ) 1965 අගෝස්තු 16 වන දිනට ආණ්ඩුව යටතේ යටත් පිරිසෙයින් එක් අවුරුද්දක්වත් අවිච්ඡින්න සේවයක් කර තිබීම සහ ඔවුන්ගේ සේවය සතුටුදායක බව දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් සහතික කර තිබීම.

8. **ඉල්ලුම් පත්‍ර.**—(i) ඉංග්‍රීසි ගැසට් නිවේදනය සමග පළකර ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රයේ සඳහන් අන්දමට ඉල්ලුම් පත් සකස් කර ගත යුතුය.

(ii) ඉල්ලුම් පත්‍ර 1965 සැප්තැම්බර් මස 1 වන දිනට හෝ ඊට පළමු හෝ කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස්ට ලැබෙන පරිද්දෙන් රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුය.

එදින පසු වී ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලියා තිබිය යුතුය.

(iii) නිසි පරිදි අවලංගු කරන ලද රුපියල් 20 (විස්සක) මුද්දර ඉල්ලුම් පත්‍රයට ගසා තිබිය යුතුය.

(iv) දැනට ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්ත අපේක්ෂකයන් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගින් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. 6 වන ඡේදය යටතේ සුදුසුකම් ඉදිරිපත් කරන අපේක්ෂකයන් තම තමන් අන්තිමට සේවය කළ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මගින් තම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. යම්කිසි අපේක්ෂකයෙක් එසේ කිරීමට අපොහොසත් වේ නම් ඔහු නුසුදුසු බවට පත් වූවකු ලෙස සලකනු ලැබේ. 1965 සැප්තැම්බර් මස 1 වන දිනට හෝ ඊට කලින් හෝ විභාග කොමසාරිස්ට ලැබෙන පරිද්දෙන් තම ඉල්ලුම් පත්‍ර යවන ලෙස ඉල්ලා, කල් ඇතිව දෙපාර්තමේන්තු ප්‍රධානයන්ට එම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන මෙන් අපේක්ෂකයන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

9. **විභාගයට ඇතුලත් වීම.**—(i) ඉල්ලුම් පත්‍ර එවා ඇති සියලුම අපේක්ෂකයන් වෙත විභාග කොමසාරිස් විසින් ඇතුළුවීමේ පත්‍රිකා නිකුත් කරනු ඇත. විභාගයට ඉදිරිපත් වන අපේක්ෂකයන් විසින් තම ඇතුළුවීමේ පත්‍රිකා විභාගය පරිපාලනය කිරීම සඳහා පත් කර ඇති නිලධාරියාට ඉදිරිපත් කළ යුතුය. එම පත්‍රිකාව ඉදිරිපත් නො කරන අපේක්ෂකයකු වෙතොත් ඔහු විභාගයට බාර ගනු නො ලැබේ.

අපේක්ෂකයන් විභාගය සඳහා පෙනී සිටිය යුත්තේ තමන්ට නියමිත විභාග ශාලාවේය. විභාගය සඳහා තමාට නියමිත ශාලාවේ හැර අන් ශාලාවක පෙනී සිටින අපේක්ෂකයෙකු වෙතොත් ඔහු විභාගයට භාර ගනු නො ලැබේ.

ඇතුළුවීමේ පත්‍රිකාව සමග කාල සටහනේ පිටපතක් ද එවනු ලැබේ. විභාගයට ඉදිරිපත් වන හැම අපේක්ෂකයෙකුම විභාග දිනයෙහි තම ඇතුළුවීමෙහි පත්‍රිකාව පරිපාලක හට බාර දිය යුතුය.

අපේක්ෂකයන් සඳහා වූ නියෝග මෙම නිවේදනයේ අග වෙනම මුද්‍රණය කර ඇත. අපේක්ෂකයෝ මේ නියෝග වලින් බැඳෙනු ලැබෙත්.

විභාග දිනයට යටත් පිරිසෙයින් දින 7 ට වත් කලින් තම ඇතුලුවීමේ පත්‍රිකාව අපේක්ෂකයෙකුට නො ලැබුනහොත්, එය නො ලැබුන බව ද, පහත දැක්වෙන තොරතුරු ද, සඳහන් කොට, කොළඹ 2, තැ. පෙ. 1503, කොම්පඤ්ඤ වීදියේ, මැලේ වීදියෙහි, විභාග කොමසාරිස්ට (විදුලි පණිවුඩ ලිපිනය "විභාග" කොළඹ) අප්‍රමාදව දැනුම් දිය යුතුය. :—

(1) විභාගයේ නම ;

(2) සම්පූර්ණ නම ;

(3) සම්පූර්ණ තැපැල් ලිපිනය ; සහ

(4) තැපැල් කන්තෝරුව, රෙජිස්ටරය කිරීමේ අංකය හා තැපැල් කළ දිනය.

(ii) **විභාගයට ඇතුළත් කර ගැනීම සුදුසුකම් පිළිගැනීමක් නොවේ.** එසේ වුව ද, විභාග කොමසාරිස්ට සිය අභිමතය පරිදි, අපේක්ෂකයෙකු තාවකාලික ව විභාගයට ඇතුළු කර ගන්ට පුළුවන. එබඳු අපේක්ෂත්ව පසුව ස්ථිර කරනු හෝ අවලංගු කරනු ඇත.

10. **හඳුනා ගැනීමේ පත්‍ර.**—තමන් විභාගයට ගන්නා එක් එක් විෂයයක් සම්බන්ධයෙන් පරිපාලකයන් සෑහීමට පත් වන පරිද්දෙන් අපේක්ෂකයන් විසින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන වලින් **කුමක් වුව ද පිළිගනු ලැබේ. :—**

(අ) පෝස්ට්මාස්ටර් විසින් නිකුත් කරන ලද හඳුනාගැනීමේ පත්‍රය ;

(ආ) මෙම විභාග දිනයට අවුරුදු තුනකට නොවැඩි කාලයකට මෙ පිට දී නිකුත් කරන ලද වලංගු ගමන් බලපත්‍රයක් ;

(ඇ) මෙම විභාග දිනයට අවුරුදු තුනකට නො වැඩි කාලයකට මෙ පිට දී අයිතිකරුගේ ඡායාරූපයක් සහිත ව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක බලය පිට නිකුත් කරන ලද ඕනෑම සහතික පත්‍රයක්, බලපත්‍රයක් හෝ අන් කිසි ලේඛනයක්.

ඇතුළත් වීමේ පත්‍රිකාවට අතිරේක ව ඉහත කී ලේඛන වලින් එකක් සෑම අපේක්ෂකයෙකුට ම තිබිය යුතු යි. එසේ නොමැති කිසිම අපේක්ෂකයෙක් විභාගයට ඇතුළු කරගනු නො ලැබේ.

11. **සුදුසුකම් පිළිබඳ ලියවිලි.**—(i) **ඉල්ලුම් පත්‍රය සමග කිසිම ලියවිල්ලක් ඉදිරිපත් නොකළ යුතු ය.** එහෙත් අවශ්‍ය විස්තර සියල්ලක් ම නියමිත පරිදි පෝරමයේ ම ඇතුළත් කළ යුතුයි. මේ හැම අතින් ම සම්පූර්ණ නො වූ ඉල්ලුම් පත්‍රයක් වෙතොත් එය එහි ඇති සුදුසුකම් අනුව ම සලකා බලන අතර ප්‍රතික්ෂෙප කරන්ට ද ඉඩ ලැබේ.

(ii) සුදුසුකම් ලත් අපේක්ෂකයන් විසින් තම සුදුසුකම් ස්ඵුට කරනු පිණිස ලේඛනගත සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. **වාචක පරීක්ෂණයක්** වෙතොත් එහි දී එබඳු අපේක්ෂකයන් **විසින්** මෙම ලේඛන ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් විභාග කොමසාරිස් විසින් ඉල්ලා එවූ කල්හි අප්‍රමාද ව ලියා පදිංචි කළ තැපෑලෙන් ඒවා එවිය යුතු ය.

(iii) පහත සඳහන් ලේඛන අවශ්‍ය වන්නේ ය :—

(අ) යහපත් චරිතයක් ඇත්තෙකු බවට වගකිව යුතු තැනැත්තෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා ආණ්ඩුවේ හෝ උපකෘත හෝ පාඨශාලාවක අධ්‍යාපනය ලබමින් හෝ ආණ්ඩුවේ හෝ උපකෘත පාඨශාලාවකින් ළඟ දී අස්වී හෝ සිටි නම්, චරිත සහතිකය ලබා ගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය වරයාගෙනි ; නො එසේ නම් සමාදාන විනිශ්චයකාර, අද්වකාත්, පෙරකදෝරු හෝ නොතාරිස්, ප්‍රාදේශීය ආදායම් නිලධාරි යන මේ අයකුගෙනි. නැත හොත් රු. 2,400 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන ස්ථිර සේවයේ නියුක්ත ආණ්ඩුවේ නිලධාරියකුගෙන් ය. සාමාන්‍යයෙන් කියතොත්, පහසුවෙන් තොරතුරු විමසිය හැකි කිසියම් ප්‍රකට පුද්ගලයෙකු ගෙන් මෙය ලබාගත හැකි ය. එම තැනැත්තාගේ නම, තනතුර හා ලිපිනය සහතිකයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.

ආණ්ඩුවේ ස්ථිර සේවයේ නියුක්ත අපේක්ෂකයන් යහපත් චරිතයක් ඇති බවට සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නො වේ.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියා පදිංචි කළ සටහනේ සහතික කළ පිටපතක් හෝ (උප්පැන්නය ලියා පදිංචි නො කළ අපේක්ෂකයන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

**සංලක්ෂ්‍යය :**

(i) පාඨශාලා හෝ අධ්‍යාපන කටයුතු හෝ සඳහා නිකුත් කරනු ලබන විශේෂ උප්පැන්න සහතික පත්‍රය හෝ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනේ සහතික කළ **උධෘතයක්** හෝ, පිළිගනු නො ලැබේ.

(ii) දිව්රුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික පත්‍ර හෝ උප්පැන්න සහතික පත්‍ර වෙනුවට භාර ගනු නො ලැබේ.

(iii) උප්පැන්න සහතික පත්‍රයේ දැක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන්නාවූ ද, විභාගයට ඉදිරිපත් වීම සඳහා පැව්ච්චි කරන්නාවූ ද නමට/නම්වලට වෙනස් වෙතොත් 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පණතේ 27 වන හෝ 28 වන වගන්ති දෙකෙන් කාරණයට ගැලපෙන වගන්තියට අනුව උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනේ නම වෙනස් කරවා ගැනීමට වහාම ක්‍රියා කළ යුතු ය.

1953 අංක 15 දරණ උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ (සංශෝධන) පනතේ, දෙවන වගන්තියෙන් සංශෝධනය කරන ලද 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පනතේ 24 (6) වන වගන්තිය යටතේ, උපන් දිනයට අවුරුද්දකට වඩා පසු වී ලේඛනගත කරන ලද උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහනක සහතික කළ පිටපතක් පත්කිරීම් පිළිබඳ කටයුතු සඳහා භාර ගනු ලබන්නේ උපන් දිනය තහවුරු කර ගැනීමට අදාල වූ සාක්ෂ්‍ය ගැන සලකා බැලීමෙන් පසුව පමණකි.

ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන්නා වූ ද, 1957 අගෝස්තු මස 18 වන දිනය හා 394 වන අංකය දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධාන අනුව තම නම් වෙනස් කර ඇත්තාවූ ද, අපේක්ෂකයන් විසින් උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම අනවශ්‍ය ය.

(ඇ) ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියා පදිංචි කිරීමේ සහතිකය හෝ (අවස්ථාවට ගැලපෙන පරිදි) පාරම්පරික පුරවැසි භාවය සඳහා කළ ඉල්ලීම පිළිගත් බව දක්වන රාජකාරී ලියුමේ මුල් පිටපත.

(ඈ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය.

(ඉ) ඒකාබද්ධ රාජ්‍යයට අයත් ලංකාවේ සේවා කණ්ඩායම්වල සිවිල් අංශයේ සේවය කළ බැව් දක්වන සහතිකයේ හෝ යුද්ධ හමුදාවේ කරන ලද සේවය පිළිබඳ සහතිකයේ හෝ මුල් පිටපත. (මෙය පස් වන ඡේදයේ සඳහන් අපේක්ෂකයන් සම්බන්ධයෙනි.)

(ඊ) ආණ්ඩුව යටතේ කරන ලද සේවය පිළිබඳ සහතිකයේ මුල් පිටපත (6 වන ඡේදයේ සඳහන් අපේක්ෂකයන් සම්බන්ධයෙනි).

(උ) හඳුනාගැනීමේ පත්‍රය (**වාචක පරීක්ෂණයක්** වෙතොත් එහි දී පමණක් ඉදිරිපත් කළ යුතුය.)

(iv) ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවෙහි ම වුවමනා සියළු ලියවිලි සූදානම් කොට තබා ගන්නා මෙන් අපේක්ෂකයන්ට අවවාද කරනු ලැබේ. **වාචක පරීක්ෂණයක්** පැවැත්වුවහොත් එහිදී අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන, නැතහොත් විභාග කොමසාරිස් ඉල්ලා එවූ විට ඒවා ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍ර අවලංගු කරනු ලැබේ.

12. **අසත්‍ය විස්තර සැපයීම ගැන දඬුවම්.**—මෙම විභාගයේ රෙගුලාසි අනුව, කිසියම් අපේක්ෂකයෙකු නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව, හෝ විභාග කාලය තුළ දී හෝ ඉන් පසු ව කුමන අවස්ථාවකදී හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

අපේක්ෂකයෙකු විසින් සපයන ලද විස්තර වලින් යම්කිසිවක් ඔහුගේ දැනීම පරිදි අසත්‍ය බව පෙනී ගියහොත්, නැතහොත් ඔහු කිසියම් වැදගත් කරුණක් ඕනෑකමින් ම යටපත් කර තිබුණ හොත්, එසේ ද නැතහොත් ඔහු මෙම විභාගයට ඉදිරිපත් වීමට නුසුදුස්සකු බව ඔහුගේ සේවා කාලය ඇතුළත කුමන අවස්ථාවක දී හෝ ප්‍රත්‍යක්ෂ වුවහොත් ඔහු වහා ම සේවයෙන් පහ කිරීමට ඉඩ තිබේ.

13. **ආපසු ගෙවීම.**—කිසිම අවස්ථාවක දී ආපසු ගෙවීමක් නො කරනු ලැබේ.

මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තු අන් කිසි විභාගයක් සඳහා මාරු කිරීමට නුපුළුවන.

14. **ආණ්ඩුවේ නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—විභාග කොමසාරිස් අනුමත කළ ඉල්ලුම් පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු දෙන ලෙස ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට නියම කරනු ලැබේ.

15. **විභාග පරිපාටිය.**—විභාගය කොටස් දෙකකින් යුක්ත ය. (1) වන කොටස ලිඛිත පරීක්ෂණයකි. (2) වන කොටස **වාචක පරීක්ෂණයකි.**

විභාග විෂයයන් හා එක් එක් විෂයයකට නියමිත ලකුණු ද පහත සඳහන් වේ.

ලිඛිත පරීක්ෂණයේ දී නරක අත් අකුරු හා අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් සෑම උත්තර පත්‍රයකින් ම ලකුණු අඩු කරනු ලැබේ. නො පැහැදිලි අත් අකුරු ඇති අපේක්ෂකයන් නුසුදුස්සන් ලෙස සැලකීමට ඉඩ තිබේ.

**1 වන කොටස (ලිඛිත)**

විභාගයේ මේ කොටස, එකක් පැය තුන බැගින් වූ ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

**1 වැනි පත්‍රය.**—සිංහලෙන්/දෙමළෙන් ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම :

| | ලකුණු |
|---|---|
| (i) සාහිත්‍ය පාඨයක්, | |
| (ii) සාමාන්‍ය පාඨයක්, | |
| (iii) (අ) කාර්යාලීය ලිපියකින් හෝ වාර්තාවකින් | |
| සහ | |
| (ආ) ප්‍රවෘත්ති පත්‍ර ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටස් ... ... | 100 |

ඉල්ලුම්කරුවන්ට යටත් පිරිසෙයින් (වීජ ගණිතය හා ජ්‍යාමිතිය අඩංගු) (Mathematics) ගණිත විෂයයෙන් ලද සාමාර්ථයක් ද සහිතව ලංකාවේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පරීක්ෂණයෙන් නැතහොත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ (වීජ ගණිතය හා ජ්‍යාමිතිය අඩංගු) (Mathematics) ගණිතය, සිංහල/දෙමළ භාෂාව සහ වෙනත් විෂයයන් හතරකින් දෙවාරයකට නො වැඩිව සාමාර්ථය ලත් බවට සහතික තිබිය යුතුයි.

(ආ) **ජාය සිතියම් ශිල්පී ශිෂ්‍යයන්.**—අපේක්ෂකයන්ගේ වයස විභාගය ආරම්භ වන දිනට අවුරුදු 17 ට නො අඩුවත්, අවුරුදු 20 ට නොවැඩිවත් තිබිය යුතුය.

අපේක්ෂකයින්ට යටත් පිරිසෙයින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සංනිකය හෝ ලංකාවේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල/දෙමළ භාෂාව, අංක ගණිතය/ගණිතය ඇතුලුව විෂයයන් හයකින් දෙවාරයකට නොවැඩි වාර ගණනකදී සාමාර්ථය ලත් බවට සහතික තිබිය යුතුය.

ඔවුන්, භෞතික විද්‍යාව, උසස් ගණිතය සහ ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන විටදී, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඒ සමාන වෙනත් විභාගයකින් හෝ සිංහල භාෂා විෂයයෙන් නැතහොත්, ඊට සමාන වෙනත් විෂයයකින් සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

(1961 ජනවාරි 1 වැනි දිනට පෙර දිනක සිට රජයේ සේවයේ නියුක්තව සිට රජයේ සේවයේ වෙනත් තනතුරු වලට පත්වීමට අපේක්ෂා කරන නිලධාරීන්ට මෙම අවශ්‍යතාව අදාළ නොවනු ඇත.)

**3. සුදුසුකාවය පිළිබඳ ලියකියවිලි :**

පහත සඳහන් ලියවිලි (පිටපත් නොවේ) අයදුම් පත් වලට අමුණා එවිය යුතුය :—

(අ) ඉල්ලුම්කරුගේ යහපත් චරිතය පිළිබඳ ව වග කිව යුතු පුද්ගලයකු විසින් අත්සන් තබන ලද චරිත සහතිකයක්.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා අධ්‍යාපනය ලැබුවේ ආණ්ඩුවේ පාඨශාලාවක හෝ ආධාර ලබන පාඨශාලාවක හෝ නම් චරිත සහතිකය ලබාගත යුත්තේ තමා අන්තිමට උගත් ආණ්ඩුවේ පාඨශාලාවේ හෝ ආධාර ලබන පාඨශාලාවේ හෝ ප්‍රධානාචාර්යවරයාගෙනි. නො එසේ වන කල්හි එම සහතිකය සමාදාන විනිශ්චයකාරයෙක්, අද්වකාත් කෙනෙක්, පෙරකදෝරු කෙනෙක් හෝ නොතාරිස් කෙනෙක්, ප්‍රාදේශීය ආදායම් නිලධාරියෙක් හෝ රුපියල් 2,400 ක් හෝ ඉන් වැඩි වාර්ෂික වැටුපක් හෝ ලබන ආණ්ඩුවේ ස්ථිර නිලධාරියෙක් හෝ, සාමාන්‍යයෙන් කෙළින්ම තොරතුරු ලබාගත හැකි ප්‍රකට තැනැත්තෙක් යන මොවුන්ගෙන් කවරකුගෙන් වුව ද ලබාගත හැක්වේ. සහතිකය දෙන තැනැත්තාගේ නම, පදවි නාමය සහ ලිපිනයද සහතිකයේ පැහැදිලිව සඳහන් විය යුතුය.

(ආ) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කරන ලද පිටපතක්.

**සංලක්ෂ්‍යය.**—(i) පාඨශාලීය හෝ අධ්‍යාපනික හෝ කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතිකය හෝ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙ.් උපුටා ගත් සහතික කළ ලුහුඬු පිටපතක් හෝ භාරගනු නො ලැබේ ;

(ii) උප්පැන්න සහතික වෙනුවට දිවුරුම් පත්‍ර හෝ බව්තීස්ම සහතික හෝ භාරගනු නො ලැබේ ;

(iii) උප්පැන්න සහතිකයෙහි දක්වෙන, නම/නම් හා ඉල්ලුම්කරු සාමාන්‍යයෙන් භාවිතා කරන, එසේ ම ඔහු පරීක්ෂණයේ දී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම්, යථායෝග්‍ය පරිදි, 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පනතෙහි අංක 27 නැතහොත් 28 දරණ වගන්ති නියමයන් අනුව උප්පැන්නයෙහි දැක්වෙන නම වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතුය. උපන් දින සිට අවුරුද්දකට වඩා කල් ගතවීමෙන් පසු 1953 අංක 15 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 2 වැනි වගන්තියෙන් සංශෝධිත වූ 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතෙහි 24(6) දරණ වගන්තිය යටතේ කරවන ලද උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතෙහි කරන ලද පිටපතක්, පත්වීම් දීම පිළිබඳ වූ කරුණු උදෙසා පිළිගනු ලබන්නේ, උපන් දිනය තහවුරු කෙරෙන සාක්ෂි ගැන සළකා බැලීමෙන් පසුව පමණි.

(ඇ) ලංකාවේ රටවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමි වූ රටවැසි බවක් ඇති සේ ආණ්ඩුව මගින් පිළිගත් බව දක්වෙන ලිපියේ මුල් පිටපත (අවස්ථෝචිත වන පරිදි) ;

(ඈ) **අධ්‍යපන සුදුසුකම් පිළිබඳ සහතිකය හෝ එසේ සහතිකයක්** නිකුත් කොට නැත්නම්, ඊට අදාළ වූ අන් කිසි රාජකාර්ය ලියවිල්ලක් (උදාහරණයක් වශයෙන් පෞද්ගලික අපේක්ෂකයන් වෙත නිකුත් කරන ලද ලංකා අධ්‍යයන පොදු සහතික (සාමාන්‍ය) විභාගයේ ප්‍රතිඵල පත්‍රිකාව හෝ අපේක්ෂකයාගේ පාඨශාලාවේ ප්‍රධානියාගෙන් ලබා ගත් ලිපියක්).

**4. විශේෂ අනුග්‍රහ :**

(අ) **ස්ථිර සේවකයෝ.**—1965 අගෝස්තු මස 14 වැනි දින මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවයෙහි නියුක්ත අයට, පහත සඳහන් අවශ්‍යතා තිබේ නම් පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(i) 2 වැනි ඡේදයේ නියමිත අධ්‍යාපන සුදුසුකම් තිබේ නම් ;

(ii) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩුනම් ;

(iii) ඔවුන්ගේ සේවය සතුටුදායක වූයේ නම්.

**සංලක්ෂ්‍යය.**—1956.9.24 වැනි දිනට පෙර පත්කරනු ලැබූ යථෝක්ත වර්ගයට ඇතුළත් අය පරීක්ෂණයෙන් සමර්ථ වුවහොත් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධ වූවත් "ආදී ප්‍රවේශකයන්" ලෙස සලකනු ලැබේ.

(ආ) 1965 සැප්තැම්බර් මස 1 වැනි දිනට යටත් පිරිසෙයින් අවුරුදු 4 ක් වත් ආණ්ඩුව යටතේ අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කළ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ස්ථිර තනතුරු දරන අයට, පහත සඳහන් අවශ්‍යතා තිබේ නම් පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(i) යටත් පිරිසෙයින් කේම්බ්‍රිජ් කණිෂ්ඨ විභාගයෙන් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාඨශාලා කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද පාසැලක කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ සමර්ථ වූවාහු නම් ; තවද

(ii) ඔවුන්ට 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු නම්.

**සංලක්ෂ්‍යය.**—(i)—ජාය සිතියම් ශිල්පී ශිෂ්‍යයන්ට මෙම අනුග්‍රහය අදාල නොවේ.

**සංලක්ෂ්‍යය.**—(2)—1956.9.24 වැනි දිනට පෙර පත් කරනු ලැබූ යථෝක්ත වර්ගයට ඇතුළත් අය පරීක්ෂණයෙන් සමර්ථ වුවහොත්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ඔවුන් "ආදී ප්‍රවේශකයන්" ලෙස සලකනු ලැබේ.

(ඇ) **තාවකාලික සේවකයෝ.**—මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තාවකාලික තනතුරු දරන අයට, පහත සඳහන් අවශ්‍යතා තිබේ නම්, පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ :—

(i) 2 වැනි ඡේදයේ නියමිත අධ්‍යාපන සුදුසුකම් තිබේ නම් ;

(ii) 1965 නොවැම්බර් මස 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු නම් ;

(iii) 1965 සැප්තැම්බර් මස 9 වැනි දිනට යටත් පිරිසෙයින් අවුරුද්දක් වත් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අඛණ්ඩව සේවය කර තිබේ නම්.

(ඈ) 1965 සැප්තැම්බර් මස 1 වැනි දිනට යටත් පිරිසෙයින් අවුරුදු 4 ක් වත් ආණ්ඩුව යටතේ අඛණ්ඩ සේවයක් සම්පූර්ණ කළ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ තාවකාලික තනතුරු දරන අයට, 4. (ආ) ඡේදයේ (i) හි සහ (ii) හි නියමිත සුදුසුකම් තිබේ නම් පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

**සංලක්ෂ්‍යය.**—ජාය සිතියම් ශිල්පී ශිෂ්‍යයන්ට මෙම අනුග්‍රහය අදාල නොවේ.

(ඉ) එක්සත් රාජධානිය මගින් ලංකාවේ පිහිටුවා ඇති එම සේවා වලින් මුදා හරින ලද සේවකයෝ :—

නාරාහේන්පිට (ඇන්ඩර්සන් ස්ථානය) රාජකීය නාවුක ගුවන් විදුලි පදනම් සථාන (Bases) හා සේවකයින් රජයට පවරා ගැනීමේ තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් 56.7.6 වැනි දින හෝ ඊට පසුව හෝ සේවයෙන් මුදා හරින ලද්දාවූද, මුදා හැරීමට නියම වී සිටින්නාවූ ද, මෙම ස්ථානය ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පෙරියකරච්චියට ඉවත් කිරීමට රජයෙන් ගන්නා ලද තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් 54.9.27 වැනි දිනට පසුව සේවයෙන් මුදාහරින ලද්දා වූද, ලංකාවේ පිහිටුවන ලද එක්සත් රාජධානි ආයතනවල සේවය කළ සේවා වසමට අයත් නුවූ ලාංකික සේවකයන් (Ceylonese Civilian Employees) හට පහත සඳහන් අනුග්‍රහ වලට අයිතිවාසිකම් තිබේ :—

(i) 2 වැනි ඡේදයේ නියමිත වයස සීමාව ගණන් බැලීමේ දී එක්සත් රාජධානිය යටතේ සේවය කළ කාලය තම වයසෙන් අඩු කිරීමට ඉඩදෙනු ලැබේ. එහෙත් එසේ ඉඩදෙනු ලබන්නේ එම සේවය අඛණ්ඩවත් සතුටුදායක ලෙසත් කර තිබුනොත් පමණි.

(ii) ලංකාවේ පිහිටි එක්සත් රාජධානි සේවා යටතේ 1965 සැප්තැම්බර් මස 1 වැනි දිනට හෝ ඉන් පෙර දිනයකට හෝ යටත් පිරිසෙයින් අවුරුදු 4 ක වත් අඛණ්ඩ වූ සතුටුදායක සේවයක් සම්පූර්ණ කළාවූ අයට, (2) වැනි ඡේදයේ නියමිත අධ්‍යාපන සුදුසුකම් නොමැති නම් 4(ආ) (i) ඡේදයේ

15. ඇතිව් තිබෙන පුරප්පාඩුවලට යටත්ව, තේරීම් මණ්ඩලය විසින් තෝරාගනු ලබන අපේක්ෂකයින් තම පුහුණුව ආරම්භ කිරීමට පෙරාතුව, තමන් අනුගමනය කිරීමට කැමති අභ්‍යාස පාඨමාලාව තෝරාගත යුතුය :—

එනම්, මිනින්දෝරු ශිෂ්‍යයන් සඳහා වූ පාඨමාලාව, ඡායා සිතියම් ශිල්පි ශිෂ්‍යයයින් සඳහා වූ පාඨමාලාව හෝ භූමිතික විද්‍යා ආයතන යෙහි බිම් මැනීම පිළිබඳ ඩිප්ලෝමා උපාධි පාඨමාලාව. එම් කැමැත්ත අවසාන තීරණය ලෙස සලකනු ලැබේ.

තමන්ට පැවරෙන රාජකාරි කටයුතු බාරගැනීමට සුදුසු ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත බවට නිශ්චය කිරීම සඳහා, තෝරාගනු ලැබූ අපේක්ෂකයින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් වෛද්‍ය පරීක්ෂණයකට භාජන කරනු ලැබේ. ඡායා සිතියම් ශිල්පී ශිෂ්‍යයින්ට මීට අතිරේකව, සම්පූර්ණ ත්‍රිමානෝක්ෂ දෘෂ්ටිය සහ සාමාන්‍ය වර්ණ දෘෂ්ටිය තිබේද යන්න දැනගැනීම සඳහා ද පරීක්ෂා කරනු ලැබේ. මෙම පරීක්ෂණය සඳහා රු. 5ක ගාස්තුවක් අය කරනු ලැබේ.

**16. මිනින්දෝරු ශිෂ්‍යයින්/ඡායා සිතියම් ශිල්පී ශිෂ්‍යයින් සඳහා වූ අභ්‍යාස විද්‍යාලයට ඇතුළත් කරගැනීමේ කොන්දේසි :**

(i) සෑම අපේක්ෂකයෙකුම, තමා පුහුණුව සඳහා තෝරාගැනීමෙන් පසු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව සමාප්තකොට, දෙවැනි ශ්‍රේණියේ මිනින්දෝරුවකු II වැනි ශ්‍රේණියේ ඡායා සිතියම් ශිල්පියකු වශයෙන් අවුරුදු තුනක් සේවය කිරීමට ද, පුහුණුවන කාලයේදී තමාගේ නොසැළකිල්ල නැතහොත් නොපරිස්සම්කම් නිසා නැතිවන හෝ හානි සිදුවන භාණ්ඩ හෝ උපකරණ සඳහා රජයට අය විය යුතු අලාභ ගෙවීමට ද, බැඳෙමින් රු. 6,000ක් වත්කම ඇති පිළිගත් ඇපකරුවකු ඇතිව ගිවිසුමකට හා බැඳුම්කරයකට ද ඇතුළත් විය යුතුය.

වත්කම ඇති ඇපකරුවන් ඉදිරිපත් කිරීමට නොහැකි අයට, පුහුණුව ලබන කාලයේදී මසකට රු. 40 බැගින් ද, ඊට පසු අවුරුදු තුනක් ගෙවෙන තෙක් මසකට රු. 80 බැගින් ද රජයට ඇප මුදල් බැඳීමට පෞද්ගලික බැඳුම්කරයකට ඇතුළත් වීමට ඉඩ දෙනු ලැබේ. මේ මුදල ඔවුන්ගේ පඩි සටහන්වලින් අඩු කරගෙන එය ඔවුන් විසින් කොන්දේසි ආදිය පැහැර නොහැරීමට ඇප වශයෙන් තබා ගනු ලැබේ. ගිවිසුමේ හා බැඳුම්කරයේ ඇතුළත් කරුණු හා කොන්දේසි යථා පරිදි ඉටු කළ කල්හි මේ මුදල් ඔවුන්ට ආපසු දෙනු ලැබේ ;

(ii) මේ ගිවිසුම හා බැඳුම්කරය අපේක්ෂකයා අභ්‍යාස විද්‍යාලයට ඇතුළත් වූ දින පටන් බලපැවැත්වේ ;

(iii) රාජ්‍ය භාෂා පනතේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(අ) ආධුනික කාලසීමාව අවුරුදු තුනක් විය යුතුය.

(ආ) ඔවුන් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවට නැගීම පිණිසද, සම්පාදිතව පවත්නා හෝ මින්මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ඇ) ආධුනික කාලසීමාව ඇතුළත ඔවුන් විසින් සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණත්වයක් ලබාගත යුතුය.

(ඈ) ආධුනික කාලසීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර නියමිත කාලසීමාවන් ඇතුළත දී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමද මත රඳා පවතිනු ඇත.

නියමිත කාල සීමා තුළදී මෙම ප්‍රවීණතා පරීක්ෂණ වලින් සමත්වීමට අපොහොසත්වීම වැටුප් වැඩිවීම් අත්හිටවනු ලැබීමට හේතුවනු ඇති අතර, නියමිත කාලසීමාව ඉක්මවා තවත් සමසක් ඇතුළත දී පරීක්ෂණයකින් සමත් නොවුවහොත්, එම "අත් හිටුවීම" "නතර කිරීමකට" පරිවර්තනය කර පරීක්ෂණය සමත්වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

තනතුරෙහි ස්ථිර කරනු ලැබූ දින සිට දෙවසරක් ඇතුළතදී ඔවුන් සිංහල භාෂා විෂයයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත්විය යුතුය. මෙම විභාගයෙන් සමත්වීමට අපෝහොසත්වීම වැටුප් වැඩිවීම පමා කරනු ලැබීමට හේතුවනු ඇත.

(ඉ) ආධුනික කාලසීමාව අවසානවීමට පෙර, සිංහල භාෂා විෂයයෙන් නියමිත තත්ත්වයේ ප්‍රවීණතාවයක් ලබා ගෙන නොතිබුණහොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසිවල විධිවිධාන බලපවත්වනු ඇත. (ඉහත දක්වෙන අංක (ඇ) සහ (ඉ) දරණ දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් බඳවාගනු ලබන්නට අදාළ වෙයි).

**17. මිනින්දෝරු ශිෂ්‍යයින්ට/ඡායා සිතියම් ශිල්පී ශිෂ්‍යයින්ට ගෙවීම :** අධ්‍යාපනය අතින් ශිෂ්‍යයින් දක්වන දියුණුව සතුටුදායක නම් පුහුණුව ලබන කාලයේදී ඔවුන්ට මසකට රු. 75 බැගින් දීමනාවක් ද ආණ්ඩුවේ ගෙවීම් ක්‍රමය අනුව ඊට සරිලන ජීවන වියදම් දීමනාව හා විශේෂ ජීවනාධාර දීමනාවද ගෙවනු ලැබේ.

**18. පත්වීම් :**

(i) II වැනි ශ්‍රේණියේ මිනින්දෝරුවන් හෝ II වැනි ශ්‍රේණියේ ඡායා සිතියම් ශිල්පීන් වශයෙන් රාජකාරී බාර ගැනීමට සුදුසු බවට වාර්තා කරනු ලැබූ වහාම මැනුම් ශිෂ්‍යයින්/ඡායා සිතියම් ශිල්පී ශිෂ්‍යයන්ට පත්වීම් ලැබෙනවා ඇත. පත්වීම් කරනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වන සේය. එම කාලසීමාව විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගනු ලැබේ. පුහුණුව ලබන කාලයද විශ්‍රාම වැටුප් පරමාර්ථයන් සඳහා ගණන් ගනු ලැබේ. එම කාලය ඇතුළත් යම් අවස්ථාවකදී ඔවුන්ගේ වැඩ අසතුටුදායක බව පෙනී ගියහොත් හෝ ඔවුන් විෂමාචාරය ගැන වරදකරුවන් බව ඔප්පු වුවහොත් හෝ සර්වේ ජනරාල් විසින් ඔවුන් සේවයෙන් පහ කරනු ඇත. එබඳු අවස්ථාවකදී ඔවුහු, සවකීය පුහුණුව සඳහා රජයෙන් වියදම් කරනු ලැබූ මුදලද ආපසු ගෙවිය යුත්තෝය.

(ii) මෙම පත්වීම් රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසි යන මේවාට සහ රජයේ කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හා රෙගුලාසිවලටද යටත් වන්නේය.

(iii) කලින් කළ සංශෝධනය වන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු හා රජයේ සෙසු රෙගුලාසි ද අනුව ගෙවල් කුලී දීමනාවලටද, නිවාඩු වලටද, ප්‍රසිද්ධ නිවාඩු දිනවලට ද ඔවුහු හිමි වෙති.

(iv) මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු රෙගුලාසි අනුව ගමන් වියදම් ද ගෙවනු ලැබේ.

(v) II වැනි ශ්‍රේණියේ මිනින්දෝරුවන් හෝ II වැනි ශ්‍රේණියේ ඡායා සිතියම් ශිල්පීන් වශයෙන් පත්කළ විට, ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඔවුන්ගේ වැටුපෙන් මාසයකට රු. 10 බැගින් අඩුකර ගැනීමට හැකිවන පරිදි, රු. 1,000ක ඇපයක් තැබීම අවශ්‍ය වනු ඇත.

**19. ජ්‍යෙෂ්ඨත්වය :**

එකම දින පත්කරන ලද මිනින්දෝරුවන් හෝ ඡායා සිතියම් ශිල්පීන් අතර ජ්‍යෙෂ්ඨත්වය තීරණය කරනු ලබන්නේ අභ්‍යාස විද්‍යාලයීය අවසාන විභාගයෙන් ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාවට ඔවුන් මුල් අවුරුදු තුනේ මිනින්දෝරුවන් හෝ ඡායා සිතියම් ශිල්පීන් වශයෙන් සේවය කළ කාලයේදී ලබාගත් සේවා ලකුණු ද එකතු කිරීමෙනි. එහෙත් එම තීරණය මෙම දැන්වීමේ (16) (iii) වැනි අනුඡේදයේ කොන්දේසිවලට යටත් වේ.

**20. වැටුප් හා උසස් කිරීමේ කොන්දේසි (1) (අ) මිනින්දෝරුවන් :**

II වැනි ශ්‍රේණිය.—රු. 1,620 වාර්ෂික වැටුපකින් ආරම්භ වී රු. 120 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 19කින් හා රු. 180 බැගින් වූ වැඩිවීම් 4කින් ද යුතුව රු. 4,620 දක්වා නගී. වාර්ෂික වැටුප රු. 2,820 හා රු. 3,900 ට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් තිබේ.

I වැනි ශ්‍රේණිය.—රු. 3,300 වාර්ෂික වැටුපකින් ආරම්භ වී රු. 120 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 5කින් හා රු. 180 බැගින් වැඩිවීම් 8කින්ද යුතුව රු. 5,340 දක්වා නගී. වාර්ෂික වැටුප රු. 4,080 වන්නට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉමක් තිබේ.

විශේෂ ශ්‍රේණිය.—වාර්ෂික වැටුප රු. 5,580න් ආරම්භ වී රු. 240 බැගින් වූ වාර්ෂික වැඩිවීම් 5කින් යුතුව රු. 6,780න් අවසන් වේ.

මිනින්දෝරුවකු (I) වැනි ශ්‍රේණියට උසස් කරනුයේ දෙපාර්තමේන්තු කණිෂ්ඨ විභාගයෙන් ලබන සාමාර්ථය අනුවය. (II) වැනි ශ්‍රේණියේ මිනින්දෝරුවකු වශයෙන් සේවයේ ස්ථිර කරනු ලැබීමෙන් පසු ඕනෑම විටක ඔහුට එම විභාගයට ඉදිරිපත් වීමට ඉඩ දෙනු ලැබේ. (I) වැනි ශ්‍රේණියට උසස් කිරීමට ඔහු රු. 2,820 පඩිය පිට අවුරුද්දක් සේවය කළ යුතුය. එසේම (I) වැනි ශ්‍රේණියේ පඩි ක්‍රමය අනුව රු. 4,620 වාර්ෂික පඩියට පැමිණෙන තෙක් විශේෂ ශ්‍රේණියට උසස් වීමට ඔහුට අයිතිවාසිකමක් නැත.

මිනින්දෝරුවකු දෙපාර්තමේන්තු ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වීමෙන් පසුව විශේෂ ශ්‍රේණියට හෝ සර්ව ප්‍රකාරයෙන් ද යෝග්‍ය නම් උප අධිකාරි ශ්‍රේණියට හෝ උසස් කිරීමට සුදුසුසේ සළකනු ලැබේ.

**(ආ) ඡායා සිතියම් ශිල්පීන් :**

**II වෙනි ශ්‍රේණිය.**—වර්ෂයකට රු. 1,620—120×19, 180×4—රු. 4,620 (රු. 2,820 ට සහ රු. 3,900 ට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම්).

**I වෙනි ශ්‍රේණිය.**—වර්ෂයකට රු. 3,300—120×5, 180×8—රු. 5,340 (රු. 4,080ට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම).

**විශේෂ ශ්‍රේණිය.**—වර්ෂයකට රු. 5,580—240—රු. 6,780.

**ප්‍රධාන ඡායා සිතියම් ශිල්පී.**—වර්ෂයකට රු. 5,150—360×9, 480 × 1—රු. 8,880.

පළමුවන ශ්‍රේණියට උසස් කිරීම රඳා පවතිනුයේ, සෑම නිලධාරියෙක් ම දෙවෙනි ශ්‍රේණියෙහි, රු. 2,820 වැටුප මත අවුරුද්දක් සේවය කිරීම හා දෙපාර්තමේන්තු දෙවන පරීක්ෂණයකින් සාමාර්ථය ලැබීම මතය. සෑම නිලධාරියෙක් ම දෙවැනි ශ්‍රේණියේ අවුරුදු 4ක සේවය කිරීමෙන් පසුව මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන්නේ ය. විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා තෝරා ගනු ලබන්නේ ඔවුන්ගේ වැටුප් පරිමාණයෙහි වර්ෂයකට රු. 4,620ක වැටුප් ස්ථානයකට ළඟාවී සිටින I වැනි ශ්‍රේණියේ නිලධාරීන්ගෙන්ය.

ප්‍රධාන ඡායා සිතියම් ශිල්පී තනතුරට පත් කරනු ලබන්නේ ඡායා සිතියම් ශිල්පී ශ්‍රේණියේ සිට (විශේෂ ශ්‍රේණිය) විශේෂ සුදුසුකම් මත උසස් කිරීමෙනි.

(ii) ඒ ඒ ශ්‍රේණිවලට උසස් කිරීමට ඉඩ ලැබෙන්නේ පුරප්පාඩු ඇති වන අන්දමිනි;

(iii) වැටුප් වැඩිවීම් ගෙවනු ලබන්නේ, නිලධාරියා තමාට භාර වූ රාජකාරිය නිසියාකාරව ඉටු කළ බවට සර්වේ ජනරාල්ට ඒත්තු ගියහොත් පමණකි.

### (ආ) භූමිතික විද්‍යා ආයතනය

21. බිම් මැනීම හා තලමිතිය වෘත්තියක් වශයෙන් කරගෙන යාමට කැමැත්ත ඇත්තාවූ, තෝරාගත් පෞද්ගලික අයදුම්කරුවන් සඳහා දියතලාවෙහි, ප්‍රධාන වශයෙන්, බිම් මැනීම හා භූමිතිය පිළිබඳ දෙවර්ෂයක පූර්ණකාල පාඨමාලාවක් ආයතනය විසින් පවත්වනු ලැබේ.

22. **යෝග්‍යතා :**

අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි. එනම්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවීමෙන් ලංකාවේ පුරවැසියන් වීම. ඔවුන් විභාගය ආරම්භ කෙරෙන දිනයට වයස අවුරුදු 19ට නොඅඩුවත්, අවුරුදු 25ට නොවැඩිවත් තිබිය යුතුයි.

ඔවුනට **යටත් පිරිසෙයින්** ගණිතය විෂයයෙන් සාමාර්ථය ඇතිව ලංකාවේ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පරීක්ෂණයෙන් නැතහොත් ලංකාවේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයේ දී ගණිතය, සිංහල/දෙමළ භාෂාව සහ වෙනත් විෂයයන් හතරකින් දෙවාරයකට නොවැඩි ව සාමාර්ථය ලත් බවට සහතික තිබිය යුතුය.

ඔවුන්, ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් සම්මාන සාමාර්ථ ලබා සිටිය යුතුය.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයා සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහල ජාතිකයෙක් නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික හෝ ඒ සමාන විභාගයක දී සිංහල භාෂාවෙන් හෝ සමාන භාෂාවකින් සාමාර්ථය ලබා සිටිය යුතුය.

23. **යෝග්‍යතා සහ අනුග්‍රහ පිළිබඳ ලියවිලි :**

අපේක්ෂකයන් ඉහත 3 වැනි ඡේදයෙහි දක්වෙන පරිදි ලියවිලි ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂකයින්ට, 4 (ඇ) සිට (ඉ) ඡේදය දක්වා ඇති අනුග්‍රහ පමණක් දෙනු ලැබේ.

24. **අයදුම්පත්.**—ඉහත 5 සිට 8 දක්වා ඇති ඡේදයන්ට අනුකූලව ඉදිරිපත් කළ යුතු අතර අනන්‍යතා පත් 9 වැනි ඡේදයෙහි දැක්වෙන පරිදි ඉදිරිපත් කළ යුතුය.

25. **අසත්‍ය තොරතුරු සැපයීමේ වරදට කෙරෙන දඬුවම් :**

(i) 10 (i) වැනි ඡේදයෙහි දැක්වෙන පරිදි;

(ii) 10 (iii) වැනි ඡේදයෙහි දැක්වෙන පරිදි;

(iii) අපේක්ෂකයෙකු විසින් දැන දැනම අසත්‍ය තොරතුරු සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත්, එසේ නැතහොත් ඔහු මෙම පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සෙකුව සිටි බැව්, ඔප්පු වුවහොත් හෝ සතුටුදායක ලෙස එම පාඨමාලාව සමාප්ත කරන එවැනි අපේක්ෂකයකුට නිකුත් කරනු ලබන ඩිප්ලෝමා සහතිකය අස් කරගනු ලැබේ.

26. **විභාගය සඳහා විෂයයන් සහ තේරීමේ ක්‍රමය :**

ඉහත 14 වැනි සහ 15 වැනි ඡේදයන්හි පරිදි වේ.

27. **ආයතනයට ඇතුළත්වීමේ කොන්දේසි :**

(i) පුහුණුව සඳහා තෝරාගැනීමෙන් පසු එක් එක් අපේක්ෂකයා විසින් පුහුණුවන කාලය තුළදී පුහුණුවන්නාගේ නොසැලකිල්ල නැතහොත් නොපරිස්සම්කම නිසා නැතිවන හෝ හානි සිදුවන භාණ්ඩ හෝ උපකරණ සඳහා වටිනාකම සහ පුහුණුවන්නා විසින් ගෙවිය යුතු අනිකුත් ගාස්තු ආණ්ඩුවට ගෙවීමට බැඳෙමින් රු. 1,500ක වත්කම් ඇති පිළිගත් ඇපකරුවකු ඇතිව ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(ii) පුහුණුව සඳහා ගාස්තුවක් අය නොකරන නමුත් ලිවීමේ හා සැලසුම් ඇඳීමේ උපකරණ පුහුණුවන්නා විසින් ම සපයා ගත යුතුය.

(iii) දියතලාවේ මිනින්දෝරු කඳවුරෙහිදී පුහුණුවන්නන්ට බඩු බාහිරාදිය රහිතව අවිවාහකයින් සඳහා වූ ඉඩකඩ (නිදන ශාලා සහ පොදු මුළුතැන් ගෙවල්) සපයනු ලැබේ. මේ සඳහා මාසික කුලියක් ගෙවිය යුතුය. විදුලි බලය සඳහා ගාස්තු වැඩිපුර වේ;

(iv) පුහුණුවන්නන් නවාතැන් ගැනීම සඳහා තමන් විසින් ම කටයුතු පිළියෙල කරගත යුතුයි. කඳවුරෙහි නේවාසික භාරකරුගෙන් අනුමැතිය ලත් පෞද්ගලික මෙහෙකරුවන් එක් අයෙකු බැගින් නවත්වා ගැනීමට පුහුණුවන්නන්ට ඉඩ දෙනු ලැබේ. එසේ අවශ්‍ය වන්නේ නම්, එවැනි පෞද්ගලික මෙහෙකරුවන් මනා චරිතයක් ඇති බවට සහතික ඉදිරිපත් කළ යුතුය;

භාරකරු ඔහුගේ අනුමැතිය අස් කර ගතහොත් එම පෞද්ගලික මෙහෙකරු ඉවත් කරගැනීම සඳහා පුහුණුවන්නන් භාරගත යුතුය.

(v) පුහුණුවන්නන් සහ ඔවුන්ගේ පෞද්ගලික මෙහෙකරුවන් කඳවුරෙහි භාරකරුගේ විනයානුකූල පාලනය යටතේ වන අතර පුහුණුවන්නන් කඳවුරු රෙගුලාසිවලට බැඳී සිටිය යුතුය.

28. **ආයතනයෙහි ඩිප්ලෝමා උපාධිය :**

අධ්‍යයන පාඨමාලාව සතුටුදායක ලෙස සමාප්ත කරන පුහුණුවන්නන්ට, භූමිතික විද්‍යා ආයතනයෙහි ඩිප්ලෝමා උපාධිය පිරිනමනු ලැබේ. ඩිප්ලෝමා උපාධිය පිරිනැමීමෙන් රක්ෂාව සැපයීමේ කිසියම් පොරොන්දුවක් අදහස් නොකෙරේ. කෙසේ වෙතත් එය බිම් මැනීම හා තලමිතිය වෘත්තියක් වශයෙන් කරගෙන යෑම සඳහා සර්වේ ජනරාල්ගේ බලපත්‍රය ලබාගැනීමට අනුග්‍රහයක් වන්නේ ය.

29. අවශ්‍ය සුදුසුකම් නැති අපේක්ෂකයින් විසින් එවනු ලබන ලියුම්වලට පිළිතුරු සපයනු නොලැබේ.

30. ලිඛිත පරීක්ෂණයේදී අපේක්ෂකයින්, විභාග කොමසාරිස් විසින් සම්පාදිත "අපේක්ෂකයින් සඳහා වූ රෙගුලාසි" වලට බැඳී සිටිය යුතුය.

ජේ. සී. චන්මුගම්,
සර්වේ ජනරාල්.

1965 අගෝස්තු මස 14 වෙනි දින,
තැ. පෙ. 506—කොළඹ 5,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ,
පාලක අංශයේ දීය.

**සංලක්ෂ්‍යය.**—මේ පරීක්ෂණය පිළිබඳ කිසිදු ලිපියක් සර්වේ ජනරාල් වෙත ඔහුගේ පෞද්ගලික නමට නොයැවිය යුතුය.

8–703—65.8.20 දින අංක 14,436 දරන ගැසට් පත්‍රය

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට වර්ෂයක කාලසීමාව තුළ කොළඹ බඩු ගබඩාවේ සහ මරදානේ (කැළණි වැලි) ගබඩාවේ සහ පැති මාර්ගයන්හි බඩු බෑම සහ බඩු පැටවීමේ සේවය සඳහා ලියාපදිංචි කළ ටෙන්ඩර්කරුවන්ගෙන් 1965 සැප්තැම්බර් මස 8 වෙනි බදාදා පෙ. ව. 11 දක්වා කොළඹ 1, "සෙලින්කෝ මන්දිරයේ" 4 වෙනි මහලේ ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙතෙක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ මේ සම්බන්ධව සැලකිලිමත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ නාමයන් ලියාපදිංචි කරන ලෙස ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරි වෙත පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමින් 1965 අගෝස්තු 26 වැනි දින හෝ ඊට ප්‍රථම අයදුම් කළයුතුයි:—

(අ) මෙම වර්ගයේ ව්‍යාපාර ගැන කලින් ඇති පළපුරුද්ද සම්බන්ධව විස්තර සහිත ප්‍රකාශනයක් ද පෙර පළපුරුද්ද, කාර්යක්ෂම සහ මුදල් ස්ථාවරත්වය පිළිබඳව අංක 1085 ඊ/282/2ඒ හා 1961.5.26 දින දරන මහා භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළයුතුය;

(ආ) ඉටුකරන ලද රජයේ කොන්ත්‍රාත්තු දක්වෙන ප්‍රකාශනයක් සහ එහි විස්තර;

(ඇ) සතු ඉඩකඩම්, දේපළ හා වෙනත් ව්‍යාපාර සම්බන්ධකම්ද, එය පිහිටි දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්කද, දැක්වෙන සම්පූර්ණ විස්තර සහිත ප්‍රකාශනයක් ; සහ

(ඈ) රජයේ කොන්ත්‍රාත්තු කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට සිය නම් ඇතුල් වී නැති බවට ප්‍රකාශයක්.

3. කොළඹ, තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ වාණිජ අධිකාරී කාර්යාලයෙන් ලබා ගතයුතු ආකෘති පත්‍රවල දෙපිට පතකින් යුතුව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. රු. 2,500 (දෙදහස් පන්සියක) ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලයේ හෝ කොළඹින් බැහැර නම් ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් මස 6 වෙනි සඳු දින අපරභාග 3 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මෙය සහ විස්තර ප්‍රකාශයද සමග ටෙන්ඩර් මුද්‍රා තබා කොළඹ 1කේ "සෙලින්කෝ මන්දිරයේ" 4 වෙනි මහලේ ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති නමට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එසේ නැත්නම් ලිපිනය සහ සේවයේ විස්තර කවරයේ සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර්, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාරගැනීමට බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් පැමිණ භාරදී, එය භාරගත් බවට ඔහුගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය. ඉහත සඳහන් නියමිත වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරණ අවස්ථාවේ එසේ කැමැත්තේ නම් ටෙන්ඩර්කරුවන්වද, එහි පෙනී සිටිය හැක. 1965 සැප්තැම්බර් 9 වෙනි බ්‍රහස්පතින්දා උදේ 10ට ප්‍රවාහණ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය සිට ඉදිරියට සති 6ක කාලයකට ටෙන්ඩර් පත්‍රවල සඳහන් කර ඇති ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වැඩිපුර විස්තර දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ වාණිජ අධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. අංක 355,
කොළඹ 10,
1965.8.9.

8–552/1—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට වසියක කාලසීමාව තුළ මෙහි පහතින් සඳහන් දුම්රිය ස්ථානවල බඩු බෑම සහ බඩු පැටවීම සඳහා ලියාපදිංචි කළ ටෙන්ඩර්කරුවන්ගෙන් 1965 සැප්තැම්බර් මස 8 වැනි බදාදා පෙරවරු 11 දක්වා කොළඹ, තැ. පෙ. අංක 355 දරණ ල. දු. සේ. දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| | |
|---|---|
| 1. මාතර | 12. මාතලේ |
| 2. ගාල්ල | 13. ගම්පොළ |
| 3. පොල්ගහවෙල | 14. නාවලපිටිය |
| 4. කුරුණෑගල | 15. හැටන් |
| 5. මහව | 16. තලවකැලේ |
| 6. මඩකලපුව | 17. වටගොඩ |
| 7. යාපනය | 18. නානුඔය |
| 8. රඹුක්කන | 19. හපුතලේ |
| 9. සරසවිඋයන | 20. බණ්ඩාරවෙල |
| 10. මහනුවර | 21. බදුල්ල |
| 11. වත්තේගම | |

2. මෙතෙක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ මේ සම්බන්ධව සැලකිලිමත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ නාම ලියාපදිංචි කරන ලෙස ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරී වෙත පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමින් 1965 අගෝස්තු 26 වැනි දින හෝ ඊට ප්‍රථම අයදුම් කළයුතුයි :—

(අ) මෙම වර්ගයේ ව්‍යාපාර ගැන කලින් ඇති පළපුරුද්ද සම්බන්ධව විස්තර සහිත ප්‍රකාශනයක් ද පෙර පළපුරුද්ද කාර්යක්ෂම සහ මුදල් ස්ථාවරත්වය පිළිබඳව මහා භාණ්ඩාගාර චක්‍රලේඛන අංක 1085ඊ/282/2ඒ හා 1961.5.26 අනුව ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළයුතුය ;

(ආ) ඉටුකරන ලද රජයේ කොන්ත්‍රාත්තු දක්වෙන ප්‍රකාශනයක් සහ එහි විස්තර ;

(ඇ) සතු ඉඩකඩම්, දේපළ හා වෙනත් ව්‍යාපාර සම්බන්ධකම්ද, එය පිහිටි දිස්ත්‍රික්කය හෝ දිස්ත්‍රික්කද, දැක්වෙන සම්පූර්ණ විස්තර සහිත ප්‍රකාශනයක් ; සහ

(ඈ) රජයේ කොන්ත්‍රාත්තු කොන්දේසි කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට සිය නම් ඇතුල් වී නැති බවට ප්‍රකාශයක්.

3. කොළඹ, තැ. පෙ. 355, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේ වාණිජ අධිකාරී කාර්යාලයෙන් ලබා ගතයුතු ආකෘති පත්‍රවල දෙපිට පතින් යුතුව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළයුතුය. රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී කාර්යාලයේ හෝ කොළඹින් බැහැර නම් ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් මස 6 වෙනි සඳු දින අ. භා. 3 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. මෙය සහ විස්තර ප්‍රකාශයද සමග ටෙන්ඩර් මුද්‍රා තබා කොළඹ 10, තැ. පෙ. 355, ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩල සභාපති නමට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එසේ නැත්නම් ලිපිනය සහ සේවයේ විස්තර කවරයේ සඳහන් කොට මුද්‍රා තබන ලද ටෙන්ඩර්, ටෙන්ඩර් මණ්ඩල සභාපති විසින් ටෙන්ඩර් භාරගැනීමට බලය පවරන ලද නිලධාරියෙකුට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් හෝ පැමිණ භාරදී එය භාරගත් බවට ඔහුගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. ඉහත සඳහන් නියමිත වේලාවෙන් පසුව ලැබෙන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

5. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එසේ කැමැත්තේ නම් ටෙන්ඩර්කරුවන්වද එහි පෙනී සිටිය හැක. 1965 සැප්තැම්බර් 9 වෙනි බ්‍රහස්පතින්දා උදේ 10ට දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනය සිට ඉදිරියට සති 6ක කාලයකට ටෙන්ඩර් පත්‍රවල සඳහන් කර ඇති ගණන් යෝජනා විවෘතව තැබිය යුතුය.

7. වැඩිපුර විස්තර වාණිජ අධිකාරීගේ කාර්යාලයෙන් ලබාගත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

තැ. පෙ. අංක 355,
කොළඹ 10,
1965.8.9.

8–552/2—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1965–66 වර්ෂය තුළ පාන් සැපයීම

1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන බන්ධනාගාරවලට පාන් සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් පුරවැසිකම් ලද්දෝයි) 1965.9.13 දින පෙරවරු 11 දක්වා බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර භාරගනු ලැබේ. ටෙන්ඩර පියවා මිනිත්තු පහකට පසු, එනම් පෙරවරු 11.05ට ටෙන්ඩර විවෘත කරනු ලබනවා ඇත. ඒ වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන්, ද්‍රව්‍ය සැපයීම සඳහා මිළ ගණන් ඉදිරියත් කිරීමේදී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද, ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් කොට ඇති මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේදී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නොමැති නම් හෝ එබඳු ටෙන්ඩර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත්තේ ය.

3. සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් ප්‍රකාරය :—

සපයනු ලබන පාන් වඩා පරණ නොවිය යුතුයි. එමෙන් ම හරි හැටියට නොතැම්බුණ ඒවා ද නො විය යුතුයි. අවුන්ස 6 ප්‍රමාණයක හෝ ඉල්ලුම් කරනු ලබන අන්‍ය පහසු ප්‍රමාණයක හෝ පාන් ගෙඩි වශයෙන් සැපැයිය යුත්තේය.

4. සියලුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා නියමිත බන්ධනාගාර අධිකාරීන් වෙත ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවිය යුතුයි. එසේ තැපෑලෙන් නො යවනු ලබන ටෙන්ඩර් පත්‍ර නියමිත අධිකාරී තැනට හෝ ඔහු විසින් පත් කරනු ලබන බලය ලත් නියෝජිතයෙකු වෙත් නම් ඔහුට භාර දී ඒ භාරගත් බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ වම් පැත්තේ, උඩ කෙළවරේ, "1965–66 වර්ෂය තුළ..................................................ට පාන් සැපැයීම සඳහා ටෙන්ඩරය" යැයි ලියා මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරි තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරින්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩරය භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් පියවා මාස තුන (3)ක් යනතුරු, ටෙන්ඩර්කරුවන් විසින් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර් කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ (කොළඹ කච්චේරියේ හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට, ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම්, හෝ එසේ කිරීමෙන් වැළැකී සිටි නම්, හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නො හැකි වන සේ ඔහුගේ නම කොන්ත්‍රාත්තු කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන්, බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවනට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

උපලේඛනයේ සඳහන් පරිදි ඒ ඒ කොන්ත්‍රාත්තුව සඳහා වෙන් වෙන් වශයෙන් ඇප මුදල් තැන්පත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි සියලු ටෙන්ඩර් කරුවන්ගේ සැළකිල්ල යොමු කරවනු ලැබේ.

10. සාර්ථක වූ ටෙන්ඩර්කරුවන්, තම කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන බවට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමැති වගකිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. මෙම කොන්ත්‍රාත්තුව ගෙනයෑමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයින් පමණකි.

11. සේවාව නිසියාකාර ඉටු කිරීමේදී දතයුතු සියලුම අවශ්‍ය කරුණු උපලේඛනයෙහි සඳහන් අධිකාරීගෙන් දැනගත හැක.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස් වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද, ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නාවූ නිලධාරියා ද ඔහුට පසුව එම පදවිය දරන්නාවූ නිලධාරියාද වේ.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

1965.8.7 දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

## උපලේඛනය

| බන්ධනාගාරය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | ඇප මුදල රු. | ටෙන්ඩර් භාරගන්නා නිලධාරිතැන |
|---|---|---|---|
| යාපනය ... | 25 ... | 200 ... | යාපනයේ බන්ධනාගාර අධිකාරි |
| අනුරාධපුරය ... | 25 ... | 200 ... | අනුරාධපුරයේ බන්ධනාගාර උප අධිකාරි |
| බදුල්ල ... | 25 ... | 200 ... | බදුල්ල බන්ධනාගාර උප අධිකාරි |
| මඩකලපුව ... | 25 ... | 200 ... | මඩකලපුව බන්ධනාගාර උප අධිකාරි |
| මාතර ... | 25 ... | 200 ... | මාතර බන්ධනාගාර උප අධිකාරි |
| තංගල්ල ... | 25 ... | 200 ... | එම |
| මීගමුව ත.ව.අ.වි. | 25 ... | 200 ... | මීගමුවේ ත.ව.අ.වි. අධිකාරි |

8–545—65.8.20 දින අංක 1 4,486 දරන ගැසට් පත්‍රය

---

## 1965-66 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර හා සිර සැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීම

බන්ධනාගාර හා සිරසැල්වල සිටින සිරකරුවන්ටත් උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත්, 1965 ඔක්තෝබර් මස 1 ද සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා මුළු අවුරුදු කාලය තුළ පිසනු ලැබූ ආහාර සැපයීම සඳහා 1965.9.9 දින පෙරවරු 10 දක්වා ඒ ඒ බන්ධනාගාර අධිකාරීන් විසින් ටෙන්ඩර්, ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමේ හෝ රටවැසියකු වූවෙකි). භාරගනු ලැබේ. එම දිනවල පෙරවරු 10.05 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එහි පෙනී සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් ආහාර සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද ඒවා සඳහන් කළ යුතුව ඇත. ඉලක්කමින් සඳහන් මිළ ගණන් වචනයෙන් සඳහන් කිරීමේදී අසමානත්වයක් ඇතිවී තිබුණහොත් හෝ මිළ ගණන් වචනයෙන් සඳහන් වී නැති නම් හෝ එබඳු ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත්තේය.

3. ආහාර සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන්වේ :—

උදය ආහාරය :

(අ) ආප්ප හෝ ඉදිආප්ප (අවුන්ස 6 කට නොඅඩු විය යුතුයි) ;

(ආ) හකුරු අවුන්ස එකක් හෝ සම්බෝල ;

(ඇ) සීනි දමන ලද තේ කෝප්පයක්.

දිවා නෝස්ටරු භෝජනය :

(අ) හාල් අවුන්ස 8 ප්‍රමාණයේ තැම්බූ බත් පිඟානක් ;

(ආ) හරක් මස් හෝ මාලු හෝ කරවල අවුන්ස 2 යි ;

(ඇ) එළවළු ව්‍යංජන දෙකයි. එක ව්‍යංජනයක් අවුන්ස 2 ප්‍රමාණය විය යුතුයි.

සැ.යු.—(i) සලාක කිරීම නිසා නොහොත් වෙනත් ප්‍රමාණවත් හේතුවක් නිසා සම්පූර්ණ ආහාර ප්‍රමාණයක් හෝ ඉන් කොටසක් හෝ සැපයිය නොහැකි නම්, අධිකාරි තැනගේ අභිමතය පරිදි කොන්ත්‍රාත්තුවට බැඳී ඇති වෙළඳ මිළ ප්‍රමාණයට සැහෙන සේ ආදේශක ආහාර සැපයීමට කොන්ත්‍රාත්කරුවනට පිළිවන.

(ii) කොන්ත්‍රාත්කරුවන්ගෙන් උදය ආහාරය ලබාගනු ලබන්නේ ආයතනය මගින් එය අඩු මිලකට සපයා ගැනීමට නොහැකි වුවහොත් පමණකි

4. සියළුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා උපලේඛනයේ සඳහන් අධිකාරි තැන වෙත රෙජිස්ටර් තැපැලෙන් යැවිය යුතුයි. රෙජිස්ටර් තැපැලෙන් නොයවන ටෙන්ඩර් පත්‍ර එම අධිකාරි තැනට හෝ ඔහු විසින් පත් කරන ලද බලයලත් නියෝජිතයෙකු වේ නම් ඔහුට හෝ භාරදී එය භාරගත් බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ " 1965–66 වර්ෂය තුළ බන්ධනාගාර සහ සිරසැල්වල සිටින සිරකරුවන්ටත්, උසාවිවලට ඉදිරිපත් කරනු ලබන සිරකරුවන්ටත් පිසන ලද ආහාර සැපයීමේ ටෙන්ඩරය." යැයි ලියා උපලේඛනයෙහි සඳහන් දින වල මෙහි 1 වැනි ඡෙදයේ සඳහන් වේලාවට ප්‍රථම නියමිත අධිකාරි තැනට ලැබිය යුතු සේ එවිය යුතුයි.

6. ටෙන්ඩර් සඳහා නියමිත පෝර්ම ඒ ඒ ආයතන භාර අධිකාරිවරුන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නතර කළ දින සිට සති 8ක් යන තුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර් වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත උපලේඛනයෙහි සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කළ යුතු මුදල් බන්ධනාගාර අධිකාරීන්ගේ කාර්යාලවල හෝ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ රහෝ (කොළඹ කච්චේරිය හැර) වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගත හැකිය.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීම පුළුවන් නො විනි නම් හෝ එසේ කිරීමෙන් වැළැකී සිටිනම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලෙන්, ඒ ඒ කොන්ත්‍රාත්තුවට තබා ඇති ඇප මුදලට සමාන මුදලක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවනට සිදු වෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපැලෙන් යවනු ලැබුවහොත් හෝ නො එසේව එහි ගෙන ගොස් භාරදුනහොත් හෝ එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුණු ලෙස සලකනු ලැබේ. අනා සියලු තැන්පත් මුදල්, කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු, එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවෝ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටු කරන වගට ඇපකරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වග කිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

11. සේවය නිසියාකාර ඉටු කිරීමේදී දත යුතු සියලුම අවශ්‍ය කරුණු දන ගැනීම සඳහා උපලේඛනයේ සඳහන් අධිකාරිවරුන් ගෙන් විමසනු මැනවි.

12. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිලධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද ගිණිය යුත්තේ ද ලංකාණ්ඩුව යටතේ දනට එම පදවිය දරන්නා වූ ද, නිලධාරියා ද ඔහුට පසු එම පදවිය දරන්නාවූ නිලධාරියා ද වේ.

පී. වී. පෙරේරා,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

1965 අගෝස්තු මස 16,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

## උපලේඛනය

| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රුපියල් | ඇප මුදල රුපියල් | ටෙන්ඩර් භාරගන්නා නිලධාරියා |
|---|---|---|---|---|
| 1. | පොලොන්නරුව සිරගෙල සහ උසාවිය | 5 | 25 | අනුරාධපුර බන්ධනාගාර අධිකාරි |
| | ත්‍රිකුණාමලය සිරගෙල සහ උසාවිය | 25 | 100 | එම |
| 2. | වාවාකච්චේරිය සිරගෙල සහ උසාවිය | 5 | 25 | යාපනයේ බන්ධනාගාර අධිකාරි |
| | යාපනය බන්ධනාගාරය සහ උසාවිය | 25 | 100 | එම |
| | කයිට්ස් සිරගෙල සහ උසාවිය | 5 | 25 | එම |
| | මන්නාරම් සිරගෙල සහ උසාවිය | 5 | 25 | එම |
| | මල්ලකම් සිරගෙල සහ උසාවිය | 5 | 25 | එම |
| | මූලතිව් සිරගෙල සහ උසාවිය | 5 | 25 | එම |
| | පොයින්ට් පේද්‍රු සිරගෙල සහ උසාවිය | 5 | 25 | එම |
| | වවුනියා සිරගෙල සහ උසාවිය | 5 | 25 | එම |
| 3. | මාතර බන්ධනාගාරය | 25 | 100 | මාතර බන්ධනාගාර අධිකාරි |
| | තංගල්ල බන්ධනාගාරය සහ උසාවිය | 10 | 50 | එම |
| | තිස්ස සිරගෙල සහ උසාවිය | 5 | 25 | එම |

8–702—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1965-66 මුදල් වර්ෂය තුළ දර සැපයීම පිළිබඳ ටෙන්ඩර් කැඳවීම

1965 ඔක්තෝබර් මස 1 වැනිදා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා බන්ධනාගාරවලට කැලෑ දර සපයා භාරදීම පිළිබඳව එම ආයතනයේ අධිකාරි විසින් 1965 සැප්තැම්බර් 9 වෙනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

විස්තර මෙසේ :—

සැපයීම පිළිබඳ විස්තර පහත සඳහන් අයුරු :—

විශ්කම්භය අඟල් 3 කට නො අඩුවූද, අඟල් 12 ට නො වැඩිවූද, දිග අඟල් 18 කට නොඅඩුවූද, අඟල් 36 කට නො වැඩිවූද, ඉතා හොඳට වියලුනු හද, මේරූ ගැටවලින් තොරවූද, දර කෑබලි එවලේම ප්‍රයෝජනයට ගැනීමට තරම් සුදුසු තත්ත්වයක ඇති ඒවා විය යුතුයි. සපයනු ලබන දර ගොඩපර, දියපර, කටුකැරල්ල, මී, මිල්ල, හොර, සියඹලා, දවට, පලු, මීහිරිය, දන්, මොර, කුඹුක්, මූනමල්, මාදන්, අළුබෝ ආදී තද ලී වර්ගවලට ඇතුළත් විය යුතුයි. හොණ්ඩරයකට රු. 14 සිට 28 දක්වා වූ ප්‍රමාණයකින් වියලීමට හා පොතුවලට අඩු කරනු ලැබේ

එමෙන්ම, කැන්ද, ඇටඹ, රුක් අත්තන ගැවලියා, සපු, අඹ, ඇල් බිසියා, මාර, කැකුණ, ඊරිය, තික්, මලබෝඩ ආදී බුරුල් ලී වර්ගවල අයත් දර භාරගනු නො ලැබේ. කැලෑ දර සහ රබර් දර හොණ්ඩරයක මිල වෙන් වෙන් වශයෙන් සඳහන් කළ යුතුය.

2. බන්ධනාගාරවල හෝ කිට්ටු කච්චේරියක රු. 10 ක් තැන්පත් කිරීමෙන් ලබාගත්තා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අධිකාරීන්ගෙන් 1965 සැප්තැම්බර් මස 8 වෙනිදා පස්වරු 3 දක්වා දර සැපයීම සඳහා ආකෘති පත්‍ර ලබාගත හැක. එම ආකෘති පත් සමග අනුපිටපතක් ද එවිය යුතුයි. පහත සඳහන් ආයතනයන් සඳහා ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී ටෙන්ඩර් තැන්පත් මුදල් ඇවැසි නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ;

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

3. ටෙන්ඩර් පත්‍ර සීල් කරන ලද කවරයක බහා එහි වම් කෙළවරෙහි "දර සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර තැපැලෙන් එවනු නොලැබේ නම්, ටෙන්ඩර්කරු විසින් හෝ ඔහුගේ නියෝජිතයා

විසින් බන්ධනාගාර ගේට්ටුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් විවෘත කරන දින නියමිත වේලාවට පෙර බහාලිය යුතුයි.

4. ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිල ගණන් අකුරෙන් හා ඉලක්කමින් ද විය යුතුයි. එසේ නොමැති ටෙන්ඩර් ප්‍රතික්ෂේප වීමට ඉඩ ඇත.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට දන්වා යවා දින 10 ක් ඇතුළතදී රු. 350 මුදලින් ඇපයක් තබා බන්ධනාගාර අධිකාරි තැන සමග ඒ පිළිබඳ ගිවිසුමකට නොබැඳුනහොත් ඔහු විසින් තැන්පත් කළ ටෙන්ඩර් මුදල රාජසන්තකවීමට ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත්වීමට ඉඩ ඇත.

6. හැම ටෙන්ඩරයක්ම 1965 සැප්තැම්බර් මස 9 වෙනි දින පෙරවරු 9.35 ට විවෘත කරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටිය හැක.

7. ටෙන්ඩර් භාරගත් අවසාන දින සිට මාස තුනක් යනතුරු ටෙන්ඩර්කරුවන් විසින් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුය.

පී. ඩී. පෙරේරා,
වැඩබලන බන්ධනාගාර කොමසාරිස්.

කොළඹ 9,
1965.8.16.

බන්ධනාගාරවලට අවශ්‍ය ප්‍රමාණය දළ වශයෙන් පහත දැක්වෙන අයුරුය :—

| | | |
|---|---|---|
| බදුල්ල | ... | ... ටොන් 36 |
| මහනුවර | ... | ... ටොන් 250 |
| මීගමුව | ... | ... ටොන් 80 |

8-701—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ගුවන් හමුදධිපති විසින් රාජකීය ලංකා ගුවන් හමුදවට අයත් කඳවුරු වලට 1965–66 මුදල් වර්ෂය තුළ පහත සඳහන් සැපයීම්/සේවා උදෙසා වර්ෂ 1965 සැප්තැම්බර් මස 9 වෙනි දින පෙරවරු 10 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

| සැපයීම්/සේවා විස්තරය | කඳවුර<br>කොළඹ | <br>කටුනායක | <br>දියතලාව | <br>චීනවරාය |
|---|---|---|---|---|
| 1. නිල ඇඳුම් සහ බැරැක්ක රෙදි ඇපිල්ලීම ... | එම ... | — ... | එම ... | — |
| 2. ගුදිරි කොට්ට මෙට්ට අළුත්වැඩියා කිරීම ... | — ... | එම (සැපයීමේ සහ නඩත්තු කිරීමේ අංශය) ... | එම ... | එම |
| 3. සපත්තු අළුත්වැඩියා කිරීම ... | — ... | — ... | එම ... | එම |
| 4. නිල ඇඳුම්, ඇඳඇතිරිලි සහ කුඩාරම් හරිගැස්සීම සහ වෙනස් කිරීම | — ... | — ... | එම ... | එම |
| 5. අපිරිසිදු ප්‍රසූත රෙදි ඇපිල්ලීම ... | — ... | එම (රාලංගුහ රෝහල) ... | — ... | — |
| 6. ගොඩනැගිලි උපකරණ සැපයීම ... | — ... | එම ... | — ... | එම |

2. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම පිණිස කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුද මූලස්ථානයේ සිවිල් පාළක නිලධාරි සහ ගණකාධිකාරී තැන වෙත ඉහත සඳහන් එක් සැපයීමක් සඳහා රුපියල් හැත්තෑපහක (රු. 75) මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. වර්ෂ 1965 සැප්තැම්බර් මස 8 වෙනි දින දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. සියළුම ටෙන්ඩර් පත් අනු පිටපතක් සමඟ මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් පැත්තේ උඩ කෙළවරේ "රාජකීය ලංකා ගුවන් හමුදවට ............................................................ සැපයීම/සේවය සඳහා 1965 සැප්තැම්බර් මස 9 වෙනි දින වසනු ලබන ටෙන්ඩර්" යයි සඳහන් කර කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ගුවන් හමුදධිපති වෙත එවිය යුතුයි.

4. පළමුවෙනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවේදී ටෙන්ඩර් පත් විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පෙනී සිටීමට ඉඩදෙනවා ඇත.

5. වැඩි විස්තර සඳහා කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුද මූලස්ථානයෙන් විමසන්න.

ඊ. ආර්. අමරසේකර,
එයාර් කොමදෝරු,
ගුවන් හමුදධිපති.

8-614—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

රාජකීය ලංකා නාවික හමුදාවට සියයට 17/18ක් ශක්තිය ඇති ඇළුමිනියම් සල්ෆේට් ටොන් 150ක් කුට්ටි වශයෙන් සැපයීම සඳහා රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 ඔක්තෝබර් මස 13 වෙනි දින පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ නාවික හමුදා මූලස්ථානයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. 1965 ඔක්තෝබර් මස 12 වෙනි දින පස්වරු 3 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

4. එක් එක් ටෙන්ඩරයක් වෙනුවෙන් රුපියල් 50ක මුදලක් නාවික හමුදාධිපති වෙත තැන්පත් කළ යුතුයි.

5. වැඩි විස්තර පහත අත්සන් කරන අයගෙන් ලබාගත හැක.

6. ටෙන්ඩර් කොන්දේසිවලට එකඟව ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකි අයවළුන්ට පමණයි ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ඇත්තේ.

ආර්. කදිර්ගාමර්,
කොමදෝරු,
වැඩ බලන නාවික හමුදාධිපති.

මූලස්ථානය,
රාජකීය ලංකා නාවික හමුදාව,
තැ. පෙ. 593, කොළඹ.

8-449—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

ජනසතු සේවා අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1965 නොවැම්බර් මස 17 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට මඩ හාරන යන්ත්‍රයක් සහ තළ සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1965 නොවැම්බර් මස 17 වෙනිදා පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 100 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් හා රු. 15ක මුදලක් ලියකියවිලි ගාස්තු වශයෙන් වරාය කොමිෂන් සභා කාර්යාලයේදී තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව රු. 100 ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. ලියකියවිලි ගාස්තු වශයෙන් තැන්පත් කරන රු. 15 ආපසු ගෙවනු නොලැබේ.

3. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1965 නොවැම්බර් මස 15 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත්කරනු ලැබේ.

4. අවලංගු කරන ලද ටෙන්ඩර් ලියකියවිලි හෝ විස්තර සටහන් පත්‍රිකා නිකුත් කරනු නොලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

1965.8.20 දින,
කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේදීය.

8-712—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1965 සැප්තැම්බර් මස 16 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට අයිති පැවිච්චි කළ නොහැකි බඩු විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1965 සැප්තැම්බර් මස 16 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයිනට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය. නැත හොත් ටෙන්ඩර් පත්‍ර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 50ක මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1965 සැප්තැම්බර් මස 14 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

ඇල්. ඇස්. ද සිල්වා,
වරායෙ කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු මස 20 දින,
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

8–711—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ඩෙල්fප් වේදිකාවේ පිහිටි තේ කඩය

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාලසීමාවකට යථෝක්ත තේ කඩය බදුදීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1965.9.3 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1965.9.1 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

8–719—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### හම්බන්තොට උප කොට්ඨාශය

වලව වම් ඉවුරු ව්‍යාපාරයේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1965 සැප්තැම්බර් මස 7 වැනි අඟහරුවාද පෙරවරු 10 දක්වා තංගල්ල, දකුණු කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහි දී සිදු කෙරේ.

| සේවා විස්තර | | | | උවමනා ලියා පදිංචි වූ ප්‍රමාණය රු. | ශ. | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| විෂය අංකය 1 — ඇස්. ඇල්. බී. ඇලේ 5 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම | ... | ... | ... | 22,000 | 0 | ... | 25 | 0 |
| විෂය අංකය 2 —ඇස්. ඇල්. බී. ඇලේ 6 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම | ... | ... | ... | 36,000 | 0 | | 50 | 00 |
| විෂය අංකය 3 — ඇස්. ඇල්. බී. ඇලේ 7 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම | ... | ... | ... | 25,000 | 0 | ... | 25 | 00 |
| විෂය අංකය 4 — ඇස්. ඇල්. බී. ඇලේ 8 වැනි සැතපුම ප්‍රකෘතිමත් කිරීම | ... | ... | ... | 20,000 | 0 | ... | 25 | 00 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් ගණන්වලට හෝ ඊට වැඩි ගණන්වලට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩ සඳහා ටෙන්ඩර් අයැදුම් පත් ඉදිරිපත් කළ හැක. .

3. 1965 සැප්තැම්බර් මස 3 වෙනි සිකුරාද වන තෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල දී හම්බන්තොට/ගාල්ල/තිස්ස, වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයැදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතු ද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ඉහත සඳහන් පදිරි තැන්පත් මුදල් වෙන් වෙන් වශයෙන් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය.

4. මේ ටෙන්ඩර් ගැන වැඩි විස්තර, ගිවිසුම්, වැඩ පිළිබඳ සැලසුම්, විශේෂ විස්තර යානදිය කාර්යාලයීය වේලාවන් තුල දී හම්බන්තොට වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඩී. ඩබ්ලිව්. රාජපක්ෂ,
වාරිමාර්ග ඉංජිනේරු,
හම්බන්තොට උප කොට්ඨාශය.

හම්බන්තොට,
1965 අගෝස්තු මස 9 දින දී ය.

8–550— ·65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කුරුණෑගල වයඹ කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1965.10.1 දින සිට 1966.9.30 දින දක්වා කුරුණෑගල වාරිමාර්ග කාර්යාලය යටතේ තිබෙන බඩු එහා මෙහා ගෙන යාම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 10,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිව සිටින කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ සතිම්වලින් 1965.9.7 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1965.9.2 දින පස්වරු 4.30 දක්වා කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

මේ සම්බන්ධව වැඩිපුර විස්තර ඔහුගෙන් විමසන්න.

කේ. කනගරත්නම්,
වාරිමාර්ග ඉංජිනේරු, කුරුණෑගල උ. කො.

වාරිමාර්ග කාර්යාලය,
කුරුණෑගල, 8.65.

2–283—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—හසලක උප කොට්ඨාශය

හසලක උප කොටසේ පහත සඳහන් කාර්යයන් සඳහා ටෙන්ඩර් 1965 සැප්තැම්බර් මස 15 වන බදාදා පෙරවරු 10 දක්වා මහනුවර මධ්‍යම කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කිරීම එවේලේදීම සිදුකෙරේ:—

**කාර්යයේ විස්තර**

(1) 1965-66 වර්ෂයේ බඩු බාහිරාදිය ප්‍රවාහණය කිරීම.

(2) 1965-66 වර්ෂයේ පොල් අතු සැපයීම.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක. ලොරි ධාවනය කළ නොහැකි ප්‍රදේශවල ප්‍රවාහන කටයුතු සඳහා ට්‍රේලර් සහිත ට්‍රැක්ටර් සෑහෙන ප්‍රමාණයක් ලබාගැනීමට අංක 1 දරණ ටෙන්ඩරය සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් සූදානමින් සිටිය යුතුයි.

3. 1965 අගෝස්තු මස 20 වන සිකුරාදා පෙරවරු 9 සිට 1965 සැප්තැම්බර් මස 13 වන සඳුදා දවල් 12 වන තෙක් හසලක, මිනිපේ, මාතලේ සහ මහනුවර, නුවරඑළිය යන ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකි ෆෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් හා දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයන්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම එක් එක් වැඩය සඳහා රුපියල් 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩර් ගැන සියළු විස්තර යනාදිය කාර්යාලීය වේලාවන් තුළදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

වාරිමාර්ග ඉංජිනේරු තැන,
හසලක උප කොටස.

වාරිමාර්ග කාර්යාලය, හසලක,
පල්ලේවත්ත, 1965.8.3 දින දීය.

8–637—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කන්තලේ පුළුල් කිරීමේ ව්‍යාපාරය

පහත සඳහන් උපලේඛනයේ සඳහන් කොට ඇති වැඩ සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1965 සැප්තැම්බර් 14 වැනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා ඔර්ස් කඳුකරය, ත්‍රිකුණාමලය, ත්‍රිකුණාමල කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම එවලේම එහිදී සිදු කෙරේ:—

**උපලේඛනය**

| | වැඩ විස්තර | | ලියාපදිංචි මුදල රු. | ශ. | ටෙන්ඩර් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| 1. | සක්ක ගල් අඩියට දැමීම ගල් හා තාර දැමීම තම්පාලකාමම් කින්නියා පාර | සැ. 4 සිට | ... 38,000 | 0 | ... 50 | 0 |
| 2. | එම | සැ. 5 සිට | ... 38,000 | 0 | ... 50 | 0 |
| 3. | එම | සැ. 6 සිට | ... 38,000 | 0 | ... 50 | 0 |
| 4. | එම | සැ. 7 සිට | ... 38,000 | 0 | ... 50 | 0 |
| 5. | එම | සැ. 8 සිට | ... 38,000 | 0 | ... 50 | 0 |

උපලේඛනයේ සඳහන් එක් එක් වැඩය ඉදිරියෙන් දක්වා ඇති මුදලකට හෝ ඊට වැඩි ගණනකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කලහැක.

1965 සැප්තැම්බර් මස 9 වන දින දක්වා කාර්යාලීය වේලාවන් තුලදී, කන්තලේ, අල්ලේ හෝ ත්‍රිකුණාමල වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරමවල ටෙන්ඩර් අයදුම් පත් සකස්කල යුතුය. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම්කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුනගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ හෝ ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල යුතුය. ෆෝරම නිකුත් කිරීමට ප්‍රථම උපලේඛනයෙහි දක්වා ඇති පරිදි ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුය.

මේ ටෙන්ඩරය ගැන වැඩි විස්තර කාර්යාලීය වේලාවන් තුලදී වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඇස්. සිවසුබ්‍රමනියම්,
වාරිමාර්ග ඉංජිනේරු,
කන්තලේ පුළුල්කිරීමේ ව්‍යාපාරය

කන්තලේ,
1965 අගෝස්තු 12 දින.

8–697—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහකනදරාව උප කොටස

මහකනදරාව උප කොටස යටතේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් 1965 සැප්තැම්බර් මස 7 වෙනි දින පෙරවරු 11 වන තෙක් අනුරාධපුර උතුරු මැද කොටසේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු විසින් භාර ගෙන එවේලේම විවෘත කරනු ඇත.

1. හුරුළුවැව ව්‍යාපාරයේ ලහාවන පාර ගල් අල්ලා තාර දැමීම සඳහා.

2. පහලකන්කිදියගම වැව අළුත් වැඩියා කිරීම.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 35,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ඉදිරිපත් වීය හැක.

1965 සැප්තැම්බර් මස 3 වෙනි සිකුරාදා සවස 4.30 දක්වා කාර්යාලීය වේලාවන් තුළදී මහකනදරාව උප කොටසේ හෝ අනුරාධපුර හා පදවිය උප කොටස්වල වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගත හැක. ටෙන්ඩර් ඉල්ලුම් පත් ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත්වන කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් රජය යටතේ කරන වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි මේ ටෙන්ඩර ගැන සියළුම විස්තර කාර්යාලීය වේලාවන් තුළදී මහකනදරාව උප කොටසේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ක. කනගසුංදරම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මහකනදරාව උප කොටස.

1965 අගෝස්තු මස 12 වැනි දින,
මිහින්තලේ දී ය.

8–710—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිල යෝජනා ක්‍රමය සහ වී කෙටීම

කොළඹ, යුනියන් පෙදෙසෙහි අංක 330 දරණ ස්ථානයෙහි ආහාර සහ කෘෂිකර්ම අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මෙරට වෙළඳුන්ගෙන් ද නිපදවන්නන්ගෙන් හා ව්‍යාපාරිකයන්ගෙන් ද හෝ පිටරට සමාගම්වලින් සහ එකී ලංකා නියෝජිතවරුන්ගෙන් පහත සඳහන් පරිමාණයන් අනුව ඇනූ කූඩා 600 බැගින් යුත් මිටි 7,000ක් සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1965 සැප්තැම්බර් 17 වෙනි සිකුරාදා අපරභාග 2.30 වන තෙක් භාර ගනු ලැබේ:—

(අ) ඇනූ කූඩයක් සාමාන්‍යයෙන් අඟල් 18ක් දිගද අඟල් 13ක් වට ප්‍රමාණයද තිබිය යුතු අතර දිගට හිල් 20ක් හා වට ප්‍රමාණය හිල් 11කින් සමන්විත විය යුතුයි.

(ආ) එක් හිලක් සාමාන්‍යයෙන් අඟල් ¾ක් පමණ විය යුතුයි.

(ඇ) එක් කූඩයක් අඩු වශයෙන් ඇනූ රාත්තල් 3½ක් පමණ දැමිය හැකි විය යුතුයි.

(ඈ) කූඩ මිටිවලට බැඳ සුරක්ෂිත කොට එක් මිටියක කූඩ 600 බැගින් තිබිය යුතුයි.

2. කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංකයෙහි අංක 42 දරන ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට රු. 100ක් තැන්පත් කළ කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක. ලංකාවේ ටෙන්ඩර්කරුවෝ මෙම තැන්පත් මුදල දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 දරණ ස්ථානයේ (හෝර්ටන් පෙදෙස) ගණකාධිකාරී තැනට භෙවිය හැක. පිටරට ටෙන්ඩර්කරුවෝ ඉහත සඳහන් ආකාරයට හෝ තමන්ගේ රටෙහි ලංකා තානාපති කාර්‍යාලයෙන් ටෙන්ඩර් පත්‍ර ලබා ගත යුතුය. තැන්පත් මුදල රු. 100 ද ගෙවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්‍යාලයේ ටෙන්ඩර් අංශයෙන් විමසා දැනගත හැක.

ජේ. වී. පොන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, එඩින්බරෝ චන්ද්‍රවංක,
කොළඹ 7,
1965 අගෝස්තු මස 20 වෙනි දින.

8-715—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීම

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ:—

1. බදුල්ල ගොවිකාරක සභා ප්‍රදේශයේ අත්දෙනියේ ඇල ප්‍රතිසංස්කරණය.
2. සොරබොර ගොවිකාරක සභා ප්‍රදේශයේ කුඹුක්ගොල්ලේ වැව ප්‍රතිසංස්කරණය.
3. බෙලිගල්ල ගොවිකාරක සභා ප්‍රදේශයේ කණ්ඩියතලාව වැව ප්‍රතිසංස්කරණය.
4. හීල්ඔය ගොවිකාරක සභා ප්‍රදේශයේ ඇතිමොලේ ඇල ප්‍රතිසංස්කරණය.
5. මැදවෙල ගොවිකාරක සභා ප්‍රදේශයේ කරගහඋල්පොත පහළ අරාවේ ඇල ප්‍රතිසංස්කරණය
6. ඌව පරණගම 1 ගොවිකාරක සභා ප්‍රදේශයේ ගොඩ ඇල ප්‍රතිසංස්කරණය.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965 සැප්තැම්බර් මස 3 දින දවල් 12 දක්වා බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි විය යුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ "සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1965 සැප්තැම්බර් මස 4 දින දවල් 12 ට පෙර බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරුට ඒ බව බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරී තැන විසින් හෝ ලියවිල්ලකින් දනුම් දෙනු ඇත. මේ දනුම්දීම නිකුත් කළ දින සිට, දස දිනක් ඇතුළත දී එම ටෙන්ඩර්කරු විසින් බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් 10% ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුළත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ හෝ බලය රජයට ඇත.

8. බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුලත් වී ඇති කිසිවකු සමග හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතූන් උඩ, බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමග හෝ ගිවිසුමකට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුළදී සැලසුම් පරීක්ෂා කර බැලීමට බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගතයුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බදුලු දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමග ගිවිසුමකට ඇතුලත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින්වෙන්නේ දනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු විය යුතු මුද්දර කොන්ත්‍රාත්කරු විසින් සැපයිය යුතුය.

13. බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1965 සැප්තැම්බර් මස 6 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවායේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ඊ. ඒ. ගුණවර්ධන.
ගොවිජන සේවා සහකාර කොමසාරිස්.
බදුල්ල දිස්ත්‍රික්කය.

බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර
කොමසාරිස්තැන ගේ කාර්යාලය, බදුල්ල,
1965 අගෝස්තු මස 14 දින දීය.

8–635—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ 4 ශ්‍රී 7917 දරන "ටොයාටා ලැන්කෘෂර්" රථයේ අලුත්වැඩියාවන් සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ 7, එඩින්බරෝ චන්ද්‍රවංකයේ අංක 42 දරන ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් වාහනයේ පහත සඳහන් අලුත්වැඩියාවන් කරදීම සඳහා 1965 සැප්තැම්බර් මස 3 වෙනි සිකුරාදා පස්වරු 2.30 වන තෙක් රජයේ පිළිගත් ගරාජ හිමියන්ගෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

අවශ්‍ය අලුත්වැඩියාවන්—

(1) චැසිය හා ඉදිරිපස බපරය ඇද ඇරීම.
(2) ඉදිරිපස වීදුරුව සපයා සවි කිරීම.
(3) ඇන්ජිම ඩිකාබනයිස් කිරීම.
(4) ක්ලච්එක අලුත්වැඩියා කිරීම.
(5) සිග්නල් ලයිට් හා අනිත් ලයිට් අලුත්වැඩියා කිරීම.
(6) අත් තිරිංග අලුත්වැඩියා කිරීම.
(7) ගියර් මාරුකිරීමේදී ගියර පෙට්ටියෙන් නැගෙන ශබ්දය හරි ගැස්සීම.
(8) ඉදිරිපස රෝද දෙකේ ඔයිල් සීල් දැමීම.
(9) බොනට් එකට අගුලක් දැමීම.
(10) ඉදිරිපස සීට් කවර අලුත්වැඩියා කිරීම.

2. කොළඹ 10, ඩීන්ස් පාර, අංක 336, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍ර මගින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1965 අගෝස්තු 30 වන සඳුදා පෙ. ව. 12 දක්වා ටෙන්ඩර් ආකෘති නිකුත්කිරීම කරනු ඇත. කොළඹ 7, හෝටන් පෙදෙස අංක 60, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී කාර්යාලයේ මුදල් භාරකරු වෙත රු. 50 ටෙන්ඩර් තැන්පත් මුදලක් තබා ලබාගන්නා ලද කුවිතාන්සිය ඉදිරිපත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුයි.

3. නියමිත අයුරු අත්සන් තබන ලද ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර, කවරවලට සීල් තබා, කොළඹ 7, අංක 42, ඇඩින්බරෝ චන්ද්‍රවංකයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත 1965 සැප්තැම්බර් මස 3 වෙනි සිකුරාදා ප. ව. 2.30 ට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරවල මතුපිට වම් උඩ කෙළවරේ "4 ශ්‍රී 7917 ජීප්රථය අළුත්වැඩියාවට ටෙන්ඩරය" යන්න සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් පත්, ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ කොළඹ 7, අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංකය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලැබෙන්නට සැලැස්විය යුතුයි.

4. ඉහත සඳහන් සියලුම අලුත්වැඩියාවන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුවේ.

5. කොළඹ 7, අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංකය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදී 1965 සැප්තැම්බර් 3 වෙනි දින ප. ව. 2.30 ට ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් ඒ වේලාවට විවෘත කරන ස්ථානයේ පෙනී සිටීමට පුළුවන.

6. පිළිගත් ටෙන්ඩරය හිමිකරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට දින 7 ක් ඇතුළතදී ටෙන්ඩර් වටිනාකමින් 5% මුදලක් ඇප වශයෙන් තැන්පත් කර නියමිත වැඩය සම්පූර්ණ කරදීම සඳහා ගිවිසුමකට අත්සන් තැබිය යුතුයි. අවශ්‍ය මුද්දර ගාස්තු ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුවේ.

7. කොළඹ 10, 336, ඩීන්ස් පාර, ගොවිජන සේවා දෙපාතීමේන්තුවේ කාර්යාලයේදී සතියේ දිනවල පෙ. ව. 9 සිට ප. ව. 4.30 දක්වාත් සෙනසුරාදා පෙ. ව. 9 සිට ප. ව. 1 දක්වාත් එම වාහනය පරීක්ෂාකර බැලීමට පුළුවන.

ජේ. වී. ෆොන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10,
1965 අගෝස්තු 16.

8–647—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිළ යෝජනා ක්‍රමය සහ වී කෙටීම

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක 42 ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, හිඟුරක්ගොඩ සහ බකමූණ පිහිටි රජයේ හාල් මෝල් භූමියන්හි ඇතුලත විශ්කම්භය අඩි 12 ක් ද, ගැඹුර අඩි 25 ක් ද පමණ වූ ළිඳක් බැගින් කපා නිම කර දීමට කැඳවනු ලබන ටෙන්ඩර් පත් 1965 සැප්තැම්බර් 9 වැනි බ්‍රහස්පතින්දා අපරභාග 2.30 වනතෙක් භාරගනු ලැබේ.

2. එක් එක් ස්ථානයක ළිඳක් කැපීම සඳහා රු. 50 තැන්පත් මුදලක් දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60 හෝටන් පෙදෙසෙහි ගණකාධිකාරී තැනට ගෙවා ලබාගත්තා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කොට කොළඹ 42 ඇඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටැන්ඩර් අංශයෙන් 1965 සැප්තැම්බර් 9 වෙනි බ්‍රහස්පතින්දා 12 වන තෙක් නිකුත් කරණු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනු පිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. මේ සඳහා පැලැන් කෙටුම් පත් විස්තර හා අනිකුත් විස්තර ගොවිජන සේවා දෙපාර්තමේන්තු කාර්යාලයේ ටැන්ඩර් අංශයෙන් විමසා දැනගත හැක.

කේ. සිත්තම්පලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 537, කොළඹ 7,
1965.8.20.

8–656—65.8.20 දින අංක 14,480 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වාරියපොළ රජයේ ගොවිපළේ 1965 අගෝස්තු මුරයේ ගෙඩි පොල් විකිණීම

අනුරාධපුර නව නගරයේ ගොවිපල පාලන හා නිෂ්පාදන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් කාරණය සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1965.8.31 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ. විකිණීම සඳහා ඇති ගෙඩි පොල් ප්‍රමාණය සාමාන්‍යයෙන් විසි දහසකට (20,000) ත්, තිස් දහසකටත් (30,000) අතර ප්‍රමාණයක් විය හැක.

2. අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කායසීලයේ පරිපාලක නිලධාරී තැනගෙන් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක බහා මුද්‍රා තබා, අනුරාධපුර නව නගරයේ ගොවිපල පලන හා නිෂ්පාදන කායසීලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට එවිය යුතු අතර, ටෙන්ඩර් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "වාරියපොළ ගොවිපළේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න ද සඳහන් කර තිබිය යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර අනු පිටපතකින් යුත්ත වියයුතු අතර, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතු ය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝ

11. ටෙන්ඩර්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට යැව්වොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා ලෙස සළකනු ලැබේ.

12. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමඟ නම ඇතුළත් වූ හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේයයි පෙනී යන හේතු පිට ටෙන්ඩර් මණ්ඩලය විසින් එකඟ නොවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

13. මේ පිළිබඳව වැඩි විස්තර පැල්වෙහෙර හා මහඉලුප්පල්ලම පාසැල් ගොවිපළේ කළමනාකරුවන්ගෙන් විමසිය යුතුය.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකම් අධ්‍යක්‍ෂ.

1965.8.5 වැනි දින,
පේරාදෙණියේ,
කෘෂිකම් දෙපාර්තමේන්තුවේ දීය.

8–443/2—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### ගොවිපළවලට සත්ව ආහාර සැපයීම

කෘෂිකම් දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගව මධ්‍යස්ථාන හා කෘෂිකර්ම ගොවිපලවලට පහත සඳහන් සත්වාහාර සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර පේරාදෙනියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965.9.3 වැනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ :—

| සත්වාහාර | හය මාසයකට වුවමනා කරන සාමාන්‍ය ප්‍රමාණය හොණ්ඩර |
|---|---|
| තිරිඟු පරළු | 360 |
| කඩල | 28 |
| වියලි කිරි මල් | 236 |

ඉහත සඳහන් වන්නේ 1965 ඔක්තෝබර් මාසයේ සිට හය මාසයක් තුළ වුවමනා කරන ප්‍රමාණයන්ය. සත්ව ආහාර හොඳ තත්ත්වයක තිබීමත් හැර පහත සඳහන් විශේෂ ලක්ෂණයන් ද තිබිය යුතුය :—

| සත්වාහාර | අදහස් කරන ලද විස්තර | සහතික කළ සංයෝගය |
|---|---|---|
| තිරිඟු පරළු | | මාංශ ජනක ධාතු සියයට 17 ට නොඅඩු තෙතමනය සියයට 10 නොවැඩි, පිටස්තර දේ නො තිබිය යුතුයි. |
| කඩල | | මාංශ ජනක ධාතු සියයට 22-23, තෙතමනය සියයට 12 ට නො වැඩි පිටස්තර දේ නොමැති, සතුන් විසින් නොවිදින ලද. |
| වියලි කිරි මල් | කිරි සෑදීමේදී ලබා ගන්නා කිරිමල් | මාංශ ජනක ධාතු සියයට 49 ට නොඅඩු තෙතමනය සියයට 10 ට නො වැඩි පිටස්තර දේ නො තිබිය යුතුය. |

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ 1, ඩියුක් වීදියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ තැනගෙන් ලබා ගත යුතුය. එම ටෙන්ඩර් ආකෘති පත්‍ර නිවැරදිව පුරවා, අනු පිටපතකින් යුක්තව, කවරයක බහා, සීල් තබා "සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකම් දෙපාර්තමේන්තුව, පේරාදෙනිය" යන්න ලියා, එහි මුදුන් කෙළවරේ, "කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සත්ව ආහාර සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුය.

5. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 100 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකිය. 1965.9.1 වන තෙක් ටෙන්ඩර් ආකෘති දෙනු ලැබේ. මුදල් තැන්පත් කිරීම, මහා භාණ්ඩාගාරයේ, හෝ ඕනෑම කච්චේරියක, නැතහොත් පේරාදෙනියේ, කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කළ හැකිය. මෙම තැන්පත් මුදල ආපසු ගෙවනු ලබන්නේ, කොන්ත්‍රාත්කරු දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් පත්‍රයකට අත්සන් කළ පසුය. පත්කර ගත් කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දස දිනක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් තැබීමටත්, නො හැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර, ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කරනවා ද ඇත.

6. ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘති නියමිත ලෙස සකස් කර පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් එකී ලිපිනයට රිජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය. රිජිස්ටර් තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින් හෝ ඔවුන්ගේ ඒජන්ත වරු විසින් හෝ ටෙන්ඩර් භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරි තැන වූ පේරාදෙනියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකම් අධ්‍යක්ෂ වෙත අතින්ම භාර දිය යුතුය. එම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ "සත්ව ආහාර සපෑයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුය.

රිජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණ බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකු විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් විවෘත කිරීමට නියමිතව තිබූ දින සිට දින 4 ක් ඇතුළත නො ලද හොත්, ඒ ගැන පේරාදෙනියේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ගෙන් වහාම විමසිය යුතුය.

7. සෑම ටෙන්ඩර් කරුවෙක් විසින්ම ඔවුන් විසින් ටෙන්ඩර් කරන ලද සෑම සත්ව ආහාරයක්ම රාත්තල් 6 ක සැම්පලය බැගින් "සත්ව ආහාර සැම්පල්" යන්න ලියා 1.9.65 දිනට හෝ ඊට පෙර, කොළඹ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය කාර්යාලයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ වෙත ලැබීමට එවිය යුතුය. සැම්පල් එවීමට නො හැකි වුවහොත් ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ. සැම්පල් මිස ටෙන්ඩර් පත්‍ර නියෝජ්‍ය අධ්‍යක්ෂට නො එවිය යුතුය. මේවා දුම්රියට ගෙවා එවිය යුතුයි.

8. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩරය විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින යටකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘත කරනු ලැබේ.

9. නියම පෝරමයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සළකනු නො ලැබේ. ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාක් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වලට ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන ද තැබිය යුතුවේ. ටෙන්ඩර් කරණ ලද ගණන් අකුරු වලින් සහ ඉලක්කම් වලින්ද ලිවිය යුතුයි. ඉලක්කම් වලින් ලියන ලද ගණන් වචන වලින් සඳහන් කරන ගණන් වලට වෙනස් වුවහොත් ටෙන්ඩර් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට ද ඉඩ තිබේ.

10. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

11. පළමුවෙනි වාක්‍ය ඛණ්ඩයෙහි සඳහන් සත්ව ආහාර සියල්ලටම හෝ එකකට හෝ ටෙන්ඩර් කළ හැක.

12. වුවමනා අවස්ථාවක සත්ව ආහාර උවමනා ප්‍රමාණ සැපයීමට ටෙන්ඩර් කරුට පුළුවන් විය යුතුය. මේ වග කෘෂිකම් අධ්‍යක්ෂ තැන විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ සත්ව ආහාර තොගය යැවිය යුතු ළඟම දුම්රිය පළ ද සඳහන් කර තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරුවාට විටින් විට දන්වනු ලැබේ.

13. ටෙන්ඩරය භාර ගත් බව දන්වා දස දිනක් ඇතුළත උවමනා ප්‍රමාණ සත්ව ආහාර සැපයීමට ටෙන්ඩර් කරුවන්ට හැකි විය යුතුයි.

14. තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරු විසින් සත්ව ආහාර යවන අවස්ථාවේදී ඒවායින් සැම්පලයක් පරීක්ෂණයකට භාජනය කළ යුතුයි. කෘෂිකම් අධ්‍යක්ෂ තැන විසින් නම් කරන ලද නිලධාරියෙකුට විභාග කර බැලීම සඳහා සැම්පල් ගැනීමට පහසුකම් සැලැස්විය යුතුයි. මේ සැම්පල් නියම තත්වයට නොතිබිනි නම් සපයන ලද සියළුම සත්ව ආහාර ටෙන්ඩර් කරුහට දුම්රිය ගාස්තු ගෙවා භාර ගැනීමට ආපසු එවනු ලැබේ.

15. ටෙන්ඩරයෙහි සඳහන් කළ මිල ගණන් දුම්රිය පෙට්ටිවලට පටවන ශුද්ධ බර ප්‍රමණය අනුව විය යුතුයි. පැටවුම් ගාස්තු දෙපාර්තමේන්තුවෙන් ගෙවනු නො ලැබේ. තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරුවාට ඔහුගේ ගබඩාවත් බඩු එවන දුම්රිය ස්ථානයත් අතර සත්ව ආහාර ගෙන යෑමට යන වියදම් දරන්නට සිදුවේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද, සත්ව ආහාර වලට යන මුළු වියදමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකම් අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කර ගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිම වූ විට පමණකි. පත් කරන ලද ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවා ද ඇත. බැංකු සහතිකයක් වුව ද පිළි ගනු ලැබේ.

17. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

18. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වූ දින සිට දෙමසක් යනතුරු ටෙන්ඩර්කරුවන්ට තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ තිබිය යුතුයි.

19. සත්ව ආහාර සැපයීම පිණිස ගන්නා සියලුම මළු නොඉරුණු පිරිසිදු ඒවා විය යුතුයි. මේ සඳහා හිස් කවුපෝර මළු පාවිච්චි නොකළ යුතුයි. මෙම දෙපාර්තමේන්තුවේ රසඥතැන විසින් විභාග කරන ලද සත්ව ආහාර මොනයම් අවසථාවක දී නියම තත්ත්වයකට නොතිබුණි නම් ඒවා අපසු යැවීමට යන වියදම් කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුයි.

20. ඉහත සඳහන් සත්ව ආහාර සියල්ලම සපයා දෙන ලෙස නියම් කිරීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ඇප නොවේ. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ, සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ද, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමට ද වුවමනා ප්‍රමාණයන් සපයා දෙන ලෙස නියම කිරීමටද බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

21. කොන්ත්‍රාත්කරු විසින් එක් එක් ගොවිපළකට යවන එක් එක් සත්ව ආහාර තොගයට බිල බැගින් නොයවා එක්එක් ගොවිපළකට මසක් තුළ දී සපයන ලද තොග සියල්ලට ම එක් බිලක් මාසය අවසානයේ දී යැවිය යුතුයි.

22. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු සත්ව ආහාර තබා තිබෙන ඔහුගේ ගබඩාව වසංගත රෝග බෝවන මැස්සන්ගෙන් තොරව ඉතා පිරිසිදු තත්ත්වයක තබාගත යුතුයි.

23. සත්ව ආහාර සපයන මළු ඒ ඒ ගොවිපළවල තිබෙන භාජනවලට ඒ බඩු දමාගත් පසු අපසු එවනු ලැබේ. ඒවා එවීමට යන වියදම කොන්ත්‍රාත් කරු විසින් දැරිය යුතුයි.

24. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම පිණිස ලාංකික කම්කරුවන් යෙදවිය යුතුයි.

ඒ වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් යෙදවිය යුතු වග කොන්ත්‍රාත්තුවේ කොන්දේසියක් හැටියට සලකනු ලැබේ. තෝරා ගන්නාලද කොන්ත්‍රාත්කරුට මේ කොන්දේසිය ඉටු කිරීමට නොහැකි වුවහොත් කොන්ත්‍රාත්තුව කඩ කිරීමකැයි සළකා එය අවලංගු කරනු ලැබේ. විශේෂ අවසථාවන්හි කොන්ත්‍රාත්කරුට ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට හැකි වන්නේ කොළඹ, කෘෂිකර්ම හා ආහාර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තැනගේ අනුමැතිය පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ අවසරය පළමුව ලියවිල්ලකින් ලබා ගත්තාට පසුවය. එවැනි අවසරයක් නොමැතිව ලාංකිකයන් නොවන කම්කරුවන් යෙදවීම කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් වශයෙන් සලකනු ලැබේ.

"ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

25. තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

26. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැනුම්දීම ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහුගේ නියෝජිතයාට (සමාගමක් නම් ව්‍යාපාරයේ නියෝජිතයා හෝ ලේකම්තැන) දුන්නොත් ඔහු විසින් සපයන ලද ඔහුගේ කන්තෝරුවේ/නිවසේ ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඒ ඔහුට භාර දුන්නා සේ සලකනු ලැබේ. යම් විධියකින් කොන්ත්‍රාත්කරු ඔහුගේ කාර්යාලය/නිවාසය හෝ ලිපිනය වෙනස් කර තිබේ නම්, ඒ බව කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුයි. කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත දන්වීමකින් ඒ බව දන්වන තුරු පොරොන්දු පත්‍රයේ සඳහන් වන ලිපිනයට සියළුම ලියුම් හෝ දැන්වීම් හෝ වෙනත් ලියවිලි යැවීමෙන් ඒවා භාරදුන් බවට ඒත්තු ගනු ලැබේ.

27. යම්කිසි වැඩකරුවෙක් මේ වැඩෙහි යෙදවීම ගැන විරුද්ධවීමට බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

28. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂතැනට ඉහත සඳහන් සත්ව ආහාර සියල්ලක් ම මිළට නොගත යුතු යැයි පෙනී ගියහොත් එසේ මිළයට නොගැනීම හේතුකොට ගෙන ආණ්ඩුවෙන් වන්දි මුදලක් ගැනීමට ඔහුට බලයක් නොලැබේ.

29. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කාරයන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් කෙනෙකුගේ නම සමග ඇතුළත් වූ හෝ තමාට සැහේ යයි පෙනීයන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

30. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් ඇපකරුවන් දෙදෙනෙකු සොයාගෙන ඔහුගේ වියදමින් ම පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එම ඇපකරුවන් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විසින් අනුමත කළ යුතුයි.

31. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන මිළ ගණන් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

32. සපයන ලද සත්ව ආහාර සතුටුදායක නොවීමත් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට තබාගනු ලැබේ.

33. වැඩි විස්තර කොළඹ සත්ව පාලනය හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂතැනගෙන් දැනගත හැක. එසේ එවන ලියුම් පහත සඳහන් අයගේ නමට නොඑවිය යුතුයි.

ඩී. සී. එල්. අමරසිංහ,
වැඩබලන කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 ජූලි 13,
කොළඹ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී.

8–696—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව—රත්මලාන

**ඩීසල් හෝ පැට්රෝල් ඇන්ජිමකින් ක්‍රියාකරවන පහසුවෙන් එහා මෙහා ගෙනයා හැකි පොම්ප කට්ටලයක් සැපයීම හා ගෙනැවිත් භාරදීම**

පහත දැක්වෙන විස්තර අනුව පොම්ප කට්ටලයක් සැපයීම හා ගෙනැවිත් බාරදීම සඳහාවූ ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර රත්මලානේ ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1965 සැප්තැම්බර් මස 8 වැනි බදාදා පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ.

අඩි 50ක මුළු ශීර්ෂයකින් පැයකට ගැලුම් 5,000 දක්වා ලබාදීමේ ධාරිතාවයෙන් යුත්, උපරිම වශයෙන් අඩි 27ක උරා ඇදගැනීම එසවීමට හැකි, පහසුවෙන් එහා මෙහා ගෙනයා හැකි ඩීසල් හෝ පැට්රෝල් ඇන්ජිමකින් ක්‍රියා කරවන පොම්ප කට්ටල එකක් රත්මලානේ පිහිටි දෙපාර්තමේන්තුවේ ගබඩාවට ගෙනැවිත් බාරදීම.

එදිනම පෙරවරු 10.05ට ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවසථා වේදී ටැන්ඩර්කරුවන්ට දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩල කාමරයට පැමිණ සිටිය හැකිය.

ටැන්ඩර් ලියකියවිලි හා වැඩ විස්තරයද රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂතුමාගේ කාර්යාලයේ ඇත.

ඉදිරිපත්වීමට අදහස් කරනු ලබන ටැන්ඩර්කරුවන් රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (නිර්මාණ හා නඩත්තු) වෙත ඉල්ලුම් කරනු ලැබූවිට ටැන්ඩර් ලිය කියවිලි නිකුත් කරනු ලැබේ. එසේ නිකුත් කිරීමට පළමුව ඔවුන් විසින් ටැන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 25කට රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ රිසිට් පතක් ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම ටැන්ඩර් ඇප මුදල ටැන්ඩර් කොන්දේසිවලට අනුකූලව ආපසු ගෙවනවා ඇත.

පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් ඇප මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
නිදසුනක්—වෙනා කැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝර්ප රේෂන්.

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඇ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර්තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

1965 සැප්තැම්බර් මස 1 වැනි බදාදා දවල් 12 දක්වා ටැන්ඩර් ලිය කියවිලි නිකුත් කරනවා ඇත.

ආර්. වී. පෙරුමයිනාර්,
වැඩ බලන ජලසම්පාදන හා ජලාපවහන
අධ්‍යක්ෂ.

1965ක්වූ අගෝස්තු මස 14 වැනි දින,
රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන
දෙපාර්තමේන්තුවේදීය.

8–661—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් මරදානේ ත්‍රිපොලි වෙළඳ හලට සහ බොරැල්ලේ මුළුතැන්ගෙයට 1965.10.1 සිට 1966.3.31 දින දක්වා ලෙලි ගැලවූ පොල් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යුනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 සැප්තැම්බර් මස 10 දින අ.භා. 2.30 වනතුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරන අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක් බැඳ ලබාගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් මස 10 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් ලියාඅනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

මී. ස. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු මස 12 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8-606—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1965.10.1 සිට 1966.9.30 දින දක්වා කුකුල් මස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යුනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 සැප්තැම්බර් මස 10 දින අ.භා. 2.30 වනතුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ, අංක 62 දරණ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් මස 10 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

එස්. නඩරාජා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු මස 12 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8-607—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1965.10.1 සිට 1966.3.31 දින දක්වා ගවමස් සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත් කොළඹ 2, යුනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 සැප්තැම්බර් මස 10 දින අ.භා. 2.30 වනතුරු භාරගනු ලැබේ. කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200ක් බැඳ ලබා ගන්නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් 10 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැනගැනීමට පුළුවන.

එස්. නඩරාජා,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු මස 12 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8-608—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයිති නාරංගේන්පිට විත් කිරීමේ කර්මාන්තායතනට 1965.12.31න් අවසාන වන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ කරන ලද කජු මද සපයා ගෙනැවිත් භාරදීම සඳහා 1965 සැප්තැම්බර් මස 13 වැනි දින අ.භා. 2.30 වන තෙක් අලෙවි කිරීමේ කොමසාරිස් විසින් කෝටේෂන් පත් භාරගනු ලැබේ.

කෝටේෂන් පත් 1965 සැප්තැම්බර් මස 13 වැනිදා දවල් 12 වන තෙක් කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

කේ. යූ. කමල්ගොඩ,
වැඩ බලන අලෙවි කිරීමේ කොමසාරිස්තැන වෙනුවට.

1965 අගෝස්තු මස 12 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ දීය.

8-595—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

කොළඹ වේල්ස් කුමාර මාවතෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයිති ගබඩාවේ ඇති පාවිච්චි කළ නොහැකි සිමෙන්ති මලු 76ක් සහ හිස් කඩදාසි සිමෙන්ති මලු 316ක් විකිණීම සඳහා කොළඹ 1, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1965 සැප්තැම්බර් මස 13 වෙනිදා අ.භා. 2.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

මේ සඳහා ටෙන්ඩර් පෝරම කොළ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගන්ට පිළිවන.

8-596—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## දැව පිලි හා ආවරණ කම්බි ඇහුරුම් සහ ආවරණ ආදිය සැපයීම සහ භාරදීම

රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කළමනාකාරතැන වෙත ඉහත සඳහන් බඩු සපයා කොලොන්නාවේ පිහිටි ඔහුගේ ගබඩාවට බාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1965ක් වූ ඔක්තෝබර් මස 19 වන අඟහරුවාදා පූ. භා. 10 දක්වා රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන (තැ. පෙ. 540, කොළඹ) විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් ලියාපදිංචිකළ තැපෑලෙන් නොඑවන්නේ නම්, ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදිය යුතුයි. පිට කවරයේ ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය සහ සේවයේ විස්තරද සඳහන් කොට ටෙන්ඩර් මණ්ඩලයේ ටෙන්ඩර් භාරගැනීමේ බලයලත් සභාපතිතැනට භාරදිය යුතුයි.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරුතැනගේ කාර්යාලයෙහිදී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක මුදලක් ටෙන්ඩර් පෝරම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප්තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි

ඉංජිනේරුතැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගස්තුව වන රු. 5යේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්මවලයි. වෂී 1965ක්වූ ඔක්තෝබර් මස 15 වන දින දවල් 2 වන තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. වෂී 1965ක්වූ ඔක්තෝබර් මස 19 වන අඟහරුවාදා පූ.භා. 10ට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කාර්යාලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඇස්. ඩබ්ලිව්. පීරිස්,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
වැඩ බලන ප්‍රධාන කළමනාකාරතැන.

තැ. පෙ. 540,
කොළඹ 10,
1965 ක්වූ අගෝස්තු 20 වෙනි දින දීය.

8-600—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## දෙහිවල සත්වෝද්‍යානය

### 1965-66 වෂීය තුළ සත්වාහාර සැපයීම

1965.10.1 සිට 1966.9.30 දින දක්වා කාලය තුළ දෙහිවල සත්වෝද්‍යානයට පහත සඳහන් දේ සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 9 වැනි බ්‍රහස්පතින්දා උදේ 9.30 වන තුරු පහත නම් සඳහන් මා විසින් භාරගනු ලැබේ.

(1) මාළු රාත්තල් 14,000ක් පමණ.

(2) විවිධ ආහාර වගී රාත්තල් 12,000ක් පමණ.

2. (ඒ) දෙහිවල සත්වෝද්‍යානයේ අධ්‍යක්ෂගෙන් ලබාගත් ටැන්ඩර් පෝර්මවල එක් එක් කාර්යය සඳහා පිටපත් දෙක බැගින් වෙන් වෙනම ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් පත්‍ර බහා එවන කවර මුද්‍රා තැබිය යුතුවත් හැර එහි මුදුනේ වම් කෙළවරේ "මාළු සඳහා ටැන්ඩර්" නැතහොත් "විවිධ ආහාර සඳහා ටැන්ඩර්" යනු වෙන් සටහන් කොට "අධ්‍යක්‍ෂ, දෙහිවල සත්වෝද්‍යානය, දෙහිවල" යනුවෙන් ලිපිනය යෙදිය යුතුය. ටැන්ඩර් පත්‍රය කටුගෑවොත් හෝ වෙනස් කළහොත් අත්සන් තබා සහතික කළ යුතුය.

(බී) "ටෙන්ඩර් කොන්දේසි" පිටපත් දෙකක් ටැන්ඩර් පත්‍රය සමඟ නිකුත් කරනු ලැබේ. එයින් එක් පිටපතක් පුරවා ටැන්ඩර්කරු විසින් අත්සන් කර ටැන්ඩර් පත්‍රයට අමුණා එවිය යුතුය.

(සී) ටැන්ඩර් පත්‍ර එක්කෝ දෙහිවල සත්වෝද්‍යාන කාර්යාලයේ ටැන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැත්නම් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. යම් ටැන්ඩර්කරුවෙක් හෝ නියෝජිතයෙක් ටැන්ඩර් පත්‍ර අතින්ම භාර දීමට කැමති නම් ටැන්ඩර් පත්‍ර මුද්‍රා තබා සත්වෝද්‍යානයේ කාර්යාල සහකරුට භාරදී ලද පතක් ලබා ගත යුතුය.

3. ටැන්ඩර් පෝර්ම ලබා ගැනීමට එක් එක් කරුණ සඳහා රුපියල් 50 බැගින් කොළඹ කච්චේරියේ තැන්පත් කොට ලබාගත් රිසිට්පත්‍ර දෙහිවල සත්වෝද්‍යාන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය. ටැන්ඩර් පෝර්ම 1965.9.8 දින සවස 3 දක්වා කාර්යාල වේලාවන් තුළ, දෙහිවල සත්වෝද්‍යාන අධ්‍යක්ෂගෙන් ලබාගත හැකිය.

4. අවශ්‍ය වෙනත් තොරතුරක් වෙතොත් මෙහි පහත නම සඳහන් අයගේ කාර්යාලයෙන් සෙනසුරාදා දිනවල උදේ 9 සිට සවස 1 දක්වාද, ඉරිදා හැර අනෙක් සතියේ දිනවල උදේ 9 සිට සවස 4.30 දක්වාද ලබාගත හැකිය.

ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස්,
අධ්‍යක්ෂ.

1965 අගෝස්තු මස 6 වැනිදා,
දෙහිවල සත්වෝද්‍යානයේ දීය.

8-645—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයට වියළි, අමු සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම

අංක 14,472 හා 65.8.6 දින දරන රජයේ ගැසට් පත්‍රයෙහි සඳහන් ටෙන්ඩර් දැන්වීමෙහි ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය 1965.9.3 දින දක්වා කල් දමන ලදී. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සි 1965 සැප්තැම්බර් මස 2 වෙනි දින දවල් 12ට පෙර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත යුතුය.

ඇස්. ආර්. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස් වෙනුවට.

1965.8.14 දින,
කොළඹ 8
ආයුර්වේද දෙපාර්තමේන්තුවේදීය.

8-602—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට වියළි, අමු සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම

අංක 14,472 සහ 65.8.6 දින දරන රජයේ ගැසට් පත්‍රයෙහි සඳහන් ඉහත සඳහන් ටෙන්ඩර් දැන්වීමෙහි ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1965.9.3 දින දක්වා කල් දමන ලදී. අයදුම්කරුවන් විසින් මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සි 1965 සැප්තැම්බර් මස 2 වැනි දින දවල් 12ට පෙර කොළඹ 8, කෝට්ටේ පාරේ, අංක 325හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත යුතුය.

ඇස්. ආර්. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස් වෙනුවට.

1965.8.14 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

8-603—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### මීගමුවේ පිටිපන ධීවර ආයතන භූමියේ පොල් කඩාගැනීම

1965 සැප්තැම්බර් 3 වැනි කිවි දින පස්වරු 2 දක්වා, කොළඹ 3, ගාළු මුවදොර ධීවර අධ්‍යක්ෂ විසින් මීගමුවේ පිටිපන පිහිටි ධීවර ආයතන භූමියේ පොල් කඩා ගැනීමේ අයිතිය සඳහා ඔහුගෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් බාර ගනු ලැබේ.

ටැන්ඩර් තැන්පත් මුදල රු. 25.

සෑම් එච්. සිල්වා,
ධීවර අධ්‍යක්‍ෂ.

1965 අගෝස්තු මස 13 වැනිදා,
කොළඹ 3,
ධීවර දෙපාර්තමේන්තුවේ දී ය.

8-612—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### සැපයීමේ ස්ථානවල සිට ගාළු දිස්ත්‍රික්කයේ පාසල්වලට ඇදිහැස කිරිපිටි හා බේකරිවලට ඇදිහැස පිටි ගෙන යාම—1965-66

වර්ෂ 1965 ඔක්තෝබර් 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පහත දැක්වෙන සේවයන් සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 17 වැනි දින පෙරවරු 10 දක්වා ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

**සේවයන් :**

(1) බූස්ස, ගාල්ල, ඇල්පිටිය සැපයීමේ ස්ථානවල සිට එම ප්‍රදේශයේ පාසල්වලට බනිස් සපයන බලය ලත් බේකරි කරුවන් වෙත සාමාන්‍ය වශයෙන් පාසල් වාරයකට දෙවරක් බැගින් ඇදිහැස පිටි (රාත්තල් 50 බෑල්) ගෙන යාම හා

(2) බූස්ස සැපයීමේ ස්ථානයේ සිට ගාළු දිස්ත්‍රික්කයේ පාසල් ප්‍රධානීන් වෙත සාමාන්‍ය වශයෙන් පාසල් වාරයකට එක වරක් බැගින් ඇදිහැස කිරිපිටි ගෙන යාම.

ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කිරීමට ප්‍රථම ටෙන්ඩර් භාරදීමට අපේක්ෂා කරන ඉල්ලුම්කරුවන් විසින් ගාල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත ඉල්ලුම්කරුට අයත් නිශ්චල දේපලවල වටිනාකම යටත් පිරිසෙයින් රු. 15,000ක් (පහළොස්දහසක්) වත් වන බව ඒත්තු යන අන්දමට හා ඉල්ලුම්කරුගේ නමින් ලියා පදිංචි කරන ලද, ආදායම් වර්ෂයට බලපත්‍ර ලබාගත් එක් ලොරියක්වත් අයිතිව තිබෙන බවට සතුටුදායක අන්දමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර කම්කරු සමිති මගින් ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමට ප්‍රථම ගාල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත සමුපකාර සංවර්ධන උප කොමසාරිස් (සමුපකාර සමිති වෙනුවෙන්) දිසාපතිතුමාගෙන්ද (ග්‍රාම සංවර්ධන සමිති වෙනුවෙන්) හා සහකාර කම්කරු කොමසාරිස්වරයාගෙන් (සමුපකාර කම්කරු සමිති වෙනුවෙන්) එකී සමිතියට මෙම වැඩය කිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් ලබාගෙන එවිය යුතුය.

ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයෙන් 1965 සැප්තැම්බර් 16 වැනි දින පස්වරු 3 දක්වා ලබාගත හැකි ෆෝර්මවල (පිටපත් 2 කින්) ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා කච්චේරියේ රු. 50 (රුපියල් පණහක්) තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක් ද ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලීමෙන් පසුවය.

අමතර විස්තර ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයෙන් ලබා ගත හැක.

පී. ඊ. ජී. මෙන්ඩිස්,
ගාල්ලේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.

ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලය,
ගාල්ල, 1965.8.13.

8–657—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### නියෝජ්‍ය ආහාර පාලකතුමාගේ සැපයීමේ ස්ථානවල සිට උතුරු මැද ප්‍රදේශයේ පාසල් ප්‍රධානීන් වෙත "ඇදිහැස" කිරි පිටි හා බේකරිවලට "ඇදිහැස" පිටි ගෙනයාම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගැනීම, 1965-66

වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුල පහත සඳහන් සේවයන් සඳහා සීල් තබනලද පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 17 වෙනි සිකුරාදා පෙරවරු 10.30 දක්වා අනුරාධපුර ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

**සේවයන් :—**

1. අනුරාධපුර, පොලොන්නරුව සහ තිඹිරිගොඩ යන සැපයීම් මධ්‍යස්ථානවල සිට අනුපිළිවෙලින් එම පාලන ප්‍රදේශවල පිහිටි පාසැල්වලට "ඇදිහැස" කිරි පිටි ප්‍රවාහනය කිරීම.
2. අනුරාධපුර, පොලොන්නරුව හා තිඹිරිගොඩ යන සැපයීම් මධ්‍යස්ථානවල සිට අනුපිළිවෙලින් ඒ ඒ පාලන ප්‍රදේශවල පාසැල්වලට බනිස් සැපයීමට බලයලත් බේකර්වරුන් වෙත "ඇදිහැස" පිටි ප්‍රවාහනය කිරීම.

එක් එක් සැපයීමේ මධ්‍යස්ථානය සඳහා සහ සේවය සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි. "ඇදිහැස" කිරි පිටි සහ "ඇදිහැස" පිටි සැපයීම යන දෙකම එක් අයෙකුට ඉල්ලුම් කළ හැක. මෙහිදී දුර ප්‍රමාණය නොසැලකියයුතු අතර හොන්ඩරයකට මිල දැක්විය යුතුය.

(2) ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණ ටෙන්ඩරය භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලයේ ප්‍රධාන තැන සතුව ඇත.

(3) 1965 සැප්තැම්බර් මස 16 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 දක්වා නියමිත ටෙන්ඩර් ෆෝර්ම අනුරාධපුර උතුරුමැද ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට පෙර රු. 100 ක තැන්පත් මුදලක් අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයේ ගෙවීම් ශාඛාවේ හෝ කච්චේරියක හෝ තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. අනුමත කරනලද සමිතියක් නම් මෙම මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය.

(4) ටෙන්ඩර් ෆෝර්ම නිකුත්කිරීමට පෙර ටෙන්ඩර් භාරදීම අපේක්ෂාකරන අයවලුන් විසින් අනුරාධපුර උතුරුමැද ප්‍රදේශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලුම්කරුට අයත් රු. 15,000 ක (පහළොස් දාහක්) වටිනා නිශ්චල දේපළ ඇතිබව ඒත්තුයන අන්දමට හා ඉල්ලුම්කරුගේ නමින් ලියාපදිංචි කරන ලද ආදායම් වර්ෂයට බලපත්‍ර ලබාගත් එක් ලොරියක්වත් අයිතිව තිබෙන බවට පිළිගතහැකි අන්දමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. මධ්‍යස්ථාන එකකට වඩා ඉල්ලුකරන අපේක්ෂකයින් ඔවුන්ට අවු ගනනේ ලොරි දෙකක්වත් තිබෙන බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමිති මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට කලින් අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත සමුපකාර සංවර්ධන උප කොමසාරිස් තුමාගෙන් (සමුපකාර සමිතිය වෙනුවෙන්) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තුමාගෙන් (ග්‍රාම සංවර්ධන සමිතිය වෙනුවෙන්) හා සහකාර කම්කරු කොමසාරිස්තුමාගෙන් (කම්කරු සමිතිය වෙනුවෙන්) එකී සමිතියට මෙම සේවය ඉටුකිරීමට හැකියාවක් ඇති බවට සහතිකයක් ලබාගෙන ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලීමෙන් පසු ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරණු ලැබේ.

(5) "ඇදිහැස" කිරි පිටි හෝ "ඇදිහැස" පිටි ප්‍රවාහනය කිරීමත් "ඇදිහැස" සංවිධානයෙන් හෝ අනුරාධපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් නිකුත්කිරීමේ ඇනවුම්පත් ලැබී සුමාන දෙකක් ගත වන්නට ප්‍රථම වේ.

(6) ටෙන්ඩරයක් සහමුලින්ම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි එක් කොටසක් පමනක් භාර ගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා සතු වේ.

(7) ටෙන්ඩර් අපේක්ෂයින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම පිළිබඳ අවසාන තීරනය දීම ටෙන්ඩර් පත්‍ර භර ගැනීමේ අවසාන දින සිට සුමාන හයක් ඇතුලත බලාපොරොත්තු විය යුතුය.

(8) අමතර විස්තර අනුරාධපුර අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැක.

ඉව්ලින් ප්‍රනාන්දු,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ.
උ. මැ. දි.

අධ්‍යාපන කාර්යාලය,
අනුරාධපුර, 1965.8.13.

8–698—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### යාපනේ හෙදි විදුහලට පිසූ ආහාර සැපයීමට ටෙන්ඩර් කැඳවන ලද දැන්වීම අවලංගු කිරීම

1965 අගෝස්තු මස 6 වෙනි දින ප්‍රසිද්ධ කරන ලද අංක 14,472 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ, 1027 පිටුවේ සිංහලෙන් හා 996 වැනි පිටුවේ ඉංග්‍රීසියෙන් පළකරන ලද, යාපනේ හෙදි විදුහලට කිරි රහිත පිසූ ආහාර සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද දැන්වීම මෙයින් අවලංගු කරනු ලැබේ.

එස්. රාසරත්නම්,
යාපනේ සෞඛ්‍ය සේවා අධිකාරී.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
යාපනය, 1965.8.12.

8–659—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මානසික රෝහල අංගොඩ—පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සන් සහ සේවාව.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වන දින සිට 1966 සැප්තැම්බර් මස 30 වන දින දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය මුල්ලේරියාව තුළ හෙදි ඇබෑසි විද්‍යාලට පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරි කාර්යාලයේදී වෛද්‍ය අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—ටෙන්ඩරය සඳහා තැන්පත් මුදලක් වශයෙන් රු. 25/-කට මුදල් ඇනවුම් පතක් ටෙන්ඩර් පත්‍ර සමඟ අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරි තුමා නමට එවිය යුතුයි.

අනුමත කරණ ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සංගම්වලටද තැන්පත් මුදලක් නොමැතිව ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, ඉහත සඳහන් සේවයට ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කල යුතුයි.

(ii) **ටෙන්ඩර් ආකෘති පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වනතුරු අංගොඩ මානසික රෝහලේ වෛද්‍ය අධිකාරි කාර්යාලයෙන් ඉල්ලුම් ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර තැපැල් මගින් ඉල්ලීමේදී ටෙන්ඩර් පත් භාර ගැනීමේ අවසාන දිනට පෙර ඉදිරිපත් කිරීමට හැකිවන සේ, කල්වේලා ඇතිව ඉල්විය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන්, ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමට පෙර සහ ටෙන්ඩරය අවසන් දිනට සැලකියයුතු කාලයකට පෙර තම තමන්ගේ වත්කම් ගැන මා වෙත දන්විය යුතුයි. මීට නියුතු ආකෘති පත්‍ර මගේ කාර්යාලයෙන් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට හෝ මූල් පිළිබඳ තත්වය ඔප්පු කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩරය සඳහා තැන්පත් මුදල අහිමිවීමට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් මේ සමග ඇති උප ලේඛනයේ 5 වන තීරයේ දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා '' වෛද්‍ය අධිකාරි මානසික රෝහල අංගොඩ '' කියා එවිය යුතුයි. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙලවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කල යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙලවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කල යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාල යෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කල තැපෑලෙන් ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ රෝහල් ලේකම් තැනට භාර දෙන්නේ නම්, එම පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත සඳහන් උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දින පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පැවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව ඒවායේ අනු පිටපත් පරීක්ෂා කළ හැක.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයේ '' බී '' උප ලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කල යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිල ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතිනම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයන්හි සඳහන් මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡෙදයෙහි සඳහන් කාල සීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද ගිවිසුම් පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැත්නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පෙනෙන උප ලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු ගිවිසුමට අත්සන් කල යුතුය.

11. **බඩු ගබඩා කිරීමට ඉඩකඩ.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩාකර තැබීම සඳහා ආයතනයෙහි හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සලසා දෙනු ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලීමට බලාපොරොත්තු වන අය එම කොන්දේසි කියවා මනාසේ වටහා ගෙන ඊට අනුකූලව ක්‍රියාකල යුතුයි. එමෙන්ම ටෙන්ඩර් පත්‍රයේ අඩංගු ගිවිසුමේ කොන්දේසි ද වටහා ගත යුතුයි.

ජේ. ඇස්. පී. අබේවර්ධන,
වැඩබලන වෛද්‍ය අධිකාරි.

වෛද්‍ය අධිකාරි කාර්යාලය,
මානසික රෝහල—අංගොඩ,
1965 අගෝස්තු මස 14 වන දින.

### අදාල උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් තැන්පත් රු. | ශ. | (3) ඇප තැන්පත් රු. | (4) ටෙන්ඩර් අවසාන දිනය හා වේලාව | (5) ඉතා කිට්ටු ආහාර ගණන: අළුත් මාළු | මස් | කරවල | බිත්තර | එලවළු |
|---|---|---|---|---|---|---|---|---|---|
| මුල්ලේරියාව හෙදි ඇබෑසි විද්‍යාල | 25 | 0 | 800 | 65.9.9 පෙ.ව. 10.00 ට | 8,500 | 12,000 | 5,700 | 6,500 | 11,500 |

8—666—65.8.20 දින අංක 14,486 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ඇෆ්. ඊ. ඊ. 57/65

## සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### පිනෝබාබිටෝන් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්

1. මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි සඳහන් පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනට කැපසිස් ආදිය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 නොවැම්බර් 16 වෙනි අඟහරුවාදා උදේ 10 දක්වා බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර කොළඹ ඩීන්ස් පාරේ අංක 355 දරණ ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශයෙන්) ලබාගත හැක. මෙම දැන්වීමේ 5 වැනි හා 6 වැනි ඡෙදයන්හි සඳහන් කරුණු අනුව 1965 නොවැම්බර් මස 15 වෙනි සඳුද උදේ 10 දක්වා ඉල්ලුම්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

3. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් සීල් තබන ලද කවරයක බහා, සභාපති තැන, ටෙන්ඩර් මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, තැ. පෙ. 500, පළමුවෙනි මහල, මහා ලේකම් ගොඩනැගිල්ල, ගාලු මුවදොර, කොළඹ යන ලිපිනයට එවිය යුතු වේ. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහාලන කවරයේ වම් කෙළවරේ උඩ, " පිනෝබාබිටෝන් ආදිය සැපයීම සඳහා ටෙන්ඩර්, 1965 නොවැම්බර් 16 දින උදේ 10 ට " යනුවෙන් සඳහන් කළ යුතු වේ.

4. ටෙන්ඩර් පත් ගාලු මුවදොර මහා ලේකම් ගොඩනැගිල්ලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ, කාමර අංක 155හේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ එවීම කළ හැක. එහෙත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් තමන්ට අවශ්‍ය යයි හැඟේ නම් සීල් තබන ලද ටෙන්ඩර් පත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උප ලේකම් තැන වෙත පුද්ගලිකව ගෙනැවිත් බාරදීමද කළ හැක. එසේ බාරදෙන සීල් තබන ලද කවරයේ එය කිනම් සැපයීමක් සඳහාද යන වග හා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතු වේ. එම ටෙන්ඩර් පත් බාරගැනීම සඳහා ඉහතකී නිලධාරි තැනට බලය ඇත. සීල් තබන ලද ටෙන්ඩර් පත් බාරගත් බවට කුවිතාන්සියක් එවිට ටෙන්ඩර්කරු වෙත ඔහු විසින් නිකුත් කරනු ලැබේ.

5. සුප්‍රසිද්ධ නිෂ්පාදන සමාගමක ඒජන්තවරයෙකුට හෝ වෙළඳ නියෝජිතයෙකුට වුවද ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. එහෙත් අයදුම්කරු නම් කරන ලද නිෂ්පාදන සමාගමේ නියෝජිත ඒජන්තවරයෙකු බව සහතික කළ යුතු වේ. (මේ සඳහා නියෝජිතත්වය ඔප්පු කිරීමක් ඉදිරිපත් කළ යුතු වේ.) කච්චේරියක දී (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ දී මුදල් රු. 100 ක් තැන්පත් කළ බවට ලදුවක් ඉදිරිපත් කළ විට කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන මෙරට ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. කොළඹ, ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත යුතුයි.

6. ලාංකික සම්බන්ධතා ඇති රටවල්වූ ඇල්බේනියාව, ඔස්ට්‍රියාව, බල්ගේරියාව, චීන මහජන සමූහ ආණ්ඩුව, චෙකොස්ලොවේකියාව, ටායිවාන්, ජර්මන් ෆෙඩරල් සමූහ ආණ්ඩුව, ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, හන්ගේරියාව, ජපානය, කොරියාව, පෝලන්තය, රුමේනියා මහජන සමූහ ආණ්ඩුව, ස්පාඤ්ඤය, සෝවියට් රුසියාව, යුගොස්ලේවියාව, වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී සමූහ ආණ්ඩුව, ආදී රටවල්වලින් මෙම සැපයීම ආනයනය කර සැපයීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් වෙතොත්, ඔවුන් ලියාපදිංචි කරන ලද වෙළෙන්දන් විය යුතු අතර ආනයන පාලක තැන විසින් නිකුත් කරන ලද සාමාන්‍ය බඩු ගෙන්වීමේ වලංගු බලපත්‍රයක් ලත් ඇත්තෝ විය යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමේ දී ඉහත සඳහන් බලපත්‍රයක් හිමි බව ඔප්පු කළ යුතු වේ.

7. ටෙන්ඩර් කොන්දේසි සහ අනිකුත් විස්තර මෙම දැන්වීමේ 2 වැනි ඡේදයේ සඳහන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක තැනගේ කාර්යාලයෙන් (කොන්ත්‍රාත් සහ සැපයීම් අංශය) ලබාගත හැක. මෙම කාර්යාලයෙන් ලබාගත් ආකෘති පත්‍ර, කොන්දේසි පත්‍ර ආදිය භාවිත කළ හැක්කේ ස්වදේශීය ටෙන්ඩර්කරුවන්ට පමණි.

8. මෙහි පළමුවෙනි ඡේදයෙහි සඳහන් පරිදි ටෙන්ඩර්කරු විසින් ස්වකීය ගණන් යෝජනාව ටෙන්ඩර් බාරගැනීමේ අවසාන දින සිට යටත් පිරිසෙයින් මාස 2 ක් වත් විවෘතව තැබිය යුතුයි.

9. කෙලින්ම ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය නිෂ්පාදක මූලිකවරුන් වෙත ඔවුන්ගේ ලංකා නියෝජිතයින් සහ ඒජන්තවරුන් විසින් ටෙන්ඩර් කොන්දේසි, උපලේඛන හා මෙම ටෙන්ඩරය පිළිබඳ සියලුම විස්තර පහත සඳහන් රටවල සිටින ලංකා ආණ්ඩුවේ නියෝජිතයින්ගෙන් ලබාගත හැකි බව දැන්විය යුතු වේ. මහා බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉතාලිය, පකිස්ථානය, ජපානය, ප්‍රංශය, බටහිර ජර්මනිය, චීන මහජන සමූහ ආණ්ඩුව, සෝවියට් රුසියාව, කැනඩාව, නෙදර්ලන්තය, බෙල්ජියම, හංගේරියාව, බල්ගේරියාව, නැගෙනහිර ජර්මනිය, එක්සත් අරාබි සමූහ ආණ්ඩුව, බුරුමය, අයර්ලන්තය, අයිරානය, ඉරාකය, මාල දිවයින, උතුරු කොරියාව, ස්පාඤ්ඤය සහ ඉන්දියාව, බොම්බායේ සහ ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි සිටින ලංකා වෙළඳ කොමසාරිස් සහ ලංකාවේ සිටින විදේශීය ආණ්ඩුවල නියෝජිතවරු සහ ඉන්දියාවේ දිල්ලියේ සිටින ලංකාවේ විදේශීය නියෝජිතයන්ගෙන්.

**10.** ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත් කරන ටෙන්ඩර් කොන්දේසිවල 11 වැනි ඡේදය කෙරෙහි ටෙන්ඩර්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ. කොළඹ රජයේ බෙහෙත් ගබඩා අධිකාරින්ට යැවිය යුතු මෙම බඩුවල ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) සම්බන්ධව විස්තර එම ඡේදයෙහි සඳහන් කර ඇත. ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුත්තේ ටෙන්ඩර් පත් පමණි. ආදර්ශ භාණ්ඩ (සැම්පල්ස්) එහි තැන්පත් නොකළ යුතුයි. ටෙන්ඩර් පත් සමාප්ත කරන දිනයේ නියම වේලාවට ප්‍රමාදව ලැබුණු සැම්පල්ස් සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

11. මෙහි 1 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ සෑම ටෙන්ඩර්කරුවෙකුටම එම ස්ථානයේ සිටීමට අවසර තිබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් එහි පැමිණ සිටි ටෙන්ඩර්කරුවන්ට කියවනු ලැබේ. ලැබී තිබුන ටෙන්ඩරයක් පරීක්ෂාකර බැලීමට යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට අවශ්‍ය නම්, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සමග කටයුතු පිළියෙළ කර ගැනීමෙන් පසු එසේ පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු ලැබේ.

ඇස්. බාලක්‍රිෂ්නන්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක වෙනුවට.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලය (සැපයීම්),
අංක 355, ඩීන්ස් පාර, කොළඹ 10,
1965 අගෝස්තු මස 12 වෙනි දින.

## උපලේඛනය

| විෂය අංකය | විස්තරය | අවශ්‍ය ප්‍රමාණය | අවශ්‍ය ඇසිරීම |
|---|---|---|---|
| 1. | පිනෝබාබිටෝන් බී.පී. ග්‍රෑ. 1 (මිලිග්‍රෑම් 60) | පෙති 60,00,000 | 1,000 පෙති අඩංගු බෝතල් |
| 2. | එසටාසොලමයිඩ් බී.පී. මිලිග්‍රෑම් 250 | පෙති 5,00,000 | එම |
| 3. | බෙන්සිහෙක්සෝල් හයිඩ්‍රොක්ලෝරයිඩ් බී.පී.මී.ග්‍රෑ. 2 | පෙති 18,00,000 | පෙති 100 බෝතල් |
| 4. | එමටීන් හා බිස්මත් අයඩයිඩ් බී.පී.ග්‍රෑ. 1 | පෙති 4,00,000 | එම |
| 5. | ෆ්ෙරස් ග්ලූකෝනේට් බී.පී. ග්‍රේන් 5 | පෙති 1,00,00,000 | පෙති 1,000 බෝතල තුළ |
| 6. | ගුණනඩීන් බී.පී. මිලි ග්‍රෑම් 10 | පෙති 6,00,000 | පෙති 500 බෝතල් තුළ |
| 7. | ප්‍රෝමෙතසින් හයිඩ්‍රොක්ලෝරයිඩ් බී.පී.මී.ග්‍රෑ. 25 | පෙති 20,00,000 | එම |
| 8. | ඉස්ටැන්ත්ඩයිස්ට් සෙන්නා | පෙති 15,00,000 | පෙති 1,000 ටින් |
| 9. | ඉස්පයිරෝනොලැක්ටොන් | පෙති 80,000 | පෙති 100 බෝතල් තුළ |

බාරදීමේ ක්‍රමය.—

මෙහි අංක 1—9 දක්වා ඇති විෂයන්ගේ සම්පූර්ණ තොගය සමාන තොග 2 කින් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවට ගෙනැවිත් බාරදිය යුතු වේ. පළමුවෙනි තොගය ඇනයුම් කළ දින සිට මාස 3 ක් ඇතුලත දී ද, ඉතිරි තොග1 ඉන් පසු මාස 3 ක් ඇතුලත සැපයිය යුතුය.

ටෙන්ඩර්කරු ණයවර ලිපියක් විවෘත කරන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ නම්, සඳහන් කළ මිළ ගණන, මිළ සහ කොළඹට ශෙනර්මේ ගාස්තු හා ඇහිරීම් හා අනිකුත් සියලුම ගාස්තු ඇතුලුව මිළ ඖෂධ නිෂ්පාදන රටේ මුදලින් හා ලංකා මුදලින් ද සඳහන් කළ යුතු වේ.

ටෙන්ඩර්කරුවන් විසින් රුපියලක වටිනාකම හා විදේශ විනිමය වටිනාකම වෙන වෙනම ඔවුන්ගේ මිල ඉදිරිපත් කිරීම්වල සෑම විෂය අංකයක් වෙනුවෙන් සඳහන් කළ යුතු වන්නේ ය.

මෙම සැපයීමේ සෑම විෂයයක්ම හා ඒවා බහා එවන සෑම භාජනයකම " ඔටුන්න ලකුණ " හා " සී/සී.ඇම්.ඇස්. 2630/64/65 " යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

8–709—65.8.20 දින අංකදරන 14,486 ගැසට් පත්‍රය.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කිළිටි රෙදි සේදීම

1. **සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1965 ඔක්තෝබර් 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකත් ඇතුලුව) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී විසින් බාර ගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර බාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලවලින් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් බාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ජෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකටසේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමග ඇති උපලේඛනයේ 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

